**ලංකා බැංකුව හා එහි පරිපාලිත සමාගම් - 2022**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත ලංකා බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 5(1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමූහය විසින් පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමූහය කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව සමූහය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූලික බැංකු පද්ධතිවලින් ලබාගත් මූල්‍ය තොරතුරු පදනම් කරගෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. පසුව අයිඑෆ්ආර්එස් ගැලපුම්වලට අදාල සටහන් යොදන අතර එම තොරතරු පැතුරුම්පත්වල පවත්වාගෙන යනු ලැබේ. මෙය දත්ත නැතිවීමට හෝ වැරදි හැසිරවීමට හේතු විය හැකිය. එබැවින්, දත්තවල නිරවද්‍යතාවය සහතික කිරීම පිණිස සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළියෙල කිරීම සඳහා සම්පූර්ණ ස්වයක්‍රීය පද්ධති විසඳුමක අවශ්‍යතාවය බැංකුව ඇගයීමට ලක් කිරීම අවශ්‍ය වේ. | මූල්‍ය වාර්තාකරණය ස්වයංක්‍රීය කිරීම දැනට කරගෙන යන අතර දැනටමත් අදියර 3 න් දෙකක් අත්සන් (signed off) කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමට නිර්දේශ කරනු ලැබේ. |
| (ii) | හානිකරණය ගණනය කිරීමේදී, හානිකරණ ප්‍රධාන සාරාංශය සහ අපේක්ෂිත ණය පාඩු (Expected Credit Loss- ECL) සාරාංශය අතර කළඹ ශේෂ කිරීමේ ක්‍රියාවලිය නිසි යාන්ත්‍රණයක් සහිතව කළ යුතුය. තවද, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළඹ ශේෂ කිරීමේ ක්‍රියාවලියේදී විධිමත් සමාලෝචන යාන්ත්‍රණයක් නොමැත. | ණය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන විට ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරිපත් කරනු ලැබේ. (ප්‍රාග්ධනය + හිඟ හා ලැබිය යුතු පොලිය) අයිසීබීඑස් ණය ශේෂ සත්‍යාපනය කිරීම ලෙජර් ශේෂ කරණ ඒකකය විසින් දෛනික පදනමින් කරනු ලැබේ. වාර්තා කරන ලද වෙනස්කම් සැසඳීමට පියවර ගෙන ඇති අතර, ඒ සම්බන්ධව තව දුරටත් වැඩිදියුණු කිරීම් කරනු ලැබේ. | කළඹ ශේෂකරණය පිළිබඳ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |
| (iii) | සාමූහික හානිකරණය ගණනය කිරීම සඳහා බැංකුව මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණද, පැහැර හැරීමකදී නිරාවරණය වීම (Eeposure At Default - EAD) සහ අපේක්ෂිත ණය පාඩු ගැලපීම (ECL) තවමත් අතින් කරන ක්‍රියාවලියක් ලෙස සිදු කරයි. | ශාඛා මට්ටමින් ප්‍රතිපාදනය ගණනය කිරීම, පද්ධතියේ පළමු අදියර (හානිකරණය ගණනය කිරීම) අත්සන් කිරීමෙන් පසු ප්‍රධාන වශයෙන් ආරම්භ කරන ලදි. ශාඛා මට්ටමින් EAD සහ ECL පද්ධතිය හරහා ලබා ගැනීමට පද්ධතියට අවශ්‍ය වෙනස්කිරීම් සංවර්ධනය කරමින් පවතී . | අතින් කරන මැදිහත්වීමකින් තොරව, පද්ධතිය හරහා ECL ගණනය කිරීම සිදු කිරීමට නිර්දේශ කරනු ලැබේ. |
| (iv) | බැංකුව, අනාගත මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම සම්බන්ධ ස්වාධීන සමාලෝචනය ශක්තිමත් කිරීම සිදු කළ යුතු බව, පසු පරික්ෂා කිරීමේ ක්‍රියා පටිපාටි ප්‍රතිඵල (Results of back testing procedures) මඟින් අවධාරණය කර තිබුණි. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි. | අනාගත මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම සම්බන්ධ ස්වාධීන සමාලෝචනය ශක්තිමත් කිරීම පසු පරික්ෂා කිරීමේ ක්‍රියා පටිපාටි භාවිතා කිරීමට නිර්දේශ කෙරේ. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

**විගණන නිරීක්ෂණය**

2022 දෙසැම්බර් 31 දිනට, නිරවුල් නොකරන ලද පහත දැක්වෙන දිගුකාලීන හිඟ පොලී සහන හිමිකම් ගිණුම් නිරීක්ෂණය විය.

| පොදු ලෙජර් ගිණුමේ විස්තරය | පොදු ලෙජර් කේතය | 2022.12.31 දිනය හිඟ පොලිය (රු.මිලියන) | ලැබිය යුතු පොලියේ වයස් විශ්ලේෂණය (රු.මිලියන) | | | |
|---|---|---|---|---|---|---|
| | | | මාස 3 ට අඩු | මාස 3-6 අතර | මාස 6-12 | වසර 1 ට වැඩි |
| **තැන්පතු සඳහා** | | | | | | |
| විශේෂ තැන්පතු ගිණුම් වෙනුවෙන් ලැබිය යුතු පොලී සහනය | 11310600 | 172.34 | 65.91 | 86.57 | 19.86 | |
| ජ්‍යෙෂ්ඨ පුරවැසි ලැබිය යුතු සහන ප්‍රතිපූර්ණ | 11310566 | 23,108.98 | 2,642.57 | 4,011.27 | 8,395.13 | 8,060.01 |
| **ණය සඳහා** | | | | | | |
| එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා | 51501021 | 502.63 | 161.52 | 90.24 | 133.50 | 117.37 |
| දියවර දිරිය | 51501018 | 7.24 | 4.22 | 3.01 | - | - |
| මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය | 51501018 | 20.54 | 1.53 | 1.67 | 4.31 | 13.02 |
| පොලී රහිත අධ්‍යාපන ණය | 51501018 | 427.59 | 193.64 | 178.78 | 55.17 | - |
| STaRR | 51501018 | 1.44 | 0.51 | 0.44 | 0.49 | - |
| සෞභාග්‍යා | 51501018 | 66.09 | 66.09 | - | -- | - |

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොලි ප්‍රතිපූර්ණ මුදලට අදාල හිමිකම් ඉල්ලීම් නියමිත දිනවලදී ඉල්ලා ඇති අතර, ලැබිය යුතු ප්‍රතිපූර්ණය වෙනුවෙන් සිහිකැඳවීමක් ද 2023 සැප්තැම්බර් මාසයේදී ලිපියක් මාර්ගයෙන් අමාත්‍යාංශයට කර ඇත.

පොලී සහන හිමිකම් ඉල්ලීම් අදාල බලධාරීන්ට දැනටමත් ඉදිරිපත් කර ඇත. සෑම වර්ෂයකම දෙසැම්බර් මාසයේදී ගෙවීම් කරනු ලැබේ.

**නිර්දේශය**

දිගුකාලීන හිඟ පොලී සහන හිමිකම් ගිණුම් පියවීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාරක ප්‍රාග්ධන අදියර III NCRCS | 51501006 | 95.98 | 16.85 | 17.92 | 11.60 | 49.62 |

## 1.6.2. ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනිකුත් වගකීම් යටතේ වර්ගීකරණය කර ඇති, පහත දැක්වෙන ගිණුම්වල, සැලකිය යුතු කාලයක් සිට දිගුකාලීන හිඟ ශේෂ නිරවුල් කිරීමට සතුටුදායක ක්‍රියාමාර්ග නොගෙන හිඟව පැවතුණි. එවැනි ශේෂ වල විස්තර පහත දැක්වේ. | **එකතු කිරීම මත යැවූ ලද අයකිරීම් වවුචර් මුදල්**<br>වර්ෂ 5 ට වඩා වැඩි ඒවා තුළ පහත දෑ ඇතුළත් වේ.<br>• වංචා සහගත ගණුදෙනු මත රඳවාගත් අරමුදල්.<br>• නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින.<br>• IPG - රු.මිලියන 63.83 කි.<br>බීඕසී මේල් (BOC Male)- රු.මිලියන 28.58 කි.<br>බැංකු මර්චන්ට් අලෙවිසැල් වල සිදු වූ සැකසහිත කාඩ් පත් ගෙවීම් රු.මිලියන 3.95 කි.<br>සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට වසර 6 ක කාලපරිච්ජේදයක් බලා සිටීම.<br><br>**වර්ෂ 2-5 සහ 1-2 අතරට පහත දෑ අයත් වේ.**<br>බැංකු මර්චන්ට් අලෙවිසැල් වල සිදු වූ සැකසහිත කාඩ් පත් ගෙවීම්<br>සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට වසර 6 ක කාලපරිච්ජේදයක් බලා සිටීම. | වෙනත් වගකීම් ගිණුම් වල දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ |

| පොදු ලෙජර් ගිණුමේ විස්තරය | පොදු ලෙජර් කේතය | වටිනාකම (රු. මිලියන) | වයස් විශ්ලේෂණය (රු.මිලියන) | | | |
|---|---|---|---|---|---|---|
| | | | **වසර 1ට අඩු** | **වසර 1-2** | **වසර 2-5** | **වසර 5ට වැඩි** |
| එකතු කිරීම මත යැවූ අයකිරීම් වවුචර් මුදල් | 22310082 | 193.88 | 92.84 | 0.60 | 4.08 | 96.36 |
| ව්‍යාජ චෙක්පත් හා වංචා මත සංචිතය | 22310122 | 2,266.07 | 78.50 | 416.10 | 1,258.52 | 512.06 |
| **එකතුව** | **2,459.95** | | | | | |

| | | | |
|---|---|---|---|
| | | **වර්ෂ 01 ට අඩු කාලයකට පහත දැ අයත් වේ.**<br>අඩුවෙන් අය කිරීම, ප්‍රමාද පියවීම, IPG වෙළඳ පරීක්ෂණ ගනුදෙනු වැනි අවදානම් කරුණු හේතුවෙන් දින 120 ක තිස්සේ රඳවා තබා ඇති අරමුදල්.<br>කාඩ්පත් හිමියන් විසින් ගැටළු ඇති නොකරන්නේ නම් දින 120 ට පසු අරමුදල් නිදහස් කරනු ලැබේ.<br>2023 ඔක්තෝබර් 31 දිනට හිඟ ශේෂය (වසර 1 ට වඩා අඩු ) රු.මිලියන 48.33 කි.<br><br>**ව්‍යාජ චෙක්පත් හා වංචා මත සංචිතය**<br>ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ශාඛා සහ ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තු සමඟ පැවති රැස්වීම් කිහිපයක් පැවැත්වීම හේතුවෙන් 2022 වර්ෂය තුළ රු .මිලියන 95.16 ක ප්‍රතිපාදන වෙන්කිරීම් ආපසු හරවා ඇත.<br>අපි ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර 2023.11.10 වන විට රු.මිලියන 678.44 ක් නිරවුල් කර ඇත. | |

### 1.6.3. අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකා රජයට සහ රජය සතු ව්‍යවසායන්වලට (SOEs) අයිති ණය හා අත්තිකාරම්වල මුළු හිඟ ශේෂය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. මුළු ණය හා අත්තිකාරම්වලින් රජය සතු ව්‍යවසායන්වල හිඟ ශේෂය වැඩි වීමේ ප්‍රවණතාවය 2019 සිට | රජය සතු ව්‍යවසායන්වලට ලබා දී ඇති ණය වල ව්‍යුහාත්මක වෙනස්කම් වල මෑතකාලීන සංවර්ධනය සමඟ 2023.09 30 දින වන | ශ්‍රී ලංකා රජය සහ රජය සතු ව්‍යවසායන් (SOEs) යන දෙකම “රජය” |

| | | |
|---|---|---|
| 2022 කාලය තුළ සියයට 36.53 සිට සියයට 45.67 දක්වා පැවතුණි.<br><br>රජය සතු ව්‍යවසායන්වලට අයත් ශේෂ පත්‍රයෙන් පිටත වටිනාකම් (ණයවර ලිපි, ප්‍රතිග්‍රහණයන් සහ බැංකු ඇපවීම්) 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 197,087 ක් වූ අතර, එම ශේෂයද ඇතුළත්ව රජය සතු ව්‍යවසායන් සඳහා මුළු වටිනාකම (Exposure) රු.මිලියන 2,385,602 ක් ලෙස වාර්තා විය. එය බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 62.72 ක් නියෝජනය කරයි. | විට, බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් වලින් සහ මුළු වත්කම් වලින්, රජය සතු ව්‍යවසායන්වලට ලබා දී ඇති ණයවල හිඟ ශේෂය සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. 2023.09.30 දිනට එය පිළිවෙළින් සියයට 14 ක් (දළ වශයෙන්) හා සියයට 7 ක් (දළ වශයෙන්) වශයෙන් පැවතුණි.<br><br>2023.09.30 දින වන විට රජය සතු ව්‍යවසායන්වලට අයත් ශේෂ පත්‍රයෙන් පිටත වටිනාකම (ණයවර ලිපි, ප්‍රතිග්‍රහණය හා බැංකු ඇපවීම්) රු.මිලියන 107, 367.17 ක මුදලක් වූ අතර එම ශේෂ පත්‍රයට පිටත වටිනාකමද ඇතුළත්ව රජය සතු ව්‍යවසායන්වලට ලබා දී ණයවල මුළු වටිනාකම රු. මිලියන 425,121.79 ක් ලෙස වාර්තා විය. එය බැංකුවේ මුළු වත්කම් වලින් සියයට 10 ක් නියෝජනය කරයි.<br>බැංකුව සමඟ සමහර රජය සතු ව්‍යවසායන්වල නිරාවරණය වැඩිවීමට මහජන බැංකුව විසින් පහසුකම් මූල්‍යනය ( ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ගල් අඟුරු, ඖෂධ) නොකිරීම ද හේතු විය.<br>ඒ සඳහා, 2021 හා 2022 වර්ෂ තුළ ඔවුන් මුහුණ දුන් විවිධ සාධක (විදේශ විනිමය හා රුපියලේ ද්‍රවශීලතාවය, ඉන්ධන ප්‍රසම්පාදනය සඳහා බැංකුවට මහ බැංකුවෙන් නිකුත් කළ සහතික කළ විදේශ විනිමය එකඟ වීම් ආදිය) හේතු විය.<br><br>තවද, එම කාල පරිච්ඡේදය තුළදී, අනුමත කළ පහසුකම් පැවතියද, අනිකුත් රජය සතු | ලෙස එකම අවදානම් වර්ගීකරණයේ ඇති බැවින් ඒවායේ අයවීම් සමීපව නිරීක්ෂණය කිරීමට නිර්දේශ කෙරේ. |

ව්‍යවසායන්වල (මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය) ණය වටිනාකම් වර්ධනය/ වැඩි නොවීය. කෙසේ වෙතත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලි බල මණ්ඩලය, ලංකා ගල් අඟුරු වැනි රජය සතු ව්‍යවසායන්වලට ඔවුන්ගේ මුදල් ප්‍රවාහ මත පදනම්ව මූල්‍යකරණය කරන අතර, ඔවුන්ගේ සත්‍ය පිරිවැයට අනුකූලව මිල ගැලපීම් කිරීමෙන් පසු වැඩිවුණු මුදල් ප්‍රවාහ මත බැංකුව සමඟ මෙම ආයතන වර්තමානයේ ගණුදෙනු කරයි.

ii 2022 දෙසැම්බර් 31 දිනට රජය සතු ව්‍යවසායන් තුළ (ශ්‍රී ලංකා රජය ඇතුළුව) ඉහළ හිඟ ශේෂ 10 හි සමස්ත එකතුව රු. මිලියන 1, 026, 996 ක් ලෙස වාර්තා වූ අතර, ඒ තුළ හිඟ ප්‍රාග්ධන ශේෂය රු, මිලියන 1,003,725 ක් සහ හිඟ පොලිය රු, මිලියන 23,271, ක් ඇතුළත් වේ. මෙය රජය සතු ව්‍යවසායන් වලට අයත් (ශ්‍රී ලංකා රජය ඇතුළත්ව) මුළු හිඟ ණය හා අත්තිකාරම් ශේෂයෙන් සියයට 96.31 ක් නියෝජනය කරයි. එබැවින්, ඉහළම ගණුදෙනුකරුවන් 10 හි ප්‍රධාන රඳාපැවතීම පහත පරිදි නිරීක්ෂණය විය.

| ආයතනය | **2022.12.31 දිනට හිඟ ශේෂය (රු.මිලියන)** | ඇපකරය | ඇපකරයේ වටිනාකම |
|---|---|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 575,958 | විදේශ ව්‍යවහාර ගිණුමේ ඩොලර් ශේෂය මත සියයට 100 ක ආන්තිකයක් | එ.ජ.ඩො. මිලියන 700. එ.ජ.ඩො. මිලියන 200. එ.ජ.ඩො. මිලියන 750. |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 143,350 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 149,164 |
| ශ්‍රී ලංකා රජය | 115,502 | ණය ගිවිසුම | - |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් | 71,473 | සහන ලිපිය | රු. මිලියන 49,190 |
| | | ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ් හි කොටස් උකසට තැබීම | රු.මිලියන 67,499 |

2023.09.30 දිනට රජය සතු ව්‍යවසායන්වල ඉහළ හිඟහිටි ශේෂ 10 හි මුළු වටිනාකම රු. මිලියන 325,291 ක් ලෙස වාර්තා වන අතර ඒ තුළ, ප්‍රාග්ධන ශේෂය රු. මිලියන 307,105 ක් සහ හිඟ පොලිය රු. මිලියන 18,186 ක් ඇතුළත් වේ. මෙය රජය සතු ව්‍යවසායන්වලට අයත් ණය හා අත්තිකාරම් මුළු ශේෂයෙන් සියයට 97 ක් නියෝජනය විය.
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා කෝල් වැනි රජය සතු ව්‍යවසායන්වලට ඒවායේ මුදල් ප්‍රවාහ මත පදනම්ව මූල්‍යකරණය කරනු ලැබේ.
කෙසේ වෙතත්, ප්‍රමුඛ ව්‍යාපෘති හරහා රටෙහි අපේක්ෂිත ආර්ථික සංවර්ධනය ලඟා කර ගැනීමේ අදහසින් රජය සතු ව්‍යවසායන්වලට මූල්‍යකරණය කරන ලදි. කෙසේ වෙතත්, 2021 - 2022 කාලය තුළදී අනුමත

ණය අවදානම අඩු කිරීම සඳහා අයවීම් පසු විපරම් කිරීමටත්, සුදුසු සීමාවන් පවත්වා ගැනීමටත් නිර්දේශ කෙරේ.

| | | | | |
|---|---|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 51,363 | ඉතිරි කිරීමේ ගිණුම හා ස්ථාවර තැන්පතු | රු.මිලියන 166,822 | පහසුකම් පැවතියද, මාර්ග සංවර්ධන අධිකාරිය/ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ණය වටිනාකම වර්ධනය/ වැඩි නොවීය.<br>වී අලෙවි මණ්ඩලයට අනුමත කරන ලද පහසුකම්, හිඟයකින් තොරව සේවාකරණය කරමින් සිටියි. |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 18,297 | සහන ලිපිය | රු.මිලියන 24,000 | |
| ලංකා විදුලිබල මණ්ඩලය | 17,241 | භාණ්ඩාගාර ඇපකරය<br>කල්බදු වාහන පැවරීම | රු.මිලියන 5,000 | |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 12,284 | අයවැය ප්‍රතිපාදන මත මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කළ, සහන ලිපි<br>ශුද්ධ සහ බීඕර්/ නැව්ගත කිරීමේ ලේඛන | රු.මිලියන 5,876 | |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 11,651 | | | |
| වී අලෙවි මණ්ඩලය | 9,246 | භාණ්ඩාගාර වගකීම<br>භාණ්ඩාගාර ඇපකරය | රු.මිලියන 500,000 | |
| **එකතුව** | **1,026,996** | | | |

| | | | |
|---|---|---|---|
| iii | 2022 දෙසැම්බර් 31 දිනට, ඉහළම අක්‍රීය ණය 10 හි සමස්ත හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.මිලියන 27,781.85 ක් සහ පොලිය රු. මිලියන 6,001.7 ක් ඇතුළත්ව රු. මිලියන 33,783.63 ක් විය. එය 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු අක්‍රීය ණය හා අත්තිකාරම් වලින් සියයට 28.50 ක් නියෝජනය කරන අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 57.5 ක වැඩි වීමක් නිරූපනය කරයි. කේ.ඩී.ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් , අනුදාන් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, රුහුණු ඩිවොලොප්මන්ට් කන්ට්‍රක්ටර්ස් ඇන්ඩ් ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, සින්ටෙසි ලිමිටඩ්, ඩබ්ලිව්.එම්.මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්, ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්, අල්මාර් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිවෙලින් 2018, 2019, 2020, 2021 හා 2022 වර්ෂවල බැංකුවේ ඉහළම අක්‍රීය ණය අත්තිකාරම් ගණුදෙනුකරුවන් 10 ලැයිස්තුවෙහි අඛණ්ඩව ශ්‍රේණිගත විය. තවද, ලාෆ්ස් ගෑස් පී.එල්. දේශිකා එම්බ්‍රොයිඩර් සොලුයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් බැංකුවේ, ඉහළම අක්‍රීය අත්තිකාරම් ගණුදෙනුකරුවන් 10 දෙනා අතරට 2022.12.31 දිනට අලුතින්ම ලැයිස්තු ගත විය. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදි.<br>**ශ්‍රී ඉක්විප්මන්ට ෆයිනෑන්ස් ලිමිටඩ්**<br>සමාගම සාංගමික බුන්වත්බව යෝජනා කිරීමේ ක්‍රියාවලිය (CRIP) යටතේ පවතී.<br><br>**ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්**<br>අපි මුළු කළඹම නැවත උපලේඛන ගත කර ඇත. නැවත උපලේඛණගත කිරීමෙන් පසු ඔවුන් මුදල් ප්‍රවාහයන් එවීම ආරම්භ කර ඇති අතර බැංකුව පහසුකම් අයකර ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටී. | අයකිරීම් පසුවිපරම් කිරීම සහ අනාගතයේදී ණය ලබාදීමට පෙර ණයකරු ඇගයීම් තහවුරු කිරීමට නිර්දේශ කෙරේ. |

| අංකය | ණය කරුගේ නම | 2022.12.31 දිනට මුළු ණය ශේෂය (රු.මිලියන) |
|---|---|---|
| 1 | ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ් | 6,079.78 |
| 2 | සින්ටෙසි ලිමිටඩ් | 4,222.82 |
| 3 | කේ.ඩී.ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 3,919.34 |
| 4 | දොලියා ඉන්වෙස්මන්ට් (ප්‍රයිවට) ලිමිටඩ් | 3,505.80 |
| 5 | ඩබ්ලිව්.එම්.මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් | 3,406.34 |
| 6 | ලාෆ්ස් ගෑස් පීඑල්සී | 3,172.84 |
| 7 | අල්මාර් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,667.30 |
| 8 | අනුදාන් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, | 2,614.04 |
| 9 | දේශිකා එම්බ්‍රොයිඩර් සොලුයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,338.63 |
| 10 | රුහුණු ඩිවොලොප්මන්ට් කන්ට්‍රක්ටර්ස් ඇන්ඩ් ඉන්ජිනියරින් (□ෙයිවට්) ලිමිටඩ් | 1,856.74 |
| | **එකතුව** | **33,783.63** |

**ලාෆ්ස් ගෑස් පී.එල්.සී**

සමාගමට බංග්ලාදේශයේ ව්‍යාපාරයක් විකිණීමෙන් රු. මිලියන 661 ක් ලැබුණු බැවින්, කාලීන ණය හිඟය රු. මිලියන 391.69 ක් හා ණය පොලිය රු මිලියන 269.3 ක් අයකර ගැනිණි. තවද, සමාගම BLR හිඟ ශේෂයන් රු. මිලියන 175.15 ක් පියවන ලද අතර අක්‍රීය ණය අත්තිකාරම්වලින් කොටසක් සඳහා වෙනත් දේපලක් විකිණීමට අදහස් කරයි.

<u>දොලියාදෝ ඉන්වෙස්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්</u>

ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා (SBI) උකස් කරන ලද දේපල රු.මිලියන 14 කට විකිණීම ආරම්භ කළ අතර විකුණුම් ප්‍රතිෂ්ඨාව සමානුපාතික පදනම මත ණය දෙන්නන් අතර බෙදා හරිනු ලැබේ. SBI සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, බැංකුව මෙම ඉල්ලීම සමඟ මූලිකව එකඟ විය. බැන්ක් ඔෆ් මෝල්ඩිව්ස් ලිමිටඩ් ද එයට එකඟ වූ අතර ණය ගැණුම්කරුට නිල වශයෙන් ලිපියක් නිකුත් කරන ලදි. මෙම පහසුකම 2012 සිට අක්‍රීය අත්තිකාරම් වර්ගීකරණය යටතේ පැවති නිසා ලියා හැරීමක් සමඟ සම්පූර්ණ හා අවසන් පියවීමක් සඳහා බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

**දේශිකා එම්බ්‍රොයිඩර් සොලුයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්**

අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් පවතී.

**කේ.ඩී.ඒබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (KDESH)**

සමාගම මේ දක්වා රු.බිලියන 22 ක මුදල් ප්‍රවාහයක් බැංකුවට ලබා දී ඇත. මෙයට අමතරව, බැඳුම්කර හිමිකම්පෑමේ අවදානම අඩු කිරීමේ අදහසින් ව්‍යාපෘති අවසන් කිරීමට සමාගමට සහාය වීමට බැංකුව තීරණය කර ඇත.

**අනුදාන් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2023 .07 26 දින අවසාන නිවේදන පිළිගන්වා තිබුණි.

**රුහුණු ඩිවොලොප්මන්ට් කන්ට්‍රක්ටර්ස් ඇන්ඩ් ඉංජිනියරින් (RDCE)**

බැංකුව, සමාගම පුනරුද ක්‍රියාවලිය සඳහා සැලකිල්ලට ගත් අතර දැනට පවතින පහසුකම් නැවත උපලේඛණගත කර මුදල් ප්‍රවාහයන් වැඩිදියුණු කර ගැනීමට නව කාරක ප්‍රාග්ධන පහසුකම් ලබා දේ. ඒ අනුව, බැංකුව රු.බිලියන 0.4 ක ඍජු පහසුකම් ද, රු. මිලියන 2,000 ක අනෙකුත් වක්‍ර පහසුකම් ද ලබා දී ඇත. 2021 සිට පුනරුද කාලය තුළ මේ දක්වා රු. බිලියන 4.8 කට වඩා මුදල් ප්‍රවාහයන් සමාගම බැංකුවට ලබා දී ඇත. මෙයට අමතරව, බැඳුම්කර හිමිකම් පෑමේ අවදානම අඩු කිරීමේ අදහසින් ව්‍යාපෘති අවසන් කිරීමට සමාගමට සහාය වීමට බැංකුව තීරණය කර ඇත.

**සින්ටෙසි ලිමිටඩ්**

සුරක්ෂිත නොමැති (unsecured) පහසුකම් අයකර ගැනීම සඳහා සමාගමට හා අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නඩු පවරා ඇත.

**අල්මා ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගමට හා අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නඩු පැවරීමට නියමිත වේ. එන්තරවාසි භාර දෙන ලදි.

iv 2022 වර්ෂය තුළ ණය ප්‍රදානය කළ හා එම වර්ෂයේදීම අක්‍රීය ණය වර්ගීකරණයට මාරුකළ (නැවත උපලේඛණ ගත කළ පහසුකම් හැර) ඉහළම අක්‍රීය ණයකරුවන්ගේ මුළු හිඟ ශේෂය 2022 දෙසැම්බර් 31 දිනට රු මිලියන 1,555.66 විය. මෙය 2022 වර්ෂය තුළදී ලබා දුන් හා අක්‍රීය ණය කාණ්ඩයට මාරු කළ (නැවත උපලේඛණ ගත කළ පහසුකම් හැර) ණයවල මුළු හිඟ ශේෂයන් සියයට 73.5 ක් නියෝජනය කරයි.

| **ණයකරුගේ නම** | **2022.12.31 දිනට** | | |
|---|---|---|---|
| | **ණය සංඛ්‍යාව** | **2022 වර්ෂයේ ලබාදුන් මුළු මුදල (රු.මිලියන)** | **මුළු හිඟ මුදල (රු.මිලියන)** |
| ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5 | 951.12 | 979.79 |
| නවලෝක පයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ් | 10 | 131.50 | 138.58 |
| එම් ජී කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට් ) ලිමිටඩ් | 4 | 121.20 | 137.68 |
| ඇක්සෝන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 12 | 83.52 | 95.53 |
| එෆ්අයිබීසී ලංකා (ප්‍රයිවට් ) ලිමිටඩ් | 6 | 59.71 | 63.46 |
| පී.කේ.ජයතිලක මහතා | 1 | 35.00 | 39.51 |
| වයඹ ලංකා කොකෝ (ප්‍රයිවට්) ලිමිටඩ් | 1 | 27.77 | 30.84 |
| ඒඑම්එස්කේ කන්ස්ට්‍රක්සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2 | 22.96 | 27.12 |
| බී.ඒ.ජයසේකර මහතා | 1 | 20.50 | 21.93 |
| එම්.එෆ්.නිරෝෂන් | 1 | 19.78 | 21.22 |

**ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

බැංකුව දැනටමත් පහසුකම් සඳහා එන්තරවාසි 6 ක් ද, බැංකුවට උකස් කළ දේපල සඳහා අවසාන නිවේදන දෙකක් ද ලබා දී ඇත.

**නවලෝක පයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ්**

මෙම පහසුකම්, 2019 වර්ෂය තුළදී නවලෝක පයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත දැනටත් අනුමත කර ඇති සීමාව යටතේ ලබා දී ඇති උප ණය වේ. කොවිඩ් කාලපරිච්ඡේදය හා ඉන් පසුව සිට ප්‍රමාණවත් ව්‍යාපෘතීන් නොමැති වීම හේතුවෙන් සමාගම දැනට දැඩි මුදල් ප්‍රවාහ ගැටළුවලට මුහුණ දී ඇත.

**එම් ජී කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට් ) ලිමිටඩ්**

මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගෙවීම් ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් අක්‍රීය අත්තිකාරම්වලට මාරු කරන ලද අතර, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගෙවීම් ලැබීම

නිශ්චිත ණයකරුවන්ට ණය ප්‍රදානය කිරීමට පෙර බැංකුව විසින් ප්‍රමාණවත් ණයකරු ඇගයීම් සිදුකිරීම තහවුරු කිරීමට නිර්දේශ කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| ප්‍රනාන්දු මහතා | | | මත පහසුකම් පියවනු ලැබේ. |
| **එකතුව** | **1,473.06** | **1,555.66** | **ඇක්සෝන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>සමූහයට ලබාදී ඇති සියළු පහසුකම් ව්‍යාපාර පුනරුද සහ පුනරුත්ථාපන ඒකකය වෙත මාරු කර ඇති අතර, දැනට ව්‍යාපාරය ධනාත්මක මුදල් ප්‍රවාහයක් ලබා ගනිමින් සිටියි. එය අපේ ජංගම ගිණුමට බැර කරන අතර අක්‍රීය අත්තිකාරම් පහසුකම් අය කර ගැනීමට කටයුතු යොදා ඇත.<br>**එෆ්අයිබීසී ලංකා (ප්‍රයිවට් ) ලිමිටඩ්**<br><br>2022 වර්ෂය තුළ රටෙහි ඇති වූ ඉන්ධන හා ආර්ථික අර්බුදය සහ එහි ප්‍රතිඵලයක් ලෙස සමාගම දුෂ්කරතා කිහිපයකට මුහුණ දුන් බැවින් 2022 වර්ෂය තුළ ලබා දුන් ණය එම වර්ෂයේදීම අක්‍රීය ණය වලට මාරු කරන ලදි.<br><br>**පී.කේ.ජයතිලක මහතා**<br>ශාඛාව 2023.09.21 දින අවසන් නිවේදනය යවා ඇත.<br><br>**වයඹ ලංකා කොකෝ (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>ව්‍යාපාර පුනරුද හා පුනරුත්ථාපන ඒකකය හරහා 2023.09.18 දින ණය නැවත උපලේඛන ගත කරන ලදි.<br><br>**ජේඑම්එස්කේ කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>සමාගම සමඟ එකඟ වී ඇති පරිදි, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එකඟ වූ පරිදි අරමුදල් ලැබෙන්නේ නම් මෙම වර්ෂය තුළදී මෙම ණය පියවනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | **බී.ඒ.ජයසේකර මහතා**<br>2023.08.23 දින වන විට පහසුකම් සම්පූර්ණයෙන් පියවා ඇත.<br>**එම්.එෆ්.නිරෝෂන් ප්‍රනාන්දු මහතා.**<br>මාසික ණය වාරිකය ආසන්න වශයෙන් රු. මිලියන 1.5 කින් වැඩි කළ අතර මෙම අයහපත් ආර්ථික තත්වය තුළ ඔහුට එවැනි විශාල වාරිකයක් දැරීමට නොහැකිය. නමුත්, ණයකරු අඛණ්ඩව මේ දක්වාම ඔහුගේ මුලින් එකඟ වූ ණය වාරිකය තැන්පත් කරනු ලැබේ. | |
| v | පසුගිය වර්ෂ 4 ක කාල පරිච්ඡේදය තුළ බැංකුව විවිධ අංශවලට ලබා දී ඇති ණය මත අක්‍රීය ණය අනුපාතිකය ගණනය කිරීම විශ්ලේෂණය කිරීමේදී, නිෂ්පාදන, සංචාරක, කෘෂිකර්ම, වනජීවී හා ධීවර, ඉදිකිරීම්, යටිතල පහසුකම් සංවර්ධනය, තොග හා සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා හා සෞඛ්‍ය සේවා, සමාජ සේවා හා සහායක සේවාවන් යන අංශවල අක්‍රීය අනුපාතයන් වාර්තා වීම පසුගිය වසර 4 ක කාලය තුළ ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. | බැංකුව, දැනටමත් සංචාරක හා ඉදිකිරීම් කර්මාන්ත අවදානම සහිත කර්මාන්ත ලෙස සලකන අතර, අදියර 2 හා 3 යටතේ හානිකරණය සඳහා සැලකිල්ලට ගෙන ඇත. එසේම, බැංකුවේ වර්තමාන අපේක්ෂිත ණය අලාභ ආකෘතිය ප්‍රකාරව ආර්ථික සාධක ගැලපීම් සැලකීමෙන් අදාල අනුපාත භාවිතා කර ඇත. | අක්‍රීය ණය ආපසු අයකර ගැනීම් සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| vi | <u>දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන්ට ලබා දුන් ණය හා අත්තිකාරම් (PEPs)</u><br>බැංකුවේ කළමනාකරණ තොරතුරු පද්ධතියේ (MIS) පවතින තොරතුරුවලට අනුව, 2023 අප්‍රේල් 30 දිනට දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන්ට ලබා දී ඇති මුළු අක්‍රීය ණය රු.මිලියන 10,871 ක් වූ අතර, එය මුළු අක්‍රීය ණය පහසුකම්වලින් (උකස් ණය, ණය පත්, කාර්ය මණ්ඩල ණය හැර) සියයට 6.16 ක් නියෝජනය විය. තොරාගත් නියැදියක් සම්බන්ධ නිරීක්ෂණ පහත පරිදි වේ. | | |
| | (අ) <u>ණය අංකය 88960012</u><br>නිවස තව දුරටත් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් මෙම ණය අංකය යටතේ මාස 60 කාලයක් සඳහා වර්ෂයකට සියයට 29 ක පොලී අනුපාතයක් යටතේ බැංකුව රු.මිලියන 5 ක ණය පහසුකමක් ලබා දී ඇත. 2022 මැයි 19 දින පහසුකම ලබා දුන් අතර ඇප ලෙස පුද්ගල ඇප දෙකක් සලකා දී ඇත. පසුව, පහසුකම ලබා දුන් දින සිට මාස 7 කට පසු එනම්, 2022 දෙසැම්බර් 19 දින මෙම පහසුකම අක්‍රීය වර්ගීකරණට මාරු කරන ලදි. 2023 මැයි 12 වන විට හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.මිලියන 4.89 ක් හා පොලිය රු. මිලියන1.03 ක් සමඟ රු. | නිමලවීර මහතා 2022.04.01 දින ලබා දුන් ප්‍රකාශයට අනුව, ඔහු ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ උපදේශකයෙක් බවත්, ජනාධිපතිවරයාගේ අතිරේක ලේකම් බවත් සඳහන් වේ. එබැවින්, බැංකුව සහකාර සාමානාසාධිකාරී (බස්නාහිර පළාත- දකුණ) ගෙන් PEP | අයකිරීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| මිලියන 5.92 ක් විය.<br>ණයකරු බැංකුවේ දිගුකාලීන ගණුදෙනුකරුවකු නොවන අතර ණයකරුට අයත් ඉතිරිකිරීමේ ගිණුමක් ණය ලබා දීමට මාසයකට පෙර එනම්, 2022 අප්‍රේල් 20 දින විවෘත කර තිබුණි. තවද, මහරගම ප්‍රධාන කළමනාකරු වෙත ඇති සටහන අනුව, ණය තොරතුරු කාර්යාංශ (CRIB) තත්වය අහිතකර ලෙස දැක්වුණි. කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 12/2021 හි 8.3 වගන්තිය ප්‍රකාරව, "දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් සමඟ ඇති සම්බන්ධතා නිතරම ඉහළ අවදානමක් ඇති කරන සම්බන්ධතා ලෙස සැලකිය යුතු" වුවද, පුද්ගලික ඇප දෙකක් මත පදනම්ව නව ගණුදෙනුකරුවකු සඳහා ණය සලකා බලා ඇති අතර මූලික ණය ලබා දෙන අවස්ථාවේදීම එය ඉහළ ණය අවදානමක් ඇති කරන බැවින් එම ඇප ණය සුරක්ෂණයට ප්‍රමාණවත් නොවේ. දැනට ණයකරුගේ ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂයක් නොමැති අතර, බැංකුව ණයකරුට සිහිකැඳවීම් තුනක් යවා ඇත. කෙසේ වෙතත්, 2023 ඔක්තෝබර් 25 සමාලෝචන දින වන විට ණයකරු පොරොන්දු වූ පරිදි කිසිදු ගෙවීමක් කර නොතිබුණි. | අනුමැතිය ලබා ගන්නා ලදි.<br>• 2022.04.26 දින ලබා ගත් ණය තොරතුරු කාර්යංශ වාර්තා අංක W 0077154135/2022 හා අංක W-0077154124 /2022 ට අනුව, නිමලවීර මහතා පැහැර හරින්නෙක් ලෙස පෙන්නුම් නොකරන ලදි.<br>• ඔහුගේ තත්වය සහ මූල්‍ය ශක්තිය මත පදනම්ව අපි මෙම ණය ලබා දුන්නෙමු.<br><br>2022.12.12 දින සිහිකැඳවීමේ ලිපි ණයකරුට යවන ලද අතර ණයකරු 2022.12.19 දින ශාඛාවට පැමිණෙන ලදි. නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර 2023.09.14 දින අවසාන සිහිකැඳවීම් ලිපි යැවූ අතර ඒවා බැංකුව වෙත නැවත ලැබී තිබුණි. | |
| (ආ) <u>ණය අංක 80420428</u><br>යෝජිත සාප්පු සංකීර්ණයේ වානිජමය ඉදිකිරීම සඳහා ඉහත ණය අංකය යටතේ මාස 120 ක කාල පරිච්ඡේදයකට වාර්ෂිකව සියයට 15 ක පොලී අනුපාතයකට රු.මිලියන 35 ක ණය පහසුකමක් බැංකුව ලබා දී ඇත. 2017 පෙබරවාරි 14 දින පහසුකම ලබා දී ඇති අතර ඇපකර ලෙස ඉඩමක් සලකා තිබුණි. පසුව, 2019 මැයි 14 දින පහසුකම අක්‍රීය වර්ගීකරණය මාරු කර තිබුණු අතර, 2023 මැයි 15 දිනට හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු. මිලියන 29.51 ක් හා පොලිය රු.මිලියන 21.55 ක් ඇතුළත්ව රු.මිලියන 51.06 ක් විය.<br>කාර්යාල උපදෙස් චක්‍රලේඛ (OIC) අංක 12/2021 හි 8.3 වගන්තිය ප්‍රකාරව, "දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් සමඟ ඇති සම්බන්ධතා නිතරම ඉහළ අවදානමක් ඇති කරන සම්බන්ධතා ලෙස සැලකිය යුතුය". කෙසේ වෙතත්, ඉහත ණය ලැයිස්තුගත කර ඇති අනුපාතයට වඩා සියයට එකක් අඩුවෙන් ලබා දී තිබුණු අතර ජංගම ගිණුම හරහා සියලුම ව්‍යාපාර කටයුතු කිරීම සඳහා එම ගිණුම මහජන බැංකුවේ පවත්වාගෙන ගොස් තිබුණි. තවද, පවතින ණය නැවත උපලේඛන ගත කිරීම පිණිස නව ණය සංදේශයක් අනුමත කර තිබුණි. එබැවින්, 12/2021 දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛය මඟින් නියම කර ඇති පරිදි ණයකරු අවදානම් වැඩි ණයකරුවකු ලෙස සැලකිල්ලට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | ඉහළ අවදානම අඩු කිරීමට නැවත උපලේඛණ ගත කිරීම සඳහා ශාඛාව විසින් 2019.11.25 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (DGM) - අයකිරීමේ අංශය) වෙතින් අනුමැතිය ලබා ගෙන තිබුණු නමුත්, එම පහසුකම ලබා දී නොතිබුණි. 2022 දී ණයකරුට අවසාන නිවේදනය ශාඛාව යවන ලදි. 2023.09.19 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- ව්‍යාපාර පුනරුද හා පුනරුත්ථාපන ඒකකය (BRRU) සහ ණයකරු සමඟ සාකච්ජා වූ පරිදි, සම්පූර්ණ ධාරිතාවයෙන් ඉන්ධන පිරවුම්හල ක්‍රියාත්මක කිරීම සඳහා ණයකරුට පවතින පහසුකම් නැවත | අයකිරීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| තත්වයේ බරපතලකම ණයකරුගේ දේශපාලන පසුබිම හේතුවෙන් බව අනාවරණය විය. | උපලේඛනගත කිරීමටත් ව්‍යාපාර පුනරුද හා පුනරුත්ථාපන ඒකකය යෝජනා කෙරිණි. නමුත් ණයකරු තවමත් අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. ණයකරු අවශ්‍ය ලේඛණ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් ව්‍යාපාර පුනරුද හා පුනරුත්ථාපන ඒකකය ගොනුව ආපසු ලබා දෙන බව 2023.11.13 දින දැනුවත් කර ඇත. | |
| (ඇ) ණය අංක 78010386<br>පවතින ව්‍යාපාරය වැඩිදියුණු කිරීමටත්, වෙනත් මූල්‍ය ආයතනවලින් ලබා ගත් කල්බදු පහසුකම ගෙවීම සඳහා ඉහත අංකය යටතේ මාස 72 ක කාල පරිච්ඡේදයක් සඳහා වර්ෂයකට සියට 13 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 15 ක වටිනාකමක ණය පහසුකමක් බැංකුව ලබා දී තිබුණි. පහසුකම 2015 සැප්තැම්බර් 23 දින ලබා දී තිබුණු අතර ඇපකරය ලෙස ඉඩමක් සලකා තිබුණි. පසුව, 2015 සැප්තැම්බර් 23 වන දින පහසුකම අක්‍රීය වර්ගීකරණයට මාරු කර තිබුණි. 2023 මැයි 15 දිනට හිඟ ශේෂය, ප්‍රාග්ධන ශේෂයන් රු.මිලියන 5.94 ක් හා පොලිය රු. මිලියන 3.74 ක් ඇතුලත්ව රු.මිලියන 9.68 ක් විය.<br>අංක 28/2015 දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛයේ දක්වා ඇති ඇමුණුම II ප්‍රකාරව, පහසුකම් සඳහා ඇප ලෙස ඉදිරිපත් කරන නේවාසික නිශ්චල දේපලක බැංකුවේ තක්සේරුවෙන් සියයට 75 කට උපරිම ණය මුදල සීමා කළ යුතු වේ. කෙසේ වෙතත්, ඉහත ණය මුදල උකස් කළ දේපලෙහි බලපෑම් ගත විකුණුම් වටිනාකමින් (Forced Sale Value -FSV) සියයට 88.24 ක් නියෝජනය කරන බවත්, එය බැංකුව විසින් නියම කර ඇති සීමාවට පටහැණි බවත් නිරීක්ෂණය විය. අත්තිකාරම් අනුපාතය ඉක්මවීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන තිබුණද, අධි අත්තිකාරම් ලබා දීම හේතුවෙන් අයකර ගැනීමේ හැකියාව සැක සහිත වන අතර එය දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් සමඟ සම්බන්ධතාවය වශයෙන් සලකා බැලූ කල ඉහළ අවදානමක් ඇති කරයි. ණයකරු රු. 150,000 ක මාසික ගෙවීමක් කිරීමට එකඟ වුවද, එකඟ වූ පරිදි කිසිදු ගෙවීමක් කර නොතිබුණි. 2023 මැයි 16 දිනට බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංක 70748628 හි රු. මිලියන 0.75 ක මුදලක් රඳවාගෙන තිබෙන අතර පවතින පහසුකම් වල දැනට තත්වය පහත පරිදි වේ. | 2015 සිදු කරන ලද තක්සේරුවට අනුව, යෝජිත පහසුකම සඳහා අත්තිකාරම් අනුපාතය (ROA) සියයට 88.24 ක් බව පෙන්වා දෙනු ලැබේ. එම දේපළෙහි තක්සේරු අදහස් දැක්වීම සම්බන්ධව 2017.07.24 දිනැති සහකාර සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත - උතුර - WPN) ගේ ලිපියෙහි බලපෑම් සහගත විකුණුම් වටිනාකම (FSV) රු.මිලියන 30 ක් දක්වා වැඩිකර තිබෙන බවත්, එය අත්තිකාරම් අනුපාතය අඩු කිරීමට හා අවදානම අඩුකර ගැනීමට හේතු වී ඇති බවත් සඳහන් කර තිබුණි.<br>මෙම පහසුකම සඳහා වූ සංදේශයේ, ණය ගැණුම්කරුගේ තත්වය ඇය, දේශපාලන වශයෙන් අනාවරණය වූ ගනුදෙනුකරුවකු ලෙස හඳුනාගෙන ඇති බවත්, උද්‍යාන අලංකරණය සම්බන්ධව ඇගේ දැනුම සහ කළමනාකරණ කුසලතා මෙන්ම වාසිදායක සම්බන්ධතා ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා උපකාරී විය හැකි බවත් පැහැදිලිව සඳහන් කර තිබුණි. කෙසේ | අයකිරීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| පහසුකම් අංකය | පහසුකම ලබාදුන් දිනය | 2023.05.16 දිනට හිඟ ශේෂය (රු.මිලියන) | අක්‍රීය අත්තිකාරම් වූ දිනය |
|---|---|---|---|
| 78010386 | 2015.09.23 | 9.68 | 2020.01.23 |
| 85125582 | 2019.11.14 | 5.14 | 2020.08.16 |
| 6876751 (ස්ථිර බැංකු අයිරා) | 2017.10.30 | 5.00 | |
| 6876751 (තාවකාලික බැංකු අයිරා) | 2019.11.15 | 2.59 | 2020.02.□4 |

වෙතත්, දේපළට ඉහළ වෙළඳපොළක් හා නේවාසික වටිනාකමක් පවතින නිසා ලබාදුන් පහසුකම්වලට සාපේක්ෂව බැංකුවට හොඳ සුරක්ෂණයක් පවතී.

පහසුකම් අක්‍රීය අත්තිකාරම් (NPA) අංශයට මාරු කළ පසු, ණයගැණුම්කරු ණය නැවත උපලේඛනගන කිරීමට ඉල්ලා ඇති අතර පහසුකම් නැවත උපලේඛනගත කිරීමට අවශ්‍ය පූර්ව අනුමැතීන් ශාඛාව ලබා ගන්නා ලදි. ණය ගැණුම්කරු මාසිකව රු. 150,000 ක් ගෙවීමට එකඟ විය. අවාසනාවන්ත ලෙස, රටෙහි පවතින ආර්ථික අර්බුදයත් සමඟ එකඟ වූ ගෙවීම් අඛණ්ඩව සිදු කිරීමට අපොහොසත් වී ඇත. කෙසේ වෙතත්, ඇගේ ජංගම ගිණුමෙන් (හෙළ රස නිෂ්පාදන සහ සහල් මෝල-90210409) රු.200,000 ක් මාරු කිරීමට ඇය එකඟ වූ පසු දැනටමත් ඇය ඇගේ අක්‍රීය අත්තිකාරම් පහසුකම් සඳහා සැලකිය යුතු මුදලක් ගෙවමින් සිටියි.

(ඇ) ණය අංකය 83906656

ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් මිලදී ගැනීම සඳහා ඉහත ණය අංකය යටතේ මාස 68 ක කාල පරිච්ඡේදයක් සඳහා වර්ෂයකට සියයට 17 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 9 ක වටිනාකමැති ණය පහසුකමක් බැංකුව ලබා දී ඇත. පහසුකම, 2019 පෙබරවාරි 15 ලබා දී තිබූ අතර ඇපකර ලෙස පුද්ගල ඇපකරුවන් දෙදෙනෙකු සලකා තිබුණි. පසුව, 2021 අප්‍රේල් 18 දින පහසුකම අක්රිය කාණ්ඩයට මාරු කරන ලදි. 2023 මැයි 17 දිනට හිඟ ශේෂය, ප්‍රාග්ධන වටිනාකම රු. මිලියන 8.1 ක් හා පොලිය රු.මිලියන 5.85 ක් ඇතුළත්ව රු.මිලියන 13.95 ක් විය. 2021 අප්‍රේල් 18 දින ණය, අක්‍රීය කාණ්ඩයට මාරු කළ පසු ණය ගැණුම්කරු කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණි. ණය ගැණුම්කරුගේ පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

- පිරිනැමුම් ලිපියෙහි සඳහන් මෙහෙයුම් කොන්දේසි ප්‍රකාරව, බැංකු ශාඛාවේ පවත්වාගෙන යන අංක 70313040 දරන ජංගම ගිණුම හරහා ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහයන් ගමන් කිරීම සිදු විය යුතු වුවද, 2021 ජනවාරි

ශාඛාව වැරදි ලෙස පිරිනැමීමේ ලිපිය නිකුත් කර ඇති අතර, එහි "උකස් සුරකුම් ජීවිත රක්ෂණය ලබාගත යුතුය" යන කොන්දේසිය ඇතුළත් වේ. කෙසේ වෙතත්, අනුමත සංදේශයෙහි එවැනි කොන්දේසියක් නොමැත. කෙසේ වෙතත්, "අයදුම්කරුගේ අනාගත පහසුකම් දේපළ උකස් යටතේ යෝජනා කළ යුතුය" යන අනුමත සංදේශයේ පනවන ලද කොන්දේසිය යටතේ, වී තොගය සහ පුද්ගල ඇපකරුවන්

අයකිරීම් පසුවිපරම් කිරීම අවශ්‍ය වේ.

| | | |
|---|---|---|
| 31 සිට එවැනි ගනුදෙනු සිදු වී නොමැත.<br>• අදාල පිරිනැමුම් ලිපියෙහි දක්වා ඇති විශේෂිත කොන්දේසි ප්‍රකාරව, උකස් සුරකුම් ජීවිත රක්ෂණයක් (DTA) ලබා ගෙන නොතිබුණි.<br>• සංදේශයේ ඇති ඇමුණුමේ දක්වා ඇති අංක 5 සහ 10 දරන කොන්දේසිවලට අනුගත නොවීම පහත දැක්වේ.<br>**5 වන කොන්දේසිය-** අනිවාර්යය ඉතිරිකිරීම් ගොඩනැගීමක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.<br>**10 වන කොන්දේසිය-** දේපළ උකස් යටතේ අනාගත පහසුකම් යෝජනා කළ යුතු වුවද, බැංකුව පුද්ගල ඇපකර යටතේ අංක 84192412, අංක 84301412 හා අංක 84886899 දරන ණය පහසුකම් 03 ක් ලබා දී තිබුණි.<br>තවද, සංදේශයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.<br>• සංදේශයට සහාකාර සාමාන්‍යාධිකාරී (ඌව) සහ ප්‍රාදේශීය කළමනාකරු අත්සන් කර නොතිබුණි.<br>• ණය තොරතුරු කාර්යාංශයට(CRIB) අනුව, වෙනත් මූල්‍ය ආයතනයක ලියාහරින ලද පහසුකමක් වෙනුවෙන් අයදුම්කරු ඇපකරුවෙක් ලෙස පෙනී සිට තිබේ.<br>• පීපල්ස් ලීසිං පීඑල්සී විසින් ලබා දී ඇති පහසුකමක් සඳහා පැහැරහරින ලද ඇපකරුවකු ලෙස එක් ඇපකරුවකු දැක්විණි. | දෙදෙනෙකුගේ ඇප මත, ඔඩපන (Pledge) පහසුකම් සඳහා නිකුත් කළ චක්‍රලේඛය ප්‍රකාරව, නෙළාගත් වී තොග ගබඩා කිරීමට පහසුකමක් ලබා දී ඇත.<br>පහසුකම් අංක 84192412 සහ අංක 84301412 ඩයස් මහතාගේ වක්‍ර වගකීම් විය.<br>සහකාර සාමාන්‍යාධිකාරී (ඌව) සහ ප්‍රාදේශීය කළමනාකරු පිළිවෙලින් ඔවුන්ගේ අනුමැතිය හා නිර්දේශය වෙනම ඇමුණුමකින් ලබා දී ඇති අතර එය සංදේශයේ සඳහන් වේ. අයදුම්කරු හා ඇපකරු ණය තොරතුරු කාර්යාංශයේ අහිතකර ලෙස පෙන්නුම් කරන අතර, පහසුකමට අදාල අනුමැතිය, පවරා ඇති පරිදි පළාත් සහකාර සාමාන්‍යාධිකාරී වෙතින් ලබා ගෙන ඇත. අයකර ගැනීමේ ක්‍රියාමාර්ග දැනටමත් ආරම්භ කර ඇත. | |
| (ඉ) <u>ණය අංක 84886899</u><br>2019 සැප්තැම්බර් 23 දින වී මිලදී ගැනීම සඳහා ඉහත ණය අංකය යටතේ මාස 6 ක කාල පරිච්ඡේදයක් සඳහා සියයට 12 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 20 ක වටිනාකමක ණයක් ලබා දී තිබුණි. රු.මිලියන 27.4 කට අගය කළ දේශීය තොගය සහ පුද්ගල ඇපකරුවන් දෙදෙනෙකු ඇප ලෙස සලකා තිබුණි. පසුව, මෙම පහසුකම අක්‍රීය කාණ්ඩයට මාරු කර තිබුණු අතර, 2023 මැයි 17 දිනට හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.මිලියන 5.3 ක් හා පොලිය රු.මිලියන 1.9 ක් ඇතුළත්ව රු.මිලියන 7.2 ක් විය. එක් ඇපකරුවෙකු මූල්‍ය සමාගමකින් ලබා ගත් රු.මිලියන 5 ක පැහැර හරින ලද ණය පහසුකමක් සඳහා ඇපකරුවකු ලෙස පෙනී ගිය අතර, එහි හිඟ ශේෂය රු.මිලියන 1.5 ක් විය. මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. අනිත් ඇපකරු කල්බදු පහසුකමක පැහැර හැරි ණයකරුවකු ලෙස පෙනී ගොස් තිබුණි. අර්පණ/පිරිනැමුම් ලිපියේ සඳහන් නිශ්චිත කොන්දේසි ප්‍රකාරව, උකස් ජීවිත රක්ෂණයක් (DTA) ලබාගෙන නොතිබුණි. | කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 279/15 හි 7 වන වගන්තිය ප්‍රකාරව, ඇප ලෙස තොගය ඔඩපන විය යුතුය (securities should be Pledge over stocks)<br>• අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ හා පුද්ගල ඇපකර කිහිපයක් හෝ වෙනත් පුද්ගලයන් දෙදෙනෙකුගේ ඇප බැංකුවට පිළිගත හැකිය.<br>• <u>රක්ෂණ ප්‍රතිපත්තිය</u><br>ශාඛාව වැරදි ලෙස අර්පණ ලිපිය නිකුත් කර ඇති අතර එහි "උකස් ජීවිත රක්ෂණයක් ලබා ගත යුතුය" යන කොන්දේසිය ඇතුළත් වේ. කෙසේ වෙතත්, | අයකිරීම් පසුවිපරම් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| | අනුමත වූ සංදේශයේ එවැනි කොන්දේසියක් නැත. ඉහත දක්වන ලද කාර්යාල උපදෙස් චක්‍රලේඛය අනුව, වී තොගය සඳහා රක්ෂණයක් ලබා ගෙන තිබුණි. | |
| (ඊ) <u>ණය අංක 87370868</u><br>"ණය පහසුකම් අංක 85325534 සඳහා ණය සහනයක් (debt moratorium) ලබාදීමේ අරමුණින්" ඉහත ණය අංකය යටතේ මාස 24 ක කාලපරිච්ඡේදයක් සඳහා වර්ෂයකට සියයට 5.75 ක පොලී අනුපාතයකට රු. මිලියන 5.34 ක වටිනාකමැති ණය පහසුකමක් බැංකුව ලබා දී ඇත. පහසුකම, 2021 මාර්තු 31 ලබාදී තිබුණු අතර ඇපකර ලෙස ණය ගිවිසුම සලකා තිබුණි. පසුව, 2021 අගොස්තු 11 දින පහසුකම අක්‍රීය වර්ගීකරණයට මාරු කර තිබුණි. 2023 මැයි 19 දින වන විට හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.මිලියන 5.34 සහ පොලිය රු. මිලියන 0.70 ක් සමඟ රු.මිලියන 6.03 ක් විය. ණය සහනයට පරිවර්තනය කළ පහසුකම, 2023 මාර්තු 31 දින කල් පිරී තිබූ අතර කිසිදු ආපසු ගෙවීමක් ලැබී නොතිබුණි. | බැංකුව, 2022 සැප්තැම්බර් අවසාන නිවේදනය යවන ලදි. එයට පසු ශාඛා නිලධාරීන් ණය ගැණුම්කරු සමඟ සාකාච්ඡා කිහිපයක් පවත්වන ලද අතර ඔහු 2023 නොවැම්බර් 20 හෝ එදිනට පෙර මෙම පහසුකම පියවීමට එකඟ විය. | අය කිරීම් පසුවිපරම් කිරීම අවශ්‍ය වේ. |
| (උ) <u>ණය අංක 88277971</u><br>සහන ණයක් ලෙස ඉහත ණය අංකය යටතේ මාස 33 ක කාල පරිච්ඡේදයක් සඳහා වර්ෂයකට සියයට 8 ක පොලී අනුපාතයකට රු. මිලියන 6.59 ක් වටිනා ණය පහසුකමක් බැංකුව ලබා දී ඇත. 2021 දෙසැම්බර් 23 දින සුරැකුම් රහිත පදනම මත පහසුකම ලබා දී තිබුණි (ණය ගිවිසුම හා පිරිනැමුම් ලිපියට විරුද්ධව). පසුව, 2022 සැප්තැම්බර් 30 දින පහසුකම අක්‍රීය වර්ගීකරණයට මාරු කර තිබුණි. 2023 ඔක්තෝබර් 3 දින වන විට හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු. මිලියන 6.59 ක් හා පොලිය රු.මිලියන 0.92 ක් ඇතුළත්ව රු. මිලියන 7.51 ක් විය.<br>බැංකුව එම ණය ගැණුම්කරුට සුරැකුම් රහිත පදනම මත පහත ණය පහසුකම් ලබාදී ඇති බවත් ඒවා දැනටමත් අක්‍රීය තත්වයේ පවතින බවත් නිරීක්ෂණය විය. | සියලු පහසුකම් සහන උප ණය වේ. මෙම කල්බදු පහසුකම් 5 බස් 5 ක් මිලදී ගැනීම සඳහා ලබා දෙන ලදි. එබැවින්, පහසුකම් ශුද්ධ පදනම මත ලබාදී ඇති අතර එහිදී කල් බදු වත්කම්වල නිරපේක්ෂ අයිතිය බැංකුව සතු වේ. | අයකිරීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| ණය අංකය | අයිසීබීඑස් අනුව සුරැකුම් වටිනාකම | 2023.06.26 දිනට ගෙවා නිම කළ යුතු වටිනාකම (රු.මිලියන) | අක්‍රීය ලෙස මාරු කළ දිනය |
|---|---|---|---|
| 88277971 | ණය ගිවිසුම | 7.35 | |
| 88277748 | ණය ගිවිසුම | 2.38 | 2022.09.20 |
| 88277546 | ණය ගිවිසුම | 2.55 | |

| | | | |
|---|---|---|---|
| 88277358 | ණය ගිවිසුම | 2.28 | |
| 88276957 | ණය ගිවිසුම | 2.34 | 2022.10.24 |

| | | |
|---|---|---|
| (ඉ) <u>ණය අංක 87738119</u> | | |
| දැනට ඇති ණය පහසුකම් අංක 85764387, 86811155, 86818226, 85988344 හා 86841068 පියවීමේ අපේක්ෂාවෙන් මාස 120 ක කාල පරිච්ඡේදයක් සඳහා වර්ෂයකට සියයට 12 ක පොලී අනුපාතයකට රු. මිලියන 7.7 ක වටිනාකමක ණය පහසුකමක් බැංකුව ලබා දී තිබුණි. නිශ්චල දේපලක් උකස් කිරීම මත මෙම පහසුකම 2021 අගෝස්තු 2 දින ලබා දී තිබුණි. පසුව, 2022 සැප්තැම්බර් 15 දින පහසුකම අක්‍රීය වර්ගීකරණයට මාරු කර තිබුණි. 2023 ජූනි 26 දින වන විට හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.7.31 ක් හා පොලිය රු. මිලියන 2.31ක් ඇතුළත්ව රු.මිලියන 9.62ක් විය.<br>දැනට පවතින අක්‍රීය පහසුකම් පියවීමේ පරමාර්ථයෙන් පහසුකම ලබා දී තිබුණ ද, නව පහසුකම නැවත උපලේඛන ගත කළ පහසුකමක් ලෙස වර්ගීකරණය කරනු ලැබීම වෙනුවට අලුත් පහසුකමක් ලෙස වර්ගීකරණය කර තිබුණි. ඒ අනුව, මෙම පහසුකම ලබාදීමේ පරමාර්ථය ශාඛාවේ අක්‍රීය ණය තත්වය අඩුකිරීම බව පෙනී ගිය අතර, මෙම පහසුකම ශූන්‍ය අවදානමක් ඇති පහසුකමක් ලෙස හඳුනාගෙන තිබූ බැවින්, නව පහසුකම් වර්ගීකරණය තුළින් සත්‍ය අවදානම් සාධක පිළිබිඹු නොවිනි.<br>2021 ජූලි 12 දිනැති ණය සඳහා ලබා දුන් සහන කොන්දේසි ප්‍රකාරව, ව්‍යාපාරය පිළිබඳ කරනු ලබන නිසි පරීක්ෂාවකින් පසුව කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වටිනාකම කළමනාකරු නිදහස් කළ යුතු අතර එම අරමුදල් ඒ ආකාරයෙන්ම භාවිතා කර ඇති බව තහවුරු කළ යුතු මෙන්ම, තොග මට්ටම සම්බන්ධ ආරක්ෂාව සහ අදාල පරීක්ෂණ වාර්තා සුරැකුම සමඟ ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සම්පූර්ණ ණය වටිනාකම ඒ දවසේම නිදහස් කර තිබෙන අතර, රු. මිලියන 0.9 ක කාරක ප්‍රාග්ධන කොටස අරමුදල භාවිතා කිරීම පිළිබඳ පූර්ව පරීක්ෂාවකින් තොරව එකවරම නිදහස් කර තිබුණි.<br>කාලානුරූපී පරීක්ෂණ වාර්තා හා පශ්චාත් පරීක්ෂණ වාර්තා සුරක්ෂිත ගොනුවේ නොතිබූ අතර සෑම වසරකම සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.<br>තවද, සියලු ව්‍යාපාර ගනුදෙනු සහ ව්‍යාපාර අරමුදල් ප්‍රවාහ ශාඛාවේ පවත්වාගෙන යන ජංගම ගිණුම හරහා සිදු කර නොතිබූ අතර, ශාඛා කළමනාකරු එය අධීක්ෂණය කර නොතිබුණි. එකඟ වූ පරිදි අනිවාර්ය ඉතිරිකිරීමේ ගොඩනැගීමක් සිදු කර නොතිබුණි. | හිඟව පවතින පහසුකම් 5 ක් පියවීම සඳහා හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා (රු.මිලියන 1.2) සඳහා රු.මිලියන 7.7 ක පහසුකම ලබා දෙන ලදි. ණය වර්ගීකරණය යටතේ දැනට පවතින මඟපෙන්වීම්වලට ශාඛාව අනුකූල නොවී තිබුණි. අදාල නිරීක්ෂණ වාර්තා සුරැකුම් ලේඛණ ගොනුවේ ගොනු කර ඇත.<br>ව්‍යාපාර ගනුදෙනු ජංගම ගිණුම වෙනුවට ඉතිරි කිරීමේ ගිණුම් අංක 85930587 හරහා සිදු කර ඇත. ඉතිරි කිරීම් ගොඩ නැගීම සඳහා ස්ථාවර නියෝගයක් සක්‍රීය කර ඇත. කෙසේ වෙතත්, ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එය ස්වයංක්‍රීයව අවලංගු වී ඇත. | අය කිරීම් පසුවිපරම් කිරීම අවශ්‍ය වේ. |
| (එ) <u>ණය අංක 71893274</u> | | |
| නිවාසයක් මිලදී ගැනීමේ අරමුණින් ඉහත ණය අංකය යටතේ මාස 180 ක කාල පරිච්ඡේදයක් සඳහා වර්ෂයකට සියයට 13.5 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 10 ක් වටිනා ණය පහසුකමක් බැංකුව ලබා දී තිබුණි. නේවාසික දේපළක උකසක් | පහසුකම 2011.06.22 දින ලබා දී ඇති අතර පහසුකම ලබා දෙන අවස්ථාවේදී නිවාස ණය සඳහා අදාල වන | අය කිරීම් පසු විපරම් කිරීම් අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| මත 2011 ජූනි 22 දින පහසුකම ලබා දී ඇත. පසුව, 2020 සැප්තැම්බර් 21 දින පහසුකම අක්‍රීය වර්ගීකරණයට මාරු කර තිබුණි. 2023 ජූලි 6 දින වන විට හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.මිලියන 6.06 ක් හා පොලිය රු.මිලියන 1.41 ක් ඇතුළත්ව රු. මිලියන7.47 ක් විය.<br>කාර්යාල චක්‍රලේඛ අංක 129/2006 හි 6 වන සංශෝධනයේ සඳහන් 2.3 වගන්තිය ප්‍රකාරව, නිවාස ණය යෝජනා ක්‍රමයේ සංශෝධිත පොලී අනුපාතය වර්ෂයකට සියයට 20 ක් වුවත්, පෙර කී ණය සඳහා වාර්ෂික පොලිය සියයට 13.5 ක් ලෙස සහකාර සාමාන්‍යාධිකාරී (පාරිභෝගික ණය කළමනාකරු) අනුමත කර ඇති බව නිරීක්ෂණය විය.<br>තවද, කාර්යාල චක්‍රලේඛ අංක 129/2006 හි පළමුවන සංශෝධනයේ සඳහන් 2 වන වගන්තිය ප්‍රකාරව, අත්තිකාරම් අනුපාතය රු.මිලියන 13 ක වෙළඳපල වටිනාකමින් සියයට 75 ක් හෝ රු.මිලියන 11 ක මිලදී ගැනුම් මිලෙන් සියයට 80 හෝ යන දෙකින් අඩු අගය විය යුතුය. කෙසේ වෙතත්, ඉහත ප්‍රකාශිත උපදෙස්වලට පටහැණිව, බැංකුව රු. මිලියන10 ක් ලබා දී තිබූ අතර, එය වෙළඳපළ වටිනාකමින් සියයට 77 ක් සහ මිලදී ගැනීමේ මිලෙන් සියයට 90 ක් නියෝජනය කරයි. | පොලී අනුපාතය සියයට 13.5 කි (භාණ්ඩාගාර නිවේදන 140).<br>දැනට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර අවසාන නිවේදනය 2023.10.23 දින යවා ඇත. | |
| (ඒ) ණය අංක 89724786/89069209<br>බැංකුව එෆ්අයිබීසී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පිළිවෙලින් ණය අංක 89724786 හා 89069209 යටතේ උපකල්පිත තොගයක් (Hypothecated Stock) ඇප ලෙස තබා ගෙන මාස තුනක කාලයක් සඳහා වර්ෂයකට සියයට 28.45 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 8.046 ක් සහ මාස දෙකක කාලයක් සඳහා වර්ෂයකට සියයට 23.62 ක පොලී අනුපාතයකට රු.මිලියන 10.96 ක් වටිනා ණය පහසුකම් දෙකක් ලබා දී තිබුණි. පසුව, පිළිවෙලින් 2023 අප්‍රේල් 16 දින හා 2022 නොවැම්බර් 7 වන දින පහසුකම් අක්‍රීය කාණ්ඩයට මාරු කර ඇත. | මෙම ණය පහසුකම් දෙක උපකල්පිත තොග පහසුකම්වල උප සීමාවන් ලෙස ලබා දී තිබුණු අතර, මාසික පොලී අනුපාතය සාමාන්‍ය බරතැබූ ප්‍රාථමික ණය අනුපාතය +සියයට 2.5 (AWPLR+2.5%) අදාල කර ගැනීමට වත්කම් හා කළමනාකරණ කමිටුව එහි අනුමැතිය ලබා දී තිබුණි.<br>2023 දෙසැම්බර් 31 දිනට පෙර සම්පූර්ණයෙන් පියවීමකට සමාගම එකඟ විය. | අයකිරීම් පසුවිපරම් කිරීම අවශ්‍ය වේ. |
| (ඔ)ණය අංක 9091971/90919189<br>බැංකුවේ ව්‍යාපාර පුනරුද ඒකකය 2023 ජූනි 23 දින වර්ෂයකට සියයට 18 ක හා සියයට 5 ක පොලී අනුපාත යටතේ මාස 28 ක කාල පරිච්ඡේදයක් සඳහා පිළිවෙලින් රු.මිලියන 273 ක හා රු.මිලියන 126 ක වටිනාකම ඇති උපලේඛන ගත ණය අංක 9091971 හා අංක 90919189 ලබා දී තිබූ අතර, එය 2019 ජූලි 25 දින ලබා දුන් උපලේඛණ ගත ණය 3 ක් පියවීම සඳහා විය.<br>බැංකුව අවස්ථා කිහිපයකදී දඩ පොලිය හා උපචිත පොලිය ඉවත් කර ඇති බව නිරීක්ෂණය විය.<br>තවද, මෙම ණයදෙනුකරුවන්ගේ වයස ඉහළ අවදානමක් ඇති කරන බවත්, බැංකුව අනිකුත් ගනුදෙනුකරුවන්ට එසේ නොසලකන බවත්, ඔවුන්ට ලබා දී ඇති අවදානම ශ්‍රේණිගත කිරීම ඉහළ අවදානමක් බවත් සටහන් කළ යුතුය. | i. ණය කමිටුව 2023.04.23 දින පැවති එහි රැස්වීමේදී" නිවාස ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම පිණිස ණයකරු ව්‍යාපාර පුනරුද හා පුනරුත්ථාපන ඒකකයට (BRRU) මාරු කිරීමට අනුමැතිය ලබා දුනි. ඒ අනුව, ණය කමිටුව 2023.04.23 දින පැවති රැස්වීමේදී, නව පුනරුද පැකේජයක් අනුමත කර තිබෙන අතර අනුමැතිය | අයකිරීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

ගණුදෙනුකරුවන් CRIB වාර්තාවල අහිතකර ලෙස පැහැර හැර ඇති ණය කරුවන් හා ඇපකරුවන් ලෙස පෙනී යන නිසා බැංකුව CRIB වාර්තා වල බලපෑම නොසලකා හැර ඇත. තවද, ණය හිමිකම්වල අනුපාතය 94:06 ක් බැවින්, ණයකරු එකඟ වූ පරිදි හා අපේක්ෂා කළ පරිදි ප්‍රාග්ධන දායකත්වය ගෙන ඒමට අපොහොසත් වී ඇත.

උකස් දේපලෙහි වෙළඳපල වටිනාකමෙන් සියයට 173 ක අත්තිකාරම් අනුපාතයක් (ROA) බැංකුව විසින් ලබා දී ඇත්තේ ණය ලබාදීමේ වටිනාකම (Credit worthiness) සහ නැවත ගෙවීමේ හැකියාව ගැන සැලකීමකින් තොරව වේ. මෙම ගැටළුව 2023 අප්‍රේල් 26 දින ප්‍රධාන අවදානම් නිලධාරියා විසින්ද හඳුනාගෙන තිබුණි.

ප්‍රකාරව පහසුකම් ලබා දී පෙර උපලේඛණගත පහසුකම් පියවන ලදි. පසුව ණයකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තකු (PEP) ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා විය.

ii. ණය පහසුකම රු. මිලියන 52.0 ක් වුවත්, ණයකරු අදියර III ලෙස වර්ගීකරණය කරන අතර, ඒ අනුව ප්‍රතිපාදනය කර ඇත. තවද, 2023.09.30 දිනට හානිකරණ ප්‍රතිපාදනය රු. මිලියන 216.36 ක් වේ.

iii. අනුමත BRRU ප්‍රතිපත්තියට අනුව, දඩ පොලිය සියයට 100 ක් ම ඉවත් කිරීමට ව්‍යාපාර ඒකකවලට ඉඩ දෙනු ලැබේ. තවද, එකඟ වූ පරිදි පහසුකම් නැවත ගෙවීමට ණයකරු උනන්දු කරමින් ආන්තික ප්‍රතිලාභයෙන් සියයට 25 ක් ලෙස පහසුකම් නැවත උපලේඛණ ගත කරන විට තවත් පොලී සහන ලබා දී තිබුණි. මෙය විශේෂ සැලකීමක් නොවන අතර, පැහැරහරින ලද ණයකරුවන්ට මෙවැනි සහන බැංකුව පිරිනමනු ලැබේ.

iv.අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 60 ට වැඩි වුවද, දෙපලකට අදාල උකසක් මගින් පහසුකම් සුරක්ෂණය කර ඇත.

v.අනුමත BRRU ප්‍රතිපත්ති ප්‍රකාරව, CRIB හි අහිතකර ලෙස පෙනී යන ණයකරුවන් සඳහා අනුමැතීන් මත පහසුකම් ලබා දීමට පුළුවන.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| i | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන විධිවිධානවල 3(2) i විධාන | ලංකා බැංකු ආඥාපනත සහ ආයතනික පාලන විධානයන් ප්‍රකාරව, බැංකුව 2022 වර්ෂය තුළදී (2022 පෙබරවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා) අවම අධ්‍යක්ෂවරු 6 ක අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි. මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත්කරන බැවින් මෙය බැංකුවේ පාලනයෙන් තොර වේ. බැංකුව පුරප්පාඩු පිළිබඳව අමාත්‍යවරයා දැනුවත් කර ඇත. (ශ්‍රී ලංකා මහ බැංකුවේ මහ පෙන්වීම් අනුව, අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව ඉහළ දැමීමට ලංකා බැංකු පනතට අදාල සංශෝධන අමාත්‍යංශයට ලබා දී ඇත. නව රජයේ ආරම්භයත් සමඟ බොහෝ සංශෝධන, යෝජනා කරනු ලැබීමට ඇත. | ලංකා බැංකු ආඥාපනත සහ ආයතනික පාලන විධානයන්වල අවශ්‍යතාවයන් සමඟ අනුකූලවීමට නිර්දේශ කෙරේ. |
| ii | 2006 අංක 6 දරන මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත. | එකී රෙගුලාසියට අනුව, සියලුම ව්‍යාපාරික සම්බන්ධතා වලින් පාරිභෝගිකයකු හඳුනාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 13 දින රු.මිලියන 3 ක දඩයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා තිබුණි. | 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ, 2018 දී දේශීය නියාමකවරයෙකු විසින් නිකුත් කළ නම් කරන ලද පුද්ගලයකු ලෙස හඳුනාගත් විෂයගත පුද්ගලයා, බැංකුව විසින් 2013 වර්ෂයේදී සැලකිල්ලට ගත් (on-boarded) පුද්ගලයෙකි. කෙසේ වෙතත්, සංක්‍රමණ අදියරේදී, අලුත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පද්ධතියේ ජනිත කළ ඇඟවීම් (alerts) සංඛ්‍යාව විශාලවීමෙන්, නිර්මාණය වූ ඇඟවීම්වල කොටසක් හැසිරවීමට බැංකුවට නොහැකි විය. | අදාල රෙගුලාසියට අනුකූලවීම අවශ්‍ය වේ. |
| iii | 2023 මාර්තු 28 දිනැති අංක 001/2023 දරන කාර්යාල චක්‍රලේඛයේ සඳහන් දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් (PEPs) පිළිබඳ | දැනට පවතින PEP සම්බන්ධතා වාර්ෂිකව සහ ස්ථිතික දත්ත එකතුවක් (පාරිභෝගිකයා හඳුනාගැනීමේ ගොනුව- CIF) යටතේ සමාලෝචනය කළ යුතු අතර, ආකෘතියට අනුව, "DOC | වාර්ෂික පාරිභෝගික නිසි පරීක්ෂා (Customer Due Diligence - CDD) සමාලෝචනයක් පවත්වන ලෙසත් ඒ අනුව, පද්ධතිය යාවත්කාලීන කරන ලෙස දැනටමත් අදාල අධිකාරියට | කිසිඳු අපොහොසත් වීමකින් තොරව වාර්ෂිකව සමාලෝචනය කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගෝපදේශයේ 10.3 වගන්තිය | ACTIVITY DATE" යාවත්කාලීන කළ යුතුය. කෙසේ වෙතත්, නියැදි පරික්ෂාවේදී, බැංකුව, CIF අංක 17301998, 14427614, 18265658, 03836180, 150185268, 00312687 සහ 00312950 දරන ගණුදෙනුකරුවන් වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | උපදෙස් දී ඇත. | |
| iv | බැංකුවේ ප්‍රසම්පාදන අත් පොතේ (2014) 5.4.7.(b) වගන්තිය | බැංකුවේ ප්‍රසම්පාදන කමිටුව, පහත සඳහන් අවස්ථාවලදී අපේක්ෂිත අවසන් දිනයෙන් ඔබ්බට දින 28 ක වලංගු කාලයකට කාර්යය සාධන බැඳුම්කරය ලබා ගැනීමේ අවශ්‍යතාවය සමඟ අනුකූල වී නොතිබුණි.<br>-දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතිය සඳහා මාස 6 ක් පවතින උපදේශන ව්‍යාපෘතියට මාස 3 ක් සඳහා ලබා ගෙන ඇත.<br>-පළමු කාර්යය සාධන බැඳුම්කරය, දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම අවසන් දින සිට දින 18 කට වලංගු වේ. | ප්‍රසම්පාදන අත්පොත අනුව, කාර්යය සාධන ඇපකරය වැඩවල අපේක්ෂිත අවසන් දිනයෙන් ඔබ්බට දින 28 කට වලංගු විය යුතුය. එය උපදේශන සේවයක් බැවින්, කාර්යය සාධන ඇපකරය මාස 3 ක් සඳහා ලබා ගන්නා ලදි. | මාර්ගෝපදේශවලට අනුකූලවීම අවශ්‍ය වේ. |
| v | බැංකුවේ ප්‍රසම්පාදන අත් පොතේ (2014) 4.2.2 වගන්තිය | බැංකුවේ ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන කාල සටහන (PTS) සකස්කිරීමේ අවශ්‍යතාවය සමඟ අනුකූල වී නොමැත.<br>උදා- දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතිය හා දත්ත මධ්‍යස්ථාන යටිතල පහසුකම් ව්‍යාපෘතිය සඳහා උපදේශනය | සටහන් කර ගන්නා ලදි. ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කර ගොනුගත කර ඇත. | එක් එක් ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කිරීම අවශ්‍ය වේ. |
| vi | බැංකුවේ ප්‍රසම්පාදන අත් පොතේ (2014) 4.2.1 වගන්තිය (a,b,c සහ d) සහ ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් ප්‍රසිද්ධ කළ උපදේශකයන් තෝරා ගැනීම හා සේවා | බැංකුවේ ප්‍රසම්පාදන කමිටුව පහත අවශ්‍යතාවයන් සමඟ අනුකූල වී නොමැත.<br>-ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුම (MPP) පිළියෙල කිරීම<br>- අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු | ඉදිරි වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව අයවැය ප්‍රතිපාදන සිදු කරන ලදි.<br>සටහන් කර ගන්නා ලදි. මාර්ගෝපදේශ වලට අනුගත වීමට පියවර ගනුලැබේ. | මාර්ගෝපදේශ සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | නියුක්තිය සඳහා වන මාර්ගෝපදේශයේ 5.2.1. වගන්තිය. | - මීලහට එළඹෙන වර්ෂ සඳහා ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කිරීම<br>- මාස 6 ක් නොයික්මවන කාල පරතරවලදී MPP නිතිපතා යාවත්කාලීන කිරීම. | | |
| vii | බැංකුවේ බඳවාගැනීම් පටිපාටියේ 9.2.1.2 වගන්තිය | බැංකුවේ බඳවාගැනීමේ පටිපාටියේ (SOR) දක්වා ඇති ක්‍රියාපටිපාටි වලට විරුද්ධව විභාගයක් පැවැත්වීම හා සම්මුඛ පරීක්ෂණ නොපවත්වා කාර්ය මණ්ඩල සහායකයන් 4 දෙනෙකු ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය සඳහා පද්ධති විශ්ලේෂක වැඩසටහන්කරු ලෙස තෝරා ගෙන ඇත. | බැංකුවට බාහිර අයදුම්කරුවන් පත් කිරීමේදී SOR අදාල වේ. මෙම සේවා නියුක්තිකයන් 4 දෙනා තොරතුරු තාක්ෂණ අංශයට තාවකාලිකව මාරු කරන ලද අතර එය SOR මඟින් පාලනය නොවේ.<br>කෙසේ වෙතත්, බැංකු කාර්යමණ්ඩලයෙන් නව අයදුම්පත් කැඳවා ඇති අතර, විභාගයකින් හා ඊට පසු සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගනු ලැබේ. | අභ්‍යන්තර මාරු ප්‍රතිපත්තිය බැංකු හා බැංකු නොවන ධාරා අතර මාරු කිරීම් සඳහා අදාල නොවන බැවින් බැංකු නොවන කාර්ය මණ්ඩලය SOR සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |
| viii | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක SLFRS - 16 හි 22 වගන්තිය | 2022 වර්ෂය සඳහා කල්බදු ගිවිසුම් 71 ක් පාවිච්චියට අයිතිය ඇති වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | අපේක්ෂිත ගිවිසුම් සැකසීම හා ඉදිරිපත් කිරීම කඩිනම් කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත. | ප්‍රමිතියේ අවශ්‍යතාවයන් සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |

## 1.8. බදු රෙගුලාසි සමඟ අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) බැංකුවට නිකුත් කළ තක්සේරු වාර්තාව මඟින් රු. මිලියන 5,653.41 ප්‍රමාණයක ගෙවිය යුතු බද්දක් දක්වයි. කෙසේ වෙතත්, බැංකුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 1,500 ක ප්‍රතිපාදනයක් පමණක් කර තිබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ තක්සේරුව සහ බැංකුව අතර නොඑකඟතාවය අභියාචනා ක්‍රියාවලියේ පවතින හෙයින් ගෙවිය යුතු ඉතිරි ශේෂය වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් කර නොතිබුණි. | මූල්‍ය සේවා මත, එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා කාර්ය මණ්ඩල ණයවල සාධාරණ වටිනාකම ගැලපීමේ ප්‍රතිෂ්ඨාව සහ මිරේකා කැපිටල් ලෑන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් විකිණීම මත ප්‍රාග්ධන ලාභය පිළිබඳ නොඑකඟතාවය හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම තක්සේරු නිකුත් කර ඇත.<br>කාර්ය මණ්ඩල ණය මත සාධාරණ අගය සම්බන්ධ ආරවුල කර්මාන්තයේ සියළු සමාන ආයතනවලට අදාල වේ.<br><br>කෙසේ වෙතත්, බැංකුව, බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනය කිරීමේ ක්‍රියාපටිපාටියේ යෙදී සිටියි.<br>2019/2020 තක්සේරු වර්ෂය සඳහා 2022 දෙසැම්බර් 28 දින මූල්‍ය සේවා මත එකතු කළ | ගෙවීම පිළිබඳ අවදානමක් පවතී නම්, තක්සේරු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදනය කිරීම අවශ්‍ය වේ. |

අගය මත බදු වෙනුවෙන් නව තක්සේරුවක් නිකුත් කර තිබුණු අතර, එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු මුදල රු. මිලියන 858.72 සිට රු.මිලියන 189.15 දක්වා අඩු කර තිබුණි.
ඒ අනුව, මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු හා මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ මුළු බද්ද දඩ හැර රු.බිලියන 1.35 ක් වේ.
බදු වගකීම රු.බිලියන1.35 ක් වුවද, දඩ සැලකීමකින් තොරව මෙම තක්සේරු මත ගෙවිය යුතු අගයන් වෙනුවෙන් 2022.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල රු.බිලියන 1.5 ක ප්‍රතිපාදනයක් බැංකුව කර තිබුණි.
තවද, මිරේකා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් විකිණීමේ ගණුදෙනුව 2006 දේශීය ආදායම් පනතෙහි සිව්කොන (Four corners) තුළට නොවැටෙන ප්‍රාග්ධන ගණුදෙනුවක් වේ.
තවද, 2017/2018 තක්සේරු වර්ෂය වෙනුවෙන් බැංකුව හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතර කිසිදු ආරවුලක් නොමැත.

## 1.9 තොරතුරු තාක්ෂණ පොදු පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. ඇතැම් පරිශීලක ගිණුම් පෙළ (text), පැතිකඩ (profile) සහ නම පදනම් කරගෙන අනු පිටපත් හඳුනාගෙන තිබුණු අතර සංකලිත ප්‍රධාන බැංකු පද්ධතිය (ICBS), Smart Pay, Smart Remit සහ අන්තර්ජාල හා ජංගම බැංකු පද්ධතිවල ක්‍රියාකාරීව පැවතුණි. | **<u>Smart Pay හා Smart Remit</u>**<br>බොහෝ පරිශීලක පිවිසුම් විදේශීය ශාඛාවලට සම්බන්ධ කර ඇත.<br><br>**<u>ICBS සහ අන්තර්ජාල හා ජංගම බැංකු පද්ධති</u>**<br>හඳුනාගත් පරිශීලකයන් සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | නිශ්චිත කාල ඉලක්කයක් තුළදී සියලු අනු පිටපත් පිවිසුම් ඉවත් කිරීම සහ වංචා හා අවභාවිතයන් ඇති විය හැකි බැවින් අනාගතයේදී අනු පිටපත් නොකිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| ii. ඇතැම් පරිශීලකයන් මූල්‍ය කාලපරිච්ඡේදය තුළදී අදාල පද්ධතිවලට ප්‍රවේශ වී නොමැති බැවින්, Smart Remit, Trade Finance, Base 24, Palm Top, Finacle Treasury, Internet & Mobile Banking, Prime 4 සහ දත්ත කළමනාකරණ පද්ධතිවල (DMS) 2022 දෙසැම්බර් 31 දිනට භාවිතා නොකළ පරිශීලක ගිණුම් පැවතුණි. | **Smart Remit**<br><br>යෙදවුම් වැඩසටහන්කරණ අතුරු මුහුණත (Application Programming Interface | වංචා හා අවභාවිතයන් ඇති විය හැකි බැවින්, භාවිතා නොකළ පරිශීලක ගිණුම් |

| | |
|---|---|
| - API) පරිශීලකයන් පද්ධතියට ප්‍රවේශවීමට අවශ්‍ය නොවේ. ඒ වෙනුවට, පරිශීලකයන් ඔවුන්ගේ API Credentials භාවිතා කරමින් තමන්ව තහවුරු කිරීම අවශ්‍ය වේ. ශාඛාවල හා දෙපාර්තමේන්තුවල පරිශීලකයන් සඳහා පරිශීලකයන් පරිශීලක පැතිකඩක් (Profile) නිර්මාණය කිරීමට ඉල්ලා සිටි අතර පරිශීලක අවසන්කිරීම සඳහා ඉල්ලීමක් කර නොමැත.<br><br>**Finacle Treasury**<br><br>Finacle Treasury හි සියළු භාවිතා නොකළ පරිශීලක ගිණුම් අක්‍රීය කර 2023.06.08 දින අනුමත කර ඇත.<br><br>**Prime 4, Internet & Mobile Banking** සහ **DMS**<br>හඳුනාගත් ලැයිස්තුවක් සඳහා නිවැරදි කර ඇත.<br><br>**Base 24**<br>හඳුනාගත් ලැයිස්තුවක් සඳහා නිවැරදි කර ඇත. භාවිතා නොකළ පරිශීලක ගිණුම් නිතරම ඉවත් කිරීමට කටයුතු කර ඇත.<br><br>**Palm Top**<br>පද්ධතිය තුළ ක්‍රියාකාරී නොවන පරිශීලකයන් ස්වයංක්‍රීයව අක්‍රීය කිරීමට නව ක්‍රියාකාරිත්වයක් ක්‍රියාත්මක කර ඇත. | ඉවත් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

<table>
<tr><td></td><td>Trade Finance<br>නව විසඳුමක් ක්‍රියාත්මක කරන ලදි.</td><td></td></tr>
<tr><td>iii. පහත දැක්වෙන පරිදි, Trade Finance, Base 24, System 21, Smart Remit, Palm Top, Smart Pay සහ DMS යන පද්ධතිවල අර්ථ දක්වා ඇති යෙදවුම් මට්ටමේ මුරපද පරාමිතීන් සඳහා ප්‍රමාණවත් මුරපද පරාමිතීන් බැංකුව අර්ථදක්වා නොතිබුණි.
<table>
<tr><th>මුරපද පරාමිතිය</th><th>යෙදවුම</th><th>භාවිතාකළ තත්වය (Applied Setting)</th><th>භාවිතා වන පරිචය (Leading Practice)</th></tr>
<tr><td>මුරපදයක අවම දිග</td><td>Base 24</td><td>ලක්ෂ්‍ය 6</td><td>ලක්ෂ්‍ය 8</td></tr>
<tr><td></td><td>System 21</td><td>ලක්ෂ්‍ය 6</td><td></td></tr>
<tr><td></td><td>Palm Top</td><td>ලක්ෂ්‍ය 6</td><td></td></tr>
<tr><td></td><td>Smart Pay</td><td>ලක්ෂ්‍ය 6</td><td></td></tr>
<tr><td></td><td>DMS</td><td>උත්සාහයන් 15</td><td></td></tr>
<tr><td>අගුළු වීමට පෙර අසාර්ථක ප්‍රවේශවීම් සංඛ්‍යාව</td><td></td><td></td><td>උත්සාහයන් 3-5</td></tr>
</table></td><td>Base 24<br>නුදුරු අනාගතයේදී එය සම්පූර්ණ කරනු ඇත.<br>System 21<br>මුරපදයක දිග ලක්ෂය 6 කි. අවශ්‍ය දිගින් යුක්තව පරිශීලකයාට මුරපදය වෙනස් කළ හැකිය.<br>Palm Top<br>මෙය ද 8 දක්වා ඉහළ නංවා ඇත.<br>Smart Pay<br>අවම ලක්ෂයන් 8 දක්වා ඉහළ නංවනු ලැබේ.<br>DMS<br>අසාර්ථක ප්‍රවේශවීමේ වාර ගණන 5 ට සීමා කර ඇත.</td><td>යෙදවුම් මට්ටමේ ආරක්ෂක වින්‍යාසයක් සඳහා ප්‍රමාණවත් මුරපද පරාමිතීන් අර්ථ දැක්වීම අවශ්‍ය වේ.</td></tr>
<tr><td>iv. ඉල්ලා අස්වූ සේවකයන්ගේ ඇතැම් පරිශීලක ගිණුම් අක්‍රීය කර නොතිබූ අතර විගණන සමාලෝචනයේදී Finacle Treasury, Smart Pay, Smart Remit, Internet & Mobile Banking, Prime 4 සහ DMS යන පද්ධතිවල පරිශීලක ගිණුම් ඔවුන් ඉල්ලා අස්වූ දිනවලින් පසුව ක්‍රියාකාරීව පැවතුණි.</td><td>නව ක්‍රමවේදයක් බැංකුව තුළ ක්‍රියාවේ යොදවා ඇති අතර, එහිදී ඉල්ලා අස්වූ සේවකයන්ගේ මුරපද ඔවුන්ගේ ඉල්ලා අස්වීම් ලිපි ලැබීමෙන් පසු මකා දැමීමට/ අක්‍රීය කිරීම සඳහා අදාල සහකාර සාමාන්‍යාධිකාරි, ප්‍රධාන කළමණාකරුවන්ට, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට සහ අදාල දෙපාර්තමේන්තුවේ පද්ධති පාලකයන්ට මානව සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කරයි. එමඟින්, අදාල අංශවල අදාල යෙදවුම්</td><td>ඉල්ලා අස්වූ සේවකයන්ගේ පරිශීලක ගිණුම් ඔවුන් ඉල්ලා අස්වූ වහාම අක්‍රීය කිරීම අවශ්‍ය වේ.</td></tr>
</table>

| | | |
|---|---|---|
| | කළමනාකරුවන් හා පද්ධති පරිපාලකයන් ඉල්ලා අස් වූ සේවකයන්ගේ පරිශීලක පැතිකඩයන් කඩිනමින් මකා දැමීමට ක්‍රියාමාර්ග ගනු ලබයි. ප්‍රකාශිත සිදුවීම් පසුව නිවැරදි කර ඇත. | |
| v. ICBS,Trade Finance, Base 24, Palm Top, Smart Pay හා Smart Remit යන පද්ධතිවල ඇතැම් ඉල්ලා අස්වූ සේවකයන්ගේ පරිශීලක ගිණුම් අක්‍රීය කිරීමේ ක්‍රියාපටිපාටිවල සැලකිය යුතු ප්‍රමාදයක් පවතී. | **<u>ICBS</u>**<br>අනාගතයේදී ක්‍රියාවලිය විධිමත් කිරීමට සටහන් කර ගන්නා ලදි.<br><br>**<u>Trade Finance</u>**<br>අක්‍රීය කිරීමේ ක්‍රියාවලිය 2023 මාර්තු විධිමත් කරන ලදි.<br><br>**<u>Base 24</u>**<br>අනාගතයේදී ක්‍රියාවලිය විධිමත් කිරීමට සටහන් කර ගත් අතර, ප්‍රකාශිත පරිශීලක ගිණුම් (PF 122569) දැන් ඉවත් කර ඇත.<br><br>**Palm Top**<br>මානව සම්පත් අංශය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයකු ඉල්ලා අස්වූ විට හෝ සේවය නතර කළ විට දැනුම්දීම සඳහා Palm Top බැංකුකරන පද්ධතිය වැදගත් පද්ධතියක් ලෙස එකතු කරන ලදි.<br>සක්‍රීය නාමාවලිය (Active Directory) අක්‍රීය කළ විට, Palm Top පරිශීලකට පද්ධතියට ප්‍රවේශ විය නොහැක.<br><br>**Smart Pay**<br>අනාගතයේදී ක්‍රියාවලිය | වංචා හා අවභාවිතයන් ඇති විය හැකි බැවින් අක්‍රියකිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| | විධිමත් කිරීමට සටහන් කර ගන්නා ලදි.<br><br>**Smart Remit**<br>අපිට තහවුරු කිරීම් ලද පසු, සේවයෙන් ඉවත් වූ පරිශීලකයන්ව අක්‍රීය කිරීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| vi.<br>**(අ) Finacle Treasury හි වෙනස්කම් සංවර්ධනය**<br>අදාල වෙනස්කම් සංවර්ධනය සහ Finacle Treasury යෙදවුමේ කළ වෙනස්කම්වලට අදාල සජීවී සංක්‍රමණයන් (live migration) එකම නිලධාරියා විසින් කර තිබුණි. ඒ අනුව, විශ්වාසදායී අභ්‍යන්තර පාලනයක් ඇති කරන රාජකාරි බෙදා වෙන් කිරීමක් නිරීක්ෂණය නොවීය. | කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් එකම සාමාජිකයකු වෙනස්කම් කිරීමට සිදුවිය. කෙසේ වෙතත්, නව බඳවා ගැනීම් සමඟ මෙය විසඳෙනු ඇත. | විශ්වාසදායී අභ්‍යන්තර පාලනයක් ඇති කිරීමට රාජකාරි බෙදා වෙන්කිරීම අවශ්‍ය වේ. |

උදාහරණ-

| වෙනස්කමේ නම | සජීවී ක්‍රියාත්මක කළ දිනය |
|---|---|
| විනිමය අනුපාත චක්‍රලේඛයේ සඳහන් නව මුදල් වර්ගයක් -ඉන්දියානු රුපියල- Finacle Treasury පද්ධතියට එකතු කිරීම සහ එය ප්‍රධාන බැංකු පද්ධතියේ සැලකීමත් අනුපාත (cared rates) ප්‍රසිද්ධියට පත් කිරීම එකතු කිරීම | 2022.12.22 |
| Trade Finance නව පද්ධතියේ අවශ්‍යතාවය සැලකිල්ලට ගැනීමට විනිමය අනුපාත අතුරු මුහුණත වැඩිදියුණු කිරීම. | 2022.05.02 |

| | | |
|---|---|---|
| **(ආ) සේවා ගිවිසුම**<br><br>• 2022 දෙසැම්බර් 23 දින බැංකුව හා ඉන්ෆොමැටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර නඩත්තු ගිවිසුම අත්සන් කරන ලදි. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පද්ධතිය සම්බන්ධ ගිවිසුම 2022 දෙසැම්බර් 31 කල් ඉකුත් වී ඇත. තවද. බැංකුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ගිවිසුම ප්‍රකාරව, ගිවිසුම එය කල් පිරීමට දින 9 කට පෙර අත්සන් කර තිබුණු බව නිරීක්ෂණය විය .<br>• 2023 පෙබරවාරි 23 දින විද්‍යුත් පණිවිඩයක් හරහා ලද තහවුරුවට අනුව, Smart Remit යෙදවුම් සම්බන්ධ වාර්ෂික නඩත්තු ගිවිසුම (AMC) 2022 ජූලි 26 දින කල් ඉකුත් වී තිබෙන අතර, 2023 මැයි 19 විගණන දිනය වන විට එය යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය විය. | විකුණුම්කරු ඉහළ මිලක් ප්‍රකාශ කර ඇති බැවින් බැංකුවට උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනීමට විකුණුම්කරු විසින් ප්‍රකාශිත මිල අඩු කිරීම පිණිස සාකච්ඡා කිහිපයක් පවත්වන ලදි.<br><br>අභ්‍යන්තර සංචිත දෙපාර්තමේන්තුව 2021 දී Smart Remit පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ අතර, සජීවී පරිසරය තුළ පැරණි පද්ධතිය සජීවීව පැවති අතරම සංවර්ධනය කරනු ලැබිණ. | නියමිත වේලාවට සේවා ගිවිසුම් යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. |

2022.07.26 දින වන තුරු පැරණි Smart Remit අනුවාදය සඳහා වාර්ෂික නඩත්තු ගිවිසුම් ගෙවීම කළ අතර 2022 නොවැම්බර් පද්ධතිය ඉවත් කරන ලදි. තාක්ෂණ අංශය විකුණුම්කරු සමඟ සාකච්ඡා කළ අතර, පද්ධති දෙකම සඳහා වාර්ෂික නඩත්තු ගිවිසුම් ගෙවීම අවශ්‍ය නොවන බව දන්වා ඇත. එම නිසා, 2023.04.01 දින සිට Smart Remit දෙවන අනුවාදය(version 2) සඳහා බැංකුව වාර්ෂික නඩත්තු ගිවිසුම් ගෙවීම කර ඇත.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 32 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු. මිලියන 37.6 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 5.6 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචන වර්ෂයේදී රු.බිලියන 180.7 කින් හෙවත් සියයට 121 කින් පොලී වියදම වැඩිවීම මෙම අඩුවීම සඳහා ප්‍රධාන හේතුව විය.

**2.2. ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය**

**2.2.** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා, වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම/(අඩුවීම) රු.බිලියන | විචලනය ප්‍රතිශතය | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම | 195.75 | 75.1 | ඉකුත් වර්ෂය හා සසඳන විට, සමාලෝචිත වර්ෂයේදී ණය හා අත්තිකාරම් සහ ණය හා වෙනත් උපකරණවල පොලී අනුපාත ඉහළ යාම ප්‍රධාන වශයෙන්ම හේතුකොටගෙන, පොලී ආදායම ඉහළ ගොස් ඇත.<br>වර්ෂය තුළ ණය හා අත්තිකාරම් සියයට 3.7 කින් අඩු වූ අතර, ණය හා අත්තිකාරම් සඳහා වන පොලියේ සැලකිය යුතු ඉහළයාම හේතුවෙන් ණය හා අත්තිකාරම්වලින් ලැබෙන පොලී ආදායම සියයට 60.6 කින් වැඩි වී ඇත.<br>ණය හා අනෙකුත් උපකරණවල ශේෂය සියයට 43.8 කින් ඉහළ ගිය අතර, පොලී |

| | | | |
|---|---|---|---|
| | | | අනුපාත බලපෑම හේතුවෙන් ණය හා අනෙකුත් උපකරණවලින් ලැබෙන පොලී ආදායම සියයට 118.8 කින් වැඩි විය. |
| පොලී වියදම | 180.66 | 121.0 | වර්ෂය පුරා ඉහළ පොලී අනුපාත පැවතීම හේතුවෙන් පොලී වියදම ඉහළ ගොස් ඇත. බැංකුවේ තැන්පතු පදනම රු.බිලියන 467.9 කින් හෙවත් සියයට 16.3 කින් වැඩි වී තිබුණු අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී තැන්පතු මත පොලී වියදම සියයට 86.9 කින් ඉහළ ගොස් තිබුණි. |
| ණය හා වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු | 43.42 | 99.3 | අදියර II හා අදියර III ණය ප්‍රමාණය වැඩිවීම, රජයේ හා රජයට අයත් ව්‍යවසායන් (SOE) වල විදේශ මුදලින් නාමනය කරන ලද ණය හා වෙනත් ආයෝජන සඳහා කරන ලද ප්‍රතිපාදන, සංචාරක හා ඉදිකිරීම් වැනි අවදානම වැඩි කර්මාන්තවල හානිකරණ ප්‍රතිපාදන ඉහළ යාම, බැංකුවේ අදියර I ණය කළඹ ඉහළ යාම මත අදියර I හානිකරණ ප්‍රතිපාදන ඉහළ යාම ආදිය ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන හානිකරණ ගාස්තු වැඩිවී ඇත.<br>මූලික හේතුව වූයේ, රට “CC” කාණ්ඩයේ සිට “RD” කාණ්ඩයට පහළ හෙළීම වන අතර, එය ස්වෛරීත්ව බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර යන දෙකේම අලාභ අනුපාතය (Loss Rate) සියයට 0 සිට පිළිවෙලින් සියයට 40 සහ 12 දක්වා වැඩිවීමට බලපාන ලදි. |

## 2.3. අනුපාත විශ්ලේෂණය

පවතින තොරතුරු මත පදනම්ව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ බැංකුවේ සමහර වැදගත් අනුපාත, ශ්‍රී ලංකා මහබැංකුව විසින් ප්‍රකාශිත ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | ආංශික අනුපාත | බැංකුව 2022 | 2021 |
|---|---|---|---|
| **කාර්යය සාධන අනුපාත** | | | |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 10.5 | 14.1 | 21.0 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 1.0 | 0.8 | 1.3 |
| පොලී ආන්තිකය | 4.0 | 3.1 | 3.3 |
| **වත්කම් ගුණත්ව අනුපාත** | | | |
| දළ අක්‍රිය අත්තිකාරම් (NPL) | - | - | 5.1 |
| මුළු ණය හා අත්තිකාරම්වලට සාපේක්ෂව අදියර III ණය | 11.9 | 12.6 | - |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 8.5%) | 12.3 | 12.4 | 14.3 |
| මුළු ප්‍රාග්ධනය (අවම 14%) | 18.3 | 15.4 | 17.8 |
| **ව්‍යවස්ථාපිත අනුපාතය** (අවම අවශ්‍යතාවය සියයට 20කි) | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය) | 29.9 | 21.2 | 25 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | 2022 දෙසැම්බර් 31 දිනට, ව්‍යාජ චෙක්පත් හා වංචා ගිණුමේ රු.මිලියන 78.5 ක ශේෂයක් වාර්තා විය. මෙම ප්‍රතිපාදනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ 2022 නොවැම්බර් 11 දින මිය ගිය ගනුදෙනුකරුවකුට අයත් අංක 88380782 දරන ඉතිරි කිරීමේ ගිණුමෙන් රු.මිලියන 65 ක වංචා සහගත මුදල් ආපසු ගැනීමකි. අදාල ගිණුම කිහිපවරක්ම විමර්ශනය කර ඇති අතර එම විමර්ශනයන්ගෙන් බොහොමයක් පුද්ගලික ශාඛාවෙන් සිදු කර ඇත. මුදල් නිලධාරියාගේ මුරපදය භාවිතා කරමින් 2022 සැප්තැම්බර් 12 දින රු.මිලියන 95 ක මුදල් රඳවාතබා ඇති අතර සැකසහිත මුදල් ටෙලර්වරයකුගේ මුරපදයක් භාවිතා කරමින් නව පාස් පොතක් නිකුත් කර යාවත්කාලීන කර ඇත. පාස් පොත් සම්බන්ධ තොග පාලනයන්ගේ අඩපාඩු මෙම වංචා සහගත ක්‍රියාව සඳහා දායක වී තිබුණි. මුදල් ටෙලර්වරයෙක් (පුද්ගලික ලිපිගොනු අංක 219338) විසින් පුද්ගලික ශාඛාවේදී රු.මිලියන 65 ක මුදල් ආපසු ගැනීම සිදුවී ඇති අතර, මුදල් ලබාගැනීමේ පෝරමය A පංතියේ හෝ B පංතියේ අත්සන වෙත යොමු කර නොතිබුණි. මුදල් ටෙලර්වරයා ඔහුගේ මුරපදය සහ A පංතියේ නිලධාරියාගේ මුරපදය, අභිබවා යාම සඳහා භාවිතා කර ඇති අතර 116/2006 චක්‍රලේඛයේ අවශ්‍යතාවය පරිදි, මෙම මුදල් ආපසු ගැනීම මව් ශාඛාවට යොමු කිරීමට අපොහොසත් වී තිබුණි. මෙම සිදුවීමට මූලික හේතුව වූයේ මුරපද පාලනය වැනි මූලික පාලනයන් ඇතුළත් දක්වා ඇති ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම වේ. | පරිපූර්ණ ප්‍රතිපත්ති හා කාර්යාල උපදෙස් චක්‍රලේඛ ක්‍රියාවේ පවතී. මතු කරන ලද සිදුවීම සම්බන්ධ විමර්ශන සිදු කර ඇත. සමහර සිදුවීම්වලට රක්ෂණ හිමිකම් ලැබීමට නියමිතව ඇත. ශාඛා ජාලය තුළදී චක්‍රලේඛවලට අනුගතවීමේ නිවැරදිතාවය තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර පාලන නිලධාරීන් (ICO) ශාඛාවලට අදාල ගැටලු ඉස්මතු කිරීමට නවීන තොරතුරු තාක්ෂණ විසඳුමක සහාය ඇතිව යොදවා ඇති අතර පළාත් මෙහෙයුම් කළමනාකරුවන්ට අධීක්ෂණ යාන්ත්‍රණය භාරදී ඇත. | අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිවලට අනුගතවීම හා ඒවාට අනුකූලවීම අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. |
| ii | පොදු ලෙජර් ශේෂය හා බැංකුවේ වෙළඳ මූල්‍ය පද්ධතියේ හිඟ ශේෂය අතර රු.මිලියන 397.6 ක වෙනසක් ව්‍යාජ චෙක්පත් හා වංචා පිළිබඳ සංචිතයේ ගිණුමට (පොදු ලෙජර් අංක 22310122) අයකර ඇති අතර, 2021 වර්ෂය තුළදී මේ සම්බන්ධව සම්පූර්ණ ප්‍රතිපාදන කර ඇත. 2022 වර්ෂය අවසානය දක්වා එම ශේෂයන් සැසඳීමට පියවර ගෙන නොතිබුණි. | වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි, ප්‍රධාන අභ්‍යන්තර විගණක විමර්ශනයක් සිදුකර, ණය 845 කින් 615 ක් සසඳන ලද අතර, ප්‍රමාණවත් තොරතුරු නොමැති වීමෙන් ඉතිරි ණය 230 (හිඟ පොලිය රු.61,584,979.78 කි) සැසඳීමට නොහැකි බව නිරීක්ෂණය කර ඇත. එබැවින්, එම ණය පොදු ලෙජරය සමඟ | නොසැසඳූ ශේෂ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | | සැසඳීමට එකින් එකේ විස්තරාත්මක විශ්ලේෂණය, වෙළඳ සේවා විසින් ආරම්භ කර ඇත. | |
| iii | වංචා සහගත මුදල් ආපසු ගැනීම් හේතුවෙන්, ඉකුත් වර්ෂය සමඟ සසඳන විට 2022 වර්ෂයේදී හඳුනාගත් වංචාවල වටිනාකම රු.මිලියන 0.9 සිට රු.මිලියන 78.5 දක්වා රු.මිලියන 77.6 කින් වැඩි වී තිබුණි. | මතු කරන ලද සිදුවීම සම්බන්ධ විමර්ශන සිදු කර ඇත. ප්‍රතිපත්ති හා කාර්යාල උපදෙස් චක්‍රලේඛ ක්‍රියාත්මක වේ. පළාත් මෙහෙයුම් කළමනාකරුවන්ට අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය පවරා දෙන ලදි. | අභ්‍යන්තර පාලනයන්වලට දැඩිව අනුගතවීම හා සමීප අධීක්ෂණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම අවශ්‍ය වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.2.1 | බැංකුව සහ ලංකා බැංකු සේවක සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම මඟින්, සේවකයන්ගේ ආදායම් බදු වගකීම සේවකයන්ගේ වැටුපෙන් අඩු නොකර බැංකුව මඟින් ගෙවීමට නියම කර ඇත. එය පදනම් කරගෙන 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සේවකයන් වෙනුවෙන් උපයනවිට ගෙවීම් බදු ලෙස සේවක ඉපයීම්වලින් අඩුකිරීමකින් තොරව රු.මිලියන 182.91 ක් බැංකුව ගෙවා තිබුණි. | බැංකුව සහ ලංකා බැංකු සේවක සංගමය (CBEU) අතර ඇති සාමූහික ගිවිසුමේ 7 වන වගන්තිය ප්‍රකාරව, කාර්යය මණ්ඩල වැටුප් මත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) බැංකුව විසින් දැරිය යුතුය. 2023.01.01 දින සිට කාර්ය මණ්ඩලයෙන් අඩු කරනු ලැබේ. | කාර්ය මණ්ඩලය විසින් දැරීම අවශ්‍ය වේ. |
| 3.2.2 | විගණිත දිනය වන 2023 ඔක්තෝබර් 4 වන විට, බැංකුවේ හරපත් තොගයේ (VISA සහ Master Card) සැලකිය යුතු හිඟයක් පැවතුණු අතර ඒ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ. | | පාරිභෝගික අවශ්‍යතා කිසිදු අපොහොසත්වීමකින් තොරව ඉටු කිරීම පිණිස කාඩ්පත් තොගය සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| | i.බැංකුව, 2021 අප්‍රේල් 21 දින ප්‍රසම්පාදන අංක P/PROC/2020/129 යටතේ Sharon Solutions Limited වෙතින් මිලියන 1 ක හරපත් ඇණවුම් කර ඇත. 2021 අගොස්තු 12 දින විද්‍යුත් බැංකු මධ්‍යස්ථානය වෙත හරපත් 75,000 ක් ලැබුණු පසු ප්‍රසම්පාදනය දිගටම කරගෙන යාම අත්හිටුවන ලදි. | සිහි කැඳවීම් කිහිපයක් කර තිබියදීත්, සැපයුම්කරු බෙදාහැරීමේ කාල සටහන පරිදි කාඩ්පත් ලබා දී නොතිබුණි. ලබා දුන් කාඩ්පත් සඳහා පමණක් ගෙවීම් සිදුකර ඇත. | |

| | | |
|---|---|---|
| ii. 2022 ජූලි 7 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 6.1 ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය හරපත් මිලියන 2 ක් මිලදී ගැනීමට අනුමැතිය දී ඇති අතර, ඒ අනුව ප්‍රසම්පාදනය ආරම්භ කර ඇත. පසුව, 2023 පෙබරවාරි 14 දින අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 6.4 ප්‍රකාරව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සකස් කරන ලද ලංසු තැබීමේ ලේඛනවල අඩුපාඩු නිසා තරඟකාරීත්වය සීමාවීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදන අවලංගු කර තිබුණි. මූලික බැංකු අවශ්‍යතා සම්බන්ධව තීරණයක් ගැනීමට බැංකුව මාස 10 කට ආසන්නව වැය කර තිබූ අතර මේ වෙනුවෙන් රු.මිලියන 0.5 ක් දරා තිබුණි. | සටහන් කර ගන්නා ලදි. | |
| iii.2023 පෙබරවාරි 14 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 6.2 ප්‍රකාරව, වෙනස් සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් හරපත් 900,000 ක තොගයක් මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ප්‍රසම්පාදන නිර්ණායක හා ප්‍රසම්පාදන කොන්දේසිවලට අනුව, මිල, රක්ෂණ, ගැල්කුලී (CIF) මිල මත, මිල පදනම්වන අතර බැංකුව රේගුවෙන් තොගය නිදහස් කර ගත යුතුය. දැනට බැංකුව සතුව ශූන්‍ය කාඩ්පත් තොගයක් පවත්වාගෙන යන අතර පුරුද්දක් ලෙස හරපත් 200,000-250,000 ක ආරක්ෂිත තොගයක් පවත්වා ගැනීම  අවශ්‍ය වේ. බැංකුව ඒ සම්බන්ධව අවදානය යොමුකර නොමැති බවත්, ඒ අනුව ක්‍රියාකර නැති බවත් නිරීක්ෂණය විය. මෙය බැංකුවේ ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම මත ඔවුන්ට හරපත් නිකුත් කිරීමට නොහැකිවීමෙන් ඔවුන්ගේ නොසතුටට හා බැංකුවේ නාමය පිළිබඳ කීර්තිනාමයට සෘජුවම බලපානු ලැබේ. | නිසි ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි පිළිපැදීමෙන් පසු, තෝරාගත් ලංසුකරු මාස්ටර් ඩී අයි කාඩ්පත් 300,000 ක් 2023.10.18 දින විද්‍යුත් බැංකු අංශයට ලබා දී ඇති අතර 2023.11.03 දින VISA ඩීඅයි කාඩ්පත් 250,000 ක් ලබාදී තිබේ. තවද, තවත් VISA කාඩ්පත් 350,000 ක ප්‍රමාණයක් දෙසැම්බර් මාසය තුළ ලබාදෙනු ඇත.<br>හරපත් අඛණ්ඩව සහ බාධාවකින් තොරව සැපයීම සඳහා බැංකුව ලංසු කිහිපයක් සම්පූර්ණ කර ඇත. තවද, මේ වන විට තවත් හරපත් 500,000 ප්‍රමාණයකට ලංසු ලබා දී තිබුණි. | |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.3.1 | <u>දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතිය</u><br>බැංකුවේ පරිගණක අංශය 1981 වර්ෂයේ ස්ථාපිත කළ අතර 1985 වර්ෂයේදී සම්පූර්ණ සැළසුම් කළ දත්ත මධ්‍යස්ථානය (පරිගණක කාමරය) ඇති කරන ලදි. තොරතුරු තාක්ෂණ නිෂ්පාදන හා සේවා හඳුන්වාදීමත් සමඟ බැංකුව දිගුකාලීනව පෙළුණු අවශ්‍යතාවය සැපිරීම පිණිස “දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතිය”, දත්ත මධ්‍යස්ථාන නවීකරණය සඳහා උපදේශන සේවා, දත්ත මධ්‍යස්ථාන යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සහ විදුලිය හා සිසිලන පද්ධතිය ස්ථාපිත කිරීම යන ප්‍රධාන | | |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන 3 ක් සිදු කරන ලදි. පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| i. දත්ත මධ්‍යස්ථාන නවීකරණය සඳහා උපදේශන සේවා<br>දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතියේ උපදේශක ලෙස පවර් ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් තෝරා ගත් අතර, 2016 සැප්තැම්බර් 9 දින උපදේශකයක් තෝරා ගැනීම සඳහා පළමු පුවත්පත් දැන්වීම පළ කරන ලද අතර, 2016 සැප්තැම්බර් 28 දින දෙවන පුවත්පත් දැන්වීම රු.මිලියන 0.15 ක අතිරේක පිරිවැයක් දරමින් පළ කරන ලදි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා බැංකුව සහ පවර් ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ අත්සන් කරන ලද කිසිදු ගිවිසුම්ගත එකඟතාවයක් නොතිබුණු අතර මිලදී ගැනීමේ ඇණවුම ගිවිසුම්ගත එකඟතාවය ලෙස භාවිතා කරනු ලැබේ. බැංකුව සහ පවර් ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර අත්සන් කළ කාර්යයසාධන බැඳුම්කරය 2017 දෙසැම්බර් 31 දින කල් ඉකුත් වී ඇති අතර, 2022 දෙසැම්බර් 31 වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත්, බැඳුම්කරය කල් ඉකුත්වීමෙන් පසුව ද, 2019 අගෝස්තු 26 දින රු.මිලියන 0.83 ක ගෙවීමක් කර තිබුණි. | 2016.09.09 දින පුවත්පත් දැන්වීම පළ කළ අතර 2016.09.30 දින මූලික ලංසු විවෘතකිරීමේ දිනය විය. කෙසේ වෙතත්, 2016.09.22 දින පැවති පූර්ව ලංසු රැස්වීමේදී, ලංසු ලේඛන එකතු කරගත් අපේක්ෂිත ලංසුකරුවන්, ලංසු තැබීම සඳහා දෙන ලද කාලය ප්‍රමාණවත් නොවන නිසා කාලය දිගු කිරීමක් ඉල්ලන ලදි. පසුව, ලංසු අවසන් කිරීම හා විවෘත කිරීම දිගු කිරීමට විධායක ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. මිලදී ගැනීම් ඇණවුමේ ගෙවීම් කොන්දේසියක් ලෙස, “නව දත්ත මධ්‍යස්ථාන සැළසුම සහ යෝජනා සඳහා ටෙන්ඩර්කරන ක්‍රියාවලිය වෙනුවෙන් යෝජනා සඳහා ඉල්ලීම් කිරීම සම්පූර්ණ කිරීම මත උපදේශන ගාස්තුවෙන් සියයට 40 ක් ගෙවනු ලැබේ” යන්න දක්වා තිබුණි. සැළසුම සහ යෝජනා සඳහා ටෙන්ඩකරන ක්‍රියාවලිය අවසන් කර තිබූ නිසා ගෙවීම් කරන ලදි. මිලදී ගැණුම් ඇණවුම ගිවිසුම්ගත එකඟතාවයක් ලෙස | අඩුම තරමේ මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද පිරිවැය වෙනුවෙන් වටිනාකමක් ගැනීමට, UAT අත්සන් කිරීම (UAT sign off) හා අවශ්‍ය යාවත්කාලීන කිරීම් ලබා ගැනීම අවශ්‍ය වේ. |

ii. දත්ත මධ්‍යස්ථාන යටිතල පහසුකම් ස්ථාපිත කිරීම

දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් ස්ථාපිත කිරීම වෙනුවෙන් වී.එස්. ඉන්ෆොමේෂන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් තෝරා ගන්නා ලද අතර, දත්ත මධ්‍යස්ථාන යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාක්කරු තෝරාගැනීම සඳහා වසර දෙකකට වඩා වැඩි කාලයක් ගත වී තිබීම හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාදයන් හඳුනා ගන්නා ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා බැංකුව හා පවර් ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර අත්සන් කරන ලද කිසිදු කොන්ත්‍රාක් ගිවිසුමක් නොපැවතුණු අතර මිලදී ගැණුම් ඇණුවම කොන්ත්‍රාක් ගිවිසුම ලෙස භාවිතා කරයි. සර්වර් සංක්‍රමණ සැළැස්ම තවම පිළියෙල කර නොමැති අතර කළ යුතු සර්වර් සංක්‍රමණ ක්‍රියාවලිය හා වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට නොහැකි වේ.

බැංකුව දැනටමත් සර්වර් සංක්‍රමණ ගාස්තු ලෙස රු.මිලියන 5.9 ක් කොන්ත්‍රාක්කරුට ගෙවා ගෙවීම් සංදිස්ථානයේ ඇතුළත් කළ ද, සැපයුම්කරු (vendor) විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා ඉල්ලීම (RFP) තුළ හා ද්‍රව්‍ය බිල තුළ සර්වර් සංක්‍රමණය පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණි. බැංකුව, වී.එස්. ඉන්ෆොමේෂන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ට එකතුව රු.මිලියන 87.54 ක් මුදලක් උපදේශකවරයකුගේ ඊමේල් කැමැත්තක් මත ගෙවා තිබූ අතර එහි සම්පූර්ණ කරන ලද වැඩ, ගුණත්ව මට්ටම හා ප්‍රමාණය තහවුරු කරන කිසිදු වාර්තාවක් නොතිබුණි.

දත්ත මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, තොරතුරු තාක්ෂණ සහ විදුලි සිසිල්කරණය ලෙස ටෙන්ඩර් දෙකකට වෙන්කිරීමට බැංකුව තීරණය කළ ද, මේ දෙකම ස්වාධීන නිසාවෙන් අවසන් පරිශීලක පිළිගැනීම් පරීක්ෂාවට උපදේශක විසින් අත්සන් කිරීමට පෙර මෙම දෙකම එකට ගොස් සම්පූර්ණයෙන් ම නිම කළ යුතු බව උපදේශකවරයා අදහස් දක්වා තිබුණි. කෙසේ වෙතත්, උපදේශකවරයා 2020 අගෝස්තු 10 දින ඔවුන්ගේ ඊමේල් පණිවිඩයකින්, ව්‍යාපෘතියේ විද්‍යුත් සිසිල්කරණ කොටස වසර දෙකක කාලයක් ප්‍රමාදකිරීම පිළිබඳව ඔවුන්ගේ නොඑකඟතාවය සහ මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යාමට ඇති බාධා ප්‍රකාශ කරමින් පැමිණිලි කර තිබුණි.

කොන්ත්‍රාක්තුවේ කොන්දේසි අංක 10 (ඇපවීම් සහ වගකීම්) ප්‍රකාරව, බැංකු පරිශ්‍රය තුළ කොන්ත්‍රාක්තුව ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරු/නියෝජිතයාය නිරාවරණය වන බැංකුවේ දේපලවලට වන හානිය සම්බන්ධ වන්දි රක්ෂණ ඔප්පුවක් බැංකුව ලබාගෙන

ක්‍රියාකරන අතර බැංකුව වෙනම ගිවිසුමක් අත්සන් කර නොමැත.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් හඳුනාගත් පරිදි, බලය සහ සිසිලන අවශ්‍යතාවය දත්ත මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ අඩංගු වේ. ලංසු ලේඛනය සකසා නිම කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වීම් කිහිපයක් පවත්වන ලදි. තාක්ෂණික අවශ්‍යතාවයන් සංවර්ධනය කිරීමේ අවසාන අදියරේදී තොරතුරු තාක්ෂණ ප්‍රධානියාගේ සහ සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ (Integrated risk management committee) නිර්දේශය මත ප්‍රොපටි ඩිවොලොප්මන්ට් පීඑල්සී (PDL) වෙත, බලය හා සිසිලනකරණයට සම්බන්ධ කාර්යයන් බාරදීමට 2018.03.08 දින අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ අනුමැතිය ලබා දුන් අතර, එම සමාගම ඉඩමේ හිමිකරු ලෙස ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සමස්ත බලය හා සිසිලනකරණයට අදාල කාර්යයන්

නොතිබුණි. යෝජනා සඳහා ඉල්ලුම් කිරීමේ අවශ්‍යතා ප්‍රකාරව, වගකීම් කාලසීමාව වසර දෙකක් ලෙස නිර්වචනය කර ඇති නිසා නව දත්ත මධ්‍යස්ථානයේ Server Racks, Novec පදනම් ගිනි මර්දනය කිරීමේ පද්ධතිය (Novec based fire suppression system), IP කැමරා පද්ධතිය, ජාල වීඩියෝ රෙකෝඩරය (Network vedio recorder) වගකීම් කාල සීමාව ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙර කල් ඉකුත්වී තිබුණි. තවද, මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කාල රාමුව සමඟ සැසඳීමේදී උපදේශකවරයාගේ සේවය ගැනීමෙන් පසු පහත සඳහන් සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය

| **ලංසු ක්‍රියාවලි අදියර** | **ප්‍රසම්පාදන කාල සටහන අනුව නියමිත දිනය** | **සත්‍ය දින** | **ප්‍රමාද කාලය** |
|---|---|---|---|
| ලංසු ඇගයීම | 2018.08.06 | 2019.04.01 | මාස 7 ක් හා දින 26 |
| ඇගයීම් වාර්තාව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය | 2018.08.08 | 2019.05.09 | මාස 9 ක් හා දින 6 |
| ඇගයීම් වාර්තාව සඳහා අනුමැතිය (ප්‍රසම්පාදන කමිටුව) | 2018.08.13 | 2019.05.14 | මාස 9 ක් හා දින 1 |
| අවසාන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය | 2018.08.17 | 2019.06.04 | මාස 9 ක් හා දින 18 |

සියල්ල මෙහෙයවනු ලබයි.

ඒ අනුව, ප්‍රසම්පාදනය, ප්‍රසම්පාදන දෙකකට බෙදා වෙන් කළ අතර, බලය සහ සිසිලනකරණය ප්‍රොපටි ඩිවොලොප්මන්ට් පීඑල්සී විසින් මෙහෙයවන ලදි. සංශෝධිත යෝජනා සඳහා ඉල්ලීම (RFP) සඳහා ලංසු 2018.10.29 දින කැඳවන ලද අතර 2018.12.10 දින ලංසු අවසන් කරන ලදි. ඉන් පසුව, කොන්ත්‍රාක්කරු තෝරාගැනීම පිණිස ලංසුකරුවන් කෙටි ලැයිස්තුවකට දැමීමට පෙර විසඳුම් ඉදිරිපත් කිරීමේ තාක්ෂණික ඇගයීම් කමිටු කිහිපයක් පවත්වන ලදි. වී.එස්. ඉන්ෆොමේෂන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රතිග්‍රහණ ලිපිය භාරගැනීමෙන් පසුව, මිලදී ගැණුම් ඇණවුම නිකුත් කරන ලදි. මිලදී ගැණුම් ඇණවුම ගිවිසුම්ගත එකඟතාවයක් ලෙස ක්‍රියා කරයි. අදාල සර්වර් දෘඩාංග වෙළෙන්දන් විසින් සංක්‍රමණ (migration) ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි. බැංකුවේ තොරතුරු තාක්ෂණ අංශය දත්ත

මධ්‍යස්ථාන සහ ජාල ඒකකයන් විසින් සර්වර් සංක්‍රමණ සැළසුම පිළියෙල කිරීම සම්පූර්ණ කර ඇත.
සර්වර් සංක්‍රමණ සහ සිසිල්කරණ හා බල අවශ්‍යතාවය, ප්‍රොපටී ඩිවොලොප්මන්ට් පීඑල්සී විසින් පවත්වන ලද වෙනම ලංසු තැබීමේ ක්‍රියාවලියකදී තෝරා ගන්නා ලද විවිධ සේවා සපයන්නා /සපයන්නන්ගේ වගකීමක් විය.
බලය හා සිසිල්කරණය සැපයීමේ ප්‍රමාදය (වසංගත තත්වය සහ සංචරණ සීමාකිරීම්) හේතුවෙන් දත්ත සංක්‍රමණ ක්‍රියාවලිය ප්‍රමාද විය. එබැවින් කොන්ත්‍රක්කරුගේ (වී.එස්. ඉන්ෆොමේෂන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්) ඉල්ලීම මත රු.මිලියන 5.9 ක ආංශික ගෙවීමක්, කරන ලද වැඩ මත පදනම්ව සලකා බලන ලදි.
සර්වර් සංක්‍රමණය සිව්වැනි ගෙවීමේ සන්දිස්ථානය ලෙස හඳුනා ගත්තද, සර්වර් සංක්‍රමණයට අදාල පිරිවැය ලංසුවේ තාක්ෂණික පිරිවිතරයන් තුළ අන්තර්ගත නොමැති බැවින් එය ඉහත ගෙවීම තුළ ඇතුළත් නොවීය. තවද, සර්වර්

සංක්‍රමණය අඥඩාංග සේවා සපයන්නාගේ වගකීම වේ. තවද, උපදේශකවරයා 2018.10.08 දින ඔහුගේ ඊමේල් පණිවිඩයක් මඟින් සන්දිස්ථාන ගෙවීම නිදහස් කිරීමට ඔහුගේ අනුමැතිය ලබාදී තිබුණි. කොන්ත්‍රක්තරු යටිතල පහසුකම් ස්ථාපනය කිරීම සම්පූර්ණ කර ඇති නිසා සම්පූර්ණ කරන ලද වැඩ වෙනුවෙන් වාරික 5 කින් රු.මිලියන 87.5 ක වටිනාකමක ගෙවීම් කරන ලදි. පළමු සියයට 10 ගෙවීම අත්තිකාරම් ගෙවීමක් වන අතර එය අත්තිකාරම් ගෙවීම් ඇපකරයක් ඉදිරිපත් කිරීම මත පදනම් වේ. දෙවන ගෙවීම, බැංකුවට ආනයනය කළ යුතු සියලු අයිතම බාරදීම මත සිදුවේ. තවද, උපදේශකවරයාගේ සමාගමේ නියෝජිතයන් වන පවර් ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් බෙදා හැරීමට අනුව කලින් කලට බෙදා හරින ලද භාණ්ඩ පරීක්ෂා කර ඇත. කෙසේ වෙතත්, අඛණ්ඩ සන්දිස්ථාන ගෙවීම් උපදේශක විසින් ලබාදෙන කැමැත්ත පරිදි සිදු කර ඇති අතර ව්‍යාපෘතිය අවසන්

කිරීම උපදේශක අත්සන්කිරීමකට (signed off) යටත් සිදු වේ.
බැංකුවට සමහර සේවා (විදුලිය, ජාලකරණය, සිසිල්කරණය ආදි) ප්‍රොපටි ඩිවොලොප්මන්ට් පීඑල්සී හරහා ලබා ගැනීමට සිදු විය. එබැවින්, ලංසුව කොටස් දෙකකට බෙදන ලදි. සඳහන් කළ පරිදි, සංවරණය හා කෝවිඩ් - 19 වසංගතයේ සීමාවන් සහ රටේ මූල්‍ය තත්වය හේතුවෙන් ලංසු ක්‍රියාවලිය සහ ප්‍රොපටි ඩිවොලොප්මන්ට් පීඑල්සී විසින් අවශ්‍ය උපකරන ආනයනය ප්‍රමාද විය. දැනටමත් භාවිතා කරන්නා පිළිගැනීම පරීක්ෂා කිරීම (User Acceptance Testing - UAT) හැර ඉහත කාර්ය සම්පූර්ණ කර ඇත. උපදේශකට, අත්සන්කිරීම සම්පූර්ණ කළ හැකි දිනය දන්වමින් ඔහුගේ ප්‍රතිචාරය ඉදිරිපත් කිරීමට අවසාන දිනයක් (2023.08.11) ලබා දී ඇත.
2018.12.10 දින ලංසු විවෘත කරන ලද අතර 2019.04.01 දින ලංසු ඇගයීම අවසන් කර ඇත. ඒ අනුව, මාස 4 ක් පමණ

| | |
|---|---|
| | ලංසුකරුවන් 6 දෙනාගේ විසඳුම් ඉදිරිපත් කිරීම ඇතුළත් ඇගයීම සඳහා ගෙන තිබුණි. කෙසේ වෙතත්, පිරිවිතරයන් අවසන් කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් කිහිපයක් පවත්වා ඇත. බලය සහ සිසිල්කරණයට අදාල කටයුතු ප්‍රොපටි ඩිවොලොප්මන්ට් පීඑල්සී වෙතට ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ අනුමැතිය 2018.03.08 දින ලබා දී ඇත. 2018.05.23 දින සංශෝධිත යෝජනා සඳහා ඉල්ලීම් ලැබුණු නමුත්, ව්‍යාපෘතියේ සංකීර්ණත්වය හේතුවෙන් කලින් කලට වෙනස් කිරීම් කරමින් සිටියි. අවසානයේ 2018.10.29 දින ලංසු කැඳවීමට හැකි වූ අතර 2018.12.10 දින ලංසු අවසන් කරන ලදි. |
| iii. බැංකුව වසර 6 කට පෙර විදුලිය හා සිසිල්කරණ පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් ප්‍රොපටි ඩිවොලොප්මන්ට් පීඑල්සී විසින් දරන ලද පිරිවැයට අමතරව, රු.මිලියන 98.82 ක මූල්‍ය පිරිවැයක් දරා තිබුණ ද, මෙම ව්‍යාපෘතිය තවමත් සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘතිය අවසන් කිරීම උපදේශකගේ අත්සන් කිරීම (sign off) මත විෂය ගත වේ. උපදේශක දෙන ලද ලිපිනයෙහි නොසිටින නිසා ඔහු ඍජුව සම්බන්ධ කර ගැනීමට නොහැකි විය. උපදේශකට sign off කිරීම සම්පූර්ණ කිරීමට හැකි, ඔහුගේ ප්‍රතිචාර |

| | | | |
|---|---|---|---|
| | | ලබාදීමට අවසාන දිනයක් (2023.08.11) ලබා දෙන ලදි. උපදේශකවරයා දෙන ලද දිනයට ප්‍රතිචාර නොදැක් වූ නිසා VSIS හි උපදේශන සේවාවන් අවලංගු කිරීමට හා නව උපදේශකවරයා පත්කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදි. | |
| | iv. තවද, මෙම ව්‍යාපෘතිය ප්‍රසම්පාදනයට පෙර බැංකු නිලධාරීන් දෙදෙනෙකුට විදේශ පුහුණුව සඳහා රු.මිලියන 2.98 ක් බැංකුව වැයකර තිබුණු අතර, එම නිලධාරීන් දෙදෙනා ව්‍යාපෘතිය අවසන්වීමට පෙර 2018 සැප්තැම්බර් 10 දින (PF073980) සහ 2018 මැයි 31 (PF133421 විශ්‍රාම ගොස් තිබුණි. | පුහුණු වැඩසටහන සම්පූර්ණයෙන් ම දත්ත මධ්‍යස්ථාන සැළසුම්කිරීම මත වන අතර එබැවින්, දත්ත මධ්‍යස්ථානයේ පළපුරුද්ද මත පදනම්ව තෝරාගත් නිලධාරීන් පුහුණුව ලබාගෙන තාක්ෂණික පිරිවිතරයන් සකස් කිරීමට හා යටිතල පහසුකම් සැළසුම් කිරීමට දායක විය. තවද, ව්‍යාපෘති කණ්ඩායම අතර දැනුම බෙදාගැනීමේ සැසිවාර ද පවත්වන ලදි. | |
| 3.3.2 | **වාහන සංචිත කළමනාකරණය**<br>බැංකුවේ වාහාන සඳහා නැවිගේෂන් පද්ධතියක් (GPS පද්ධතිය) ඩයලොග් ඇක්සියාටා පීඑල්සී වෙතින් 2019 හා 2020 වර්ෂවල රු.මිලියන 6.65 ක් වැයකර මිලදී ගෙන තිබුණු අතර, එම පද්ධතිය දැන් භාවිතා නොවේ. තවද, පද්ධතිය වැඩිදියුණු කර මිලදී ගත් කාර්යය සඳහා භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි.<br>පවතින පද්ධතිය වැඩි දියුණු කිරීමට සේවය සපයන්නා සමඟ සාකච්ඡා කරමින් සිටියි. | මිලදී ගත් අරමුණ සඳහා භාවිතා කිරීමට පවතින පද්ධතිය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. |
| 3.3.3 | **අක්‍රීය කාර්යය මණ්ඩල ණය**<br>2023 අප්‍රේල් 30 දිනට අක්‍රීය කාර්යය මණ්ඩල ණයවල මුළු හිඟ ශේෂය රු.මිලියන 248.6 ක් විය. වයස් විශ්ලේෂණය අනුව, රු.මිලියන 28.7 ක, රු.මිලියන 54.9 ක සහ රු.මිලියන 165 ක කාර්යය මණ්ඩල ණය ශේෂයන් පිළිවෙලින් වසරකට අඩු, වසර 1-2 දක්වා, වසර 2 ට වැඩි කාලයක් පුරා අයකර | හඳුනාගත් අක්‍රීය ශේෂය තුළ වැඩ තහනම් වූ, සේවයෙන් ඉවත් වූ, සේවය හැර ගිය, බැංකු සේවයෙන් | අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීම අවශ්‍ය වේ. |

ගැනීමකින් තොරව හිඟව පැවතුණි.

ඉවත් කළ හා මිය ගිය කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ හිඟ ණය ශේෂය ඇතුළත් වේ.

**ගන්නා ලද ක්‍රියාමාර්ග**

**වැඩ තහනම් වූ සේවකයන් -** ඔවුන්ගේ විනය කටයුතු අවසන් වන තෙක් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කළ නොහැක.

**ඉවත් වූ, සේවයෙන් හැර ගිය, සේවයෙන් පහකළ සේවකයන්-** අයකර ගැනීමේ විකල්පය ආරම්භ කර ඇත. සේවයෙන් ඉවත් වූ හා සේවයෙන් හැර ගිය කාර්යය මණ්ඩලයට, ගෙවිය යුතු මුදල් පියවන ලෙස දැනුවත් කර ඇත.

**මිය ගිය-** පියවන ලෙස පවුලේ සාමාජිකයන්ව දැනුවත් කර ඇති අතර නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට නියමිත වේ.

3.3.4 2018 සිට 2022 දක්වා ලියා හරින ලද ශේෂයන් හා ලියා හරින ශේෂයන්ගෙන් අයකර ගැනීම් පිළිබඳ විශ්ලේෂණයක් පහත පරිදි වේ.

| **වර්ෂය** | **ලියා හරින ලද වටිනාකම (රු.මිලියන)** | **අයකර ගත් වටිනාකම (රු.මිලියන)** | **අයකර ගත් වටිනාකමේ ප්‍රතිශතය (%)** |
|---|---|---|---|
| 2018 | 35.5 | 47.65 | 134 |
| 2019 | 710.30 | 36.50 | 5 |
| 2020 | 5.63 | 57.03 | 1,012 |
| 2021 | 73.73 | 1.66 | 2 |
| 2022 | 13.61 | 0.65 | 5 |
| **එකතු** | **838.77** | **143.48** | **17** |

බැංකුව, බැංකුවේ ලියා හැරීමේ ප්‍රතිපත්ති අනුගමනය කරමින් පහසුකම් කපාහැරීම සඳහා නිර්දේශ කරන අතර තාක්ෂණික ලියාහැරීමෙන් පසු ලියා හරින ලද පහසුකම් අයකර ගැනීමට බැංකුව සෑම උත්සාහයක්ම ගනු ලැබේ.

අයකර ගැනීම් පසුවිපරම් කිරීම අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| | ච<br>බැංකුවේ පසුගිය වසර 5 සඳහා ලියා හරින ලද සමස්ත වටිනාකම රු.මිලියන 838.77 ක් ලෙස වාර්තා වූ අතර මෙය තුළ 2019 වර්ෂයේදී ටැන්ඩන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිඩට් ට අයත් රු.මිලියන 616.46 ක ඉහළම ලියාහැරීම් ශේෂය ඇතුළත් විය.<br>ලියා හරින ලද ශේෂයන්ගෙන් අයකර ගැනීම් 2020 වර්ෂය හැර පසුගිය වර්ෂ 5 තුළ ක්‍රමානුකූලව අඩුවී ඇති අතර ණයපත් මධ්‍යස්ථානයේ හැර ලියා හරින ලද ශේෂයන්ගෙන් අයකර ගැනීම් 2022 වර්ෂයේදී වාර්තා නොවිණි. | | |
| **3.3.5** | **අරමුදල් ඌණ උපයෝජනය**<br>රුපියල් මිලියන 64.28 ක වටිනාකම ඇති ප්‍රාග්ධන අයිතම දිගු කාලයක් තිස්සේ චලනය නොවන ලෙස ලෙස ගබඩාවේ පැවතුණි. මෙම චලනය නොවන ප්‍රාග්ධන අයිතම සත්‍ය ආර්ථික අගය ලබාගැනීමකින් තොරව අපතේ යා හැකිය. | ප්‍රාග්ධන අයිතම දැනටමත් මාරු කර ඇති අතර ඉතිරි ශේෂය රු.මිලියන 25.39 කි. එම ප්‍රමාණය, ශාඛා ජාලයේ එදිනෙදා වැඩ කටයුතු සඳහා අවශ්‍ය අයිතමවලින් සමන්විත වන අතර ඒවා හොඳ තත්වයේ පවතී. | නිසි තොග කළමනාකරණ පද්ධතිය සමඟ අනුගතවීම අවශ්‍ය වේ. |
| **3.3.6** | මහජනයාගේ සහ පොදුවේ ප්‍රජාවගේ යහපත සඳහා ප්‍රජා සේවා ව්‍යාපෘතිවලට සහාය දැක්වීමේ අභිලාසයෙන් යුක්තව, මහරගම පිළිකා රෝහලේ ළමා වාට්ටුව අලුත්වැඩියා හා නඩත්තු කිරීමට බැංකුව, Ceybank Humanitarian Trust Fund (CHTF) 2012 ඔක්තෝබර් 1 දිනැති, චක්‍රලේඛ අංක HTF/1/2012 මඟින් ස්ථාපිත කරන ලද අතර නගර කාර්යාල ශාඛාවේ පවත්වාගෙන යන Humanitarian Trust Fund ජංගම ගිණුමට සියලු ව්‍යාපාර නොවන ආදායම ප්‍රේෂණය කිරීමට උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට Humanitarian Trust Fund ජංගම ගිණුමේ (අංක 350942) ශේෂය රු.මිලියන 62.08 ක් වූ අතර ප්‍රකාශිත කාර්යය සඳහා අරමුදල භාවිතා කර නොතිබුණි. | 2012 ඔක්තෝබර් 1 දිනැති අංක HTF/1/2012 චක්‍රලේඛ මඟින් ගිණුමේ අරමුණ මහජනයාගේ සහ පොදුවේ ප්‍රජාවගේ යහපත සඳහා ප්‍රජා සේවා ව්‍යාපෘතිවලට සහාය දැක්වීම සහ පිළිකා රෝහලේ ළමා වාට්ටුව අලුත්වැඩියා/නඩත්තු කිරීම ලෙස දක්වා තිබුණි. පිළිකා රෝහලේ වාට්ටුව සඳහා ප්‍රතිසංස්කරණය ලෙස 2015.01.20 දින රු.මිලියන 6.7 ක ගෙවීමක් කර ඇති බව සහ රු.මිලියන 2.6 ක හා රු.මිලියන 0.57 ක මුදලක් | අදාල මාර්ගෝපදේශවලට අනුගතවීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| | ගංවතුර ආධාර වැඩසටහන සඳහා 2015.08.27 දින බැර කර ඇති බවත් නිරීක්ෂණය විය. 2023.11.16 දිනට පවතින ශේෂය රු.මිලියන 71.37 කි. | |

**3.4 අක්‍රිය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුවට අයත් යෝර්ක් වීදියේ පිහිටි වර්ග අඩි 261,610 ක ප්‍රමාණයකින් යුතු මහල් 6 ක ගොඩනැගිල්ලක වර්ග අඩි 163,890 ක ප්‍රමාණයක්, මෙට්‍රොපොලිටන් ශාඛාව සහ බස්නාහිර පළාත් උතුරු කාර්යාලය විසින් 2013 වර්ෂය දක්වා භාවිතා කර තිබුණු අතර, සෙසු බිම් ප්‍රමාණය හෝටෙල් කලම්බු (1963) ලිමිටඩ් විසින් භාවිතා කරනු ලබයි. සැලකිය යුතු ප්‍රමාණයක් හෝ ගොඩනැගිල්ලෙන් සියයට 60 ක ප්‍රමාණයක් 2013 සිට අක්‍රියව පවතී. 2016 ඔක්තෝබර් 17 දිනැති තක්සේරු වාර්තාව අනුව, ඉඩමේ හා ගොඩනැගිල්ලේ වටිනාකම රු.මිලියන 3,003 ක් විය. හොටෙල් කලම්බු ලිමිටඩ්- 1963 (GOH ) සෙලෙන්දිවා ඉන්වෙස්මන්ට් ලිමිටඩ් (SIL) සමඟ ඒකාබද්ධ කිරීමටත්, 2020 මාර්තු 4 දිනැති හා 2020 ජුලි 8 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව යෝර්ක් වීදියේ ගොඩනැගිල්ලේ (YSB) හිමිකාරිත්වය සෙලෙන්දිවා ඉන්වෙස්මන්ට් ලිමිටඩ් වෙත මාරු කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. කෙසේ වෙතත්, එම මාරු කිරීමේ ක්‍රියාවලිය තවමත් සිදු කෙරෙමින් පවතී. | 2023.08.31 දිනැති ලිපියක් මඟින් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් දන්වා ඇත්තේ, ගොඩනැගිල්ලට, එහි රැඳී සිටින්නන්ගේ සහ අමුත්තන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අරමුණු කරගත් වැඩ, කරගෙන යාමට ඔවුන්ගේ විරෝධයක් නොමැති බවයි. යෝර්ක් වීදියේ ගොඩනැගිල්ල ව්‍යුහාත්මකව ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය බැංකුව දැනටමත් ආරම්භ කර ඇති අතර යෝර්ක් වීදියේ ගොඩනැගිල්ල ශක්තිමත් කිරීම සඳහා උපදේශකවරයෙක්/කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. | ඒ අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.5.1 | බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) නිර්වචනයට අනුව, සේවා යනු උපදේශන සේවා හැර සේවාවන් වේ. කෙසේ වෙතත්, බැංකුව සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදනය වෙනුවෙන් කිසිදු අභ්‍යන්තර මාර්ගෝපදේශයක් සංවර්ධනය කර නොමැත. එහෙයින්, ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය (NPA) විසින් 2007 නිකුත් කරන ලද උපදේශකයක් තෝරා ගැනීම හා යෙදවීම සඳහා වන මාර්ගෝපදේශය බැංකුව විසින් පිළිපැදිය යුතු වේ. කෙසේ වෙතත්, බැංකුවට අයත් මාර්ගෝපදේශ නොමැති වුවද, බැංකුව එම මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. බැංකුව සඳහා මාර්ගෝපදේශයක් පිළියෙල කිරීමේ කටයුතු කරනු ලැබේ. | බැංකුව සඳහා මාර්ගෝපදේශයක් පිළිලෙ කිරීම හෝ ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ මාර්ගෝපදේශ |

අදාල කර ගැනීම අවශ්‍ය වේ.

3.5.2 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා බැංකුවේ ප්‍රාග්ධන අයවැය සහ සත්‍ය ප්‍රාග්ධන වියදම අතර සැලකිය යුතු විචලනයක් පහත කාණ්ඩවල නිරීක්ෂණය විය.

සටහන් කර ගන්නා ලදි. ඇස්තමේන්තු මත පදනම්ව අනුමැතීන් ලබා ගෙන ඇත.

විචලනයන් අවම කිරීම අවශ්‍ය වේ.

| වර්ගීකරණය | විචලනය ඉක්මවීම/ (ඉක්ම නොවීම) අයවැය **2022 (%)** | විචලනය ඉක්මවීම/ (ඉක්ම නොවීම) අයවැය **2021 (%)** | විචලනය ඉක්මවීම/ (ඉක්ම නොවීම) අයවැය **2020 (%)** | විචලනය ඉක්මවීම/ (ඉක්ම නොවීම) අයවැය **2019 (%)** | විචලනය ඉක්මවීම/ (ඉක්මනොවීම) අයවැය **2018 (%)** | විචලනය ඉක්මවීම/ (ඉක්ම නොවීම) අයවැය **2017 (%)** |
| --- | --- | --- | --- | --- | --- | --- |
| කාර්යාල යන්ත්‍ර /කාර්යාල උපකරණ | (77) | (76) | (34.32) | 20.57 | (14.88) | (74.0) |
| ලී බඩු | (27) | (17) | 18.6 | 29.21 | 60.39 | (13.26) |
| ආරක්ෂක උපකරණ | (94) | (99) | (81.3) | (76.15) | (43.42) | 6.44 |
| වාහන (ප්‍රවාහන දෙපාර්තමේන්තුව) | (100) | (98) | (88.6) | (92.57) | (61.54) | (35.65) |
| ඉදිකිරීම් (පරිශ්‍ර දෙපාර්තමේන්තුව) | (66) | (65) | (61.5) | (42.12) | (29.57) | (6.81) |
| ශාඛා පරිවර්තනය (වෙනස) | - | - | (77.2) | (79.29) | (64.59) | (76.12) |
| පරිගණක උපකරණ, දෘඩාංග හා මෘදුකාංග (තොරතුරු තාක්ෂණ අංශය) | (59) | (52) | (45.1) | (33.73) | (36.75) | (15.56) |
| ඉඩම මිලදී ගැනීම | (100) | (98) | (94.3) | (53.23) | (64.41) | (36.45) |
| පාසැල් සංසද වැඩ | | | (86.0) | (96) | (99.80) | - |
| නිවාඩු නිකේතන සඳහා මිලදී ගැනීම | (22) | 9.8 | (91.5) | (64.34) | (88.5) | (29.6) |
| අසම්භාව්‍යයන් | (100) | (100) | (100) | (100) | (100) | (90) |
| සීආර්එම් යන්ත්‍ර (CRM) 150 ක් සඳහා අතිරේක අවයැය | - | - | - | (42.98) | - | - |

3.5.3 බැංකුව 2017 වර්ෂයේ සිට 2019 දක්වා කාලය තුළ අදාල වර්ෂ සඳහා ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන පැවතීමකින් තොරව මීගමුව නගර, වයික්කාල, බිංගිරිය, නාත්තන්ඩිය, ගලේවෙල, මහනුවර නිවාඩු නිකේතනය, කිරිබත්ගොඩ, කඳපොල සහ පැලියගොඩ ශාඛාවන් සඳහා රු. මිලියන

ව්‍යාපාර අවශ්‍යතාවය මත පදනමව, අධ්‍යක්ෂ

නිසි ප්‍රාග්ධන අයවැය සැලසුම්කරණය සමග අනුගත

| | | | |
|---|---|---|---|
| | 709.8 ක මුළු පිරිවැයකට දේපල මිලදී ගෙන තිබුණි. | මණ්ඩල අනුමැතිය මත ඉඩම් මිලදී ගැනීම සිදු කරන ලදි. | වීම අවශ්‍යා වේ. |
| 3.5.4 | ශාඛා බොහොමයක් කුලී පදනම මත ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය වූ අතර, බැංකුව තමන්ගේම ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගත යුත්තේ කුමන අදියරේද යන්න හෝ බැංකුව ශාඛා ගොඩනැගිල්ලක් කුලී පදනම මත පවත්වාගෙන යා යුත්තේ කුමන අදියරේද යන්න පිළිබඳව, බැංකුවට නිසි ප්‍රතිපත්තියක් නොවීය. | කල් බද්දට ගත් දේපලක හෝ සින්නක්කර දේපලක ශාඛා ගොඩනැගිල්ල පවත්වාගෙන යෑමේ ශක්‍යතාවය තීරණය කිරීමට මූල්‍ය හා සමාජ යන දෙයාකාර පැතිකඩයන් ඇතුළත්, පළාත් මට්ටමින් ශක්‍යතා අධ්‍යන සිදු කරමින් පවතී. | බැංකුව සතුව ලේඛනගත ප්‍රතිපත්තියක් පැවතිය යුතුය. |
| 3.5.5 | 2022 දෙසැම්බර් 31 වන විට, බැංකුවට අයත් සින්නක්කර දේපල 115 ක් පැවතුණි. ඉන් ඉඩම් 27 ක ප්‍රමාණයක් 2015 න් පසු අත්පත් කර ගෙන තිබුණු අතර දේපළ 9 ක ඉදිකිරීම් අවසන් කර තිබුණි. නිම කරන ලද ඉදිකිරීම් විශ්ලේෂණය කිරිමේදී, ඉඩම මිල දී ගත් දින සිට ශාඛා ගොඩනැගිල්ල ඉදිකිරීමට වසර 5 කට වඩා වැඩි කාලයක් ගෙන ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, ඉඩම මිල දී ගත් දින සිට උපදේශකවරයා තෝරා ගැනීම සහ මිලදී ගත් ඉඩමේ ශාඛා ඉදි කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාදයන් හඳුනා ගන්නා ලදි. උදාහරණ පහත දැක්වේ. | එම කාලය තුළ පැවති වසංගත/ ආර්ථික තත්වය හේතුවෙන් බැංකුවේ අවශ්‍යතාවලට ප්‍රමුඛතාවය දෙමින් ඇතැම් ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රමාද කිරීමට බැංකුව තීරණය කරන ලදි. | ඉදිකිරීම් කඩිනම් කිරීම අවශ්‍යා වේ. |

| **පරිශ්‍රයේ නම** | **2022.12.31 දිනට ඉඩම මිලදී ගැනීමෙන් පසු කාලය** | **2022.12.31 දිනට ප්‍රගතිය** |
|---|---|---|
| බිංගිරිය ශාඛාව | අවුරුදු 5 | කොන්ත්‍රාත්කරු තේරීම තාවකාලිකව නතර කර ඇත. |
| දංකොටුව ශාඛාව | දළ වශයෙන් අවුරුදු 5 | ඉඩම මිලදී ගැනීම පමණි. |
| වයික්කාල ශාඛාව | අවුරුදු 5 | කොන්ත්‍රාත්කරු තේරීම තාවකාලිකව නතර කර ඇත. |
| නාත්තන්ඩිය ශාඛාව | අවුරුදු 5 | කොන්ත්‍රාත්කරු තේරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී. |
| වාරියපොල ශාඛාව | දළ වශයෙන් අවුරුදු 5 | ඉදි කිරීම් කරමින් පවතී. |
| මාරවිල ශාඛාව | දළ වශයෙන් අවුරුදු 5 | ඉඩම මිලදී ගැනීම පමණි. |

| | | |
|---|---|---|
| දෙනියාය ශාඛාව | අවුරුදු 3 | ඉඩම මිලදී ගැනීම පමණි. |
| ගාල්ල නගර ශාඛාව | අවුරුදු 3 ½ | ඉදි කිරීම් කරමින් පවතී. |
| කරාපිටිය ශාඛාව | අවුරුදු 5 ½ | උපදේශක තේරීම කරමින් පවතී. |
| රත්න ශාඛාව | අවුරුදු 3 | ඉඩම මිලදී ගැනීම පමණි. |
| ගණේමුල්ල ශාඛාව | අවුරුදු 3 ½ | ඉඩම මිලදී ගැනීම පමණි. |
| කිරිබත්ගොඩ ශාඛාව | අවුරුදු 4 ½ | කොන්ත්‍රාත්කරු තේරීම කරමින් පවතී. |
| මීගමුව නගර ශාඛාව | දළ වශයෙන් අවුරුදු 5 ½ | කොන්ත්‍රාත්කරු තේරීම කරමින් පවතී. |
| කොට්ටාව ශාඛාව | අවුරුදු 3 | කොන්ත්‍රාත්කරු තේරීම කරමින් පවතී. |
| දෙමටගොඩ ශාඛාව | අවුරුදු 7 | උපදේශක තේරීම තාවකාලිකව නතර කර ඇත. |
| මහනුවර නිවාඩු නිකේතනය | අවුරුදු 5 | ඉදි කිරීම් කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| 3.5.6 | 2007 අගොස්තු මාසයේ ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් ප්‍රකාශයට පත් කළ උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන මාර්ගෝපදේශවල 3.4 වගන්තිය ප්‍රකාරව, - පිරිවැය ඇස්තමේන්තු සහ අයවැය- යථාර්ථවාදී අයවැය ප්‍රතිපාදන තහවුරු කිරීම සඳහා හොඳින් සංවර්ධනය කළ පිරිවැය ඇස්තමේන්තු අත්‍යවශ්‍ය වේ. යෝජිත පැවරුම සඳහා පිරිවැය ඇස්තමේන්තු සැකසීමේදී, ක්‍රියාකාරකම සිදු කිරීමට අවශ්‍ය වන්නා වූ සම්පත් යෙදවීම, විශේෂඥ කාලය, සැපයුම් සහායන්, භෞතික යෙදවුම් ආදි සාධක මත ප්‍රසම්පාදන අස්තිත්වය පදනම් විය යුතුය.<br><br>කෙසේ වෙතත්, බැංකුව යෝජිත පැවරුම සඳහා කිසිදු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකල අතර, අදාල ව්‍යාපෘතියේ කොන්ත්‍රක් වටිනාකමේ ප්‍රතිශතය මත පදනම්ව උපදේශකයා සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර පසුව, පිරිවැය ඇස්තමේන්තුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදි. කෙසේ වෙතත්, පසුව, කොන්ත්‍රාත් වටිනාකමේ ප්‍රතිශතය මත පදනම්ව අනුමත කළ පිරිවැය ඇස්තමේන්තුව, කොන්ත්‍රාත් වටිනාකම් වැඩි වීම හේතුවෙන් ඉහළ ගොස් තිබේ. එහෙයින්, අනුමත වු පිරිවැය ඇස්තමේන්තුවලට වඩා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා උපදේශක ගාස්තුව ලෙස ඉහළ පිරිවැයක් දැරීමට සිදු වී තිබේ. උදාහරණ පහත පරිදි වේ. | සටහන් කර ගන්නා ලදි. රට තුළ පැවති වසංගත/ ආර්ථික තත්වය, ආනයන සීමා හේතුවෙන් අමුද්‍රව්‍ය වල පිරිවැය අනපේක්ෂිත ලෙස ඉහළ යන ලදි. එබැවින්, සත්‍ය පිරිවැය ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සැලකියුතු ලෙස ඉහළ ගොස් ඇත. උපදේශක ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකම මත පදනම් වූ බැවින් උපදේශන ගාස්තුව ද වැඩි විය. | උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන මාර්ගෝපදේශ වලට දැඩිව අනුගත වීම අවශ්‍ය වේ. |

| ප්‍රසම්පාදනයේ නම | ආරම්භයේ ඇස්තමේන්තු කළ උපදේශන ගාස්තුව රු.මිලියන | අවසාන උපදේශන ගාස්තුව රු.මිලියන | උපදේශන ගාස්තුවේ වෙනස (ආරම්භක ඇස්තමේන්තුව හා අවසාන ගාස්තුව රු.මිලියන | වෙනසේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| පානදුර නගර ශාඛාව | 3.25 | 4.42 | 1.17 | 35.96 |
| වළස්මුල්ල ශාඛාව | 3.84 | 4.45 | 0.61 | 15.88 |
| අහංගම ශාඛාව | 1.57 | 2.09 | 0.52 | 32.81 |
| මැල්සිරිපුර ශාඛාව | 3.51 | 4.12 | 0.61 | 17.24 |
| යාපනය ශාඛාව | 1.35 | 4.63 | 3.28 | 243.07 |
| මාතර අධි ශ්‍රේණි ශාඛාව | 8.25 | 15.73 | 7.48 | 90.63 |

| | | | |
|---|---|---|---|
| 3.5.7 | සෑම ඉදිකිරීම් ව්‍යාපෘතියකටම, කාර්ය මණ්ඩලයේ වගකීම, ළඟා කර ගත යුතු භෞතික හා මූල්‍ය ඉලක්ක පැහැදිලිව හඳුනාගත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබිය යුතු වේ. කෙසේ වෙතත්, එවැනි සැලැස්මක් කිසිදු ව්‍යාපෘතියක පිළියෙල කර නොතිබූ අතර එබැවින්, ඉදිකිරීම් ව්‍යාපෘතිවල අරමුණු කාර්යක්ෂමව හා සඵලදායිව ලඟා කර ගැනීමේ අදහසින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහ අවශ්‍ය වෙනස්කම් ඇත්නම් සිදුකිරීම පිණිස සමස්තයක් ලෙස ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය කළ නොහැකි විය. | සටහන් කර ගන්නා ලදි. පරිපූර්ණ කොන්ත්‍රාත් ඉදිකිරීම් වැඩසටහනක් ප්‍රදානය කරනු ලබන සෑම ව්‍යාපෘතියකම පවතී. එය මත පදනම්ව ඉදිකිරීම් වැඩ අධීක්ෂණය හා ඇගයීම කරනු ලැබේ. | සෑම කොන්ත්‍රාක් ව්‍යාපෘතියක් සඳහාම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම අවශ්‍ය වේ. |

### 3.5.8 ගාල්ල නගර ශාඛාව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. <u>ගාල්ල නගර ශාඛාව සඳහා ඉඩමක් මිලදී ගැනීම</u> | | |
| බැංකුව, 2019 ජූනි 25 දින රු.මිලියන 121.25 ක මිලකට ශාඛාව ඉදිකිරීම සඳහා ඉඩමක් මිලට ගෙන තිබුණි. ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | ප්‍රසම්පාදන අත් පොත සමඟ දැඩිව අනුගත වීම අවශ්‍ය වේ. |

බැංකු ශාඛා සඳහා සැළසුම් මාර්ගෝපදේශවල 1.3 වගන්තිය ප්‍රකාරව, අධිශ්‍රේණියේ ශාඛාවක් සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට පර්චස් 51 ක් අවශ්‍ය වන අතර, අවම මාර්ග ඉදිරිපස (minimum road frontage) මාර්ගයේ සිට අඩි 75 ක් විය යුතුය. කෙසේ වෙතත්, පුවත්පත් දැන්වීමට අනුව, මාර්ගයේ සිට අවම ඉදිරිපස අඩි 35 ක් හා ආසන්න වශයෙන් පර්චස් 25-40 ක ප්‍රමාණයක හිස් ඉඩම් කැබැල්ලක් හෝ ගොඩනැගිලි සහිත ඉඩමක් ඉල්ලා තිබුණි.

(අ) පුවත්පත් දැන්වීමෙහි ශාඛා ගොඩනැගිල්ලේ ව්‍යුහය සඳහන් කර නොතිබූ බැවින්, ප්‍රසම්පාදනයට සහභාගිවීමට උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සාධාරණ, සම හා උපරිම අවස්ථාව නැති වී තිබුණි.

ඉඩම මිලදී ගැනීම අදාල ව්‍යාපාර ඒකකයේ ඉල්ලීම/අවශ්‍යතාවය අනුව වන අතර, ඉඩමක් මිලදී ගැනීමේදී බැංකුව නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරයි.

(ආ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 5.3.11 (a) වගන්තිය ප්‍රකාරව, ගාල්ල නගර ශාඛාව සඳහා හිස් ඉඩම්/ ගොඩනැගිලි සහිත ඉඩම මිලදී ගැනීම වෙනුවෙන් වූ පුවත්පත් දැන්වීමෙහි ලංසු සුරක්ෂණයක් (bid security) බැංකුව ඉල්ලා නොතිබුණි.

බැංකුව සඳහා දේපල මිලදී ගැනීම කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 109/2012 මත පදනම්ව සිදු කෙරේ. චක්‍රලේඛයට අනුව, ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත.

(ඇ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 6.3.3. (a) සහ (b) වගන්ති ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටුව (PC) ලංසු විවෘත කිරීමේ කමිටුවට එහි බලය පවරා නොමැති අතර, ප්‍රසම්පාදන අංශයේ නිලධාරියකු විසින් ලංසු අවසන් වන දිනයට පෙර ඉඩම් සැලැස්ම හා ඔප්පු ඉදිරිපත් කරන ලෙස එක් ලංසුකරුවකුට දැනුම් දී තිබුණු අතර, එකී ලංසු විවෘත කිරීමේ කමිටුව ක්‍රියාත්මක නොවූ බවට පුවත්පත් දැන්වීම සාක්ෂි දරයි.

බැංකුවේ ශාඛා ජාලය ස්ථාපිත කිරීම සම්බන්ධ දිගු කාලීන සැළසුම් අදාල ව්‍යාපාර ඒකකය පිළියෙල කරයි.

(ඈ) 2018 දෙසැම්බර් 28 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව, පිරිනැමුම්/අර්පණ අංක 1 බැංකුවේ අවශ්‍යතාවයන් සමඟ අනුකූල නොවූවද, මිලදී ගැනීම අවසන් කිරීමට පෙර පහත ලේඛන ඉදිරිපත් කිරීමට යටත්ව ඉඩම මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කර තිබුණි.

1. ඒකාබද්ධ කළ මිනින්දෝරු සැලැස්ම සඳහා තනි අනුමැතිය (Block approval)
2. පාංශු පරීක්ෂණ වාර්තාව
3. සමූහ තක්සේරුකරුගෙන් (Panel Valuer) ගත් තක්සේරු වාර්තාව සහ තක්සේරු සමාලෝචන මණ්ඩලයෙන් ගත් තහවුරු කිරීම.

| | | |
|---|---|---|
| 4. ප්‍රධාන නීති නිලධාරියාගෙන් හිමිකම් නිෂ්කාශනය ලබා ගැනීම.<br>(ඉ) බැංකුවේ ශාඛා ජාලය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් බැංකුවට දිගු කාලීන සැළසුම් තිබිය යුතු අතර, එසේ නොමැතිවිට, ගොඩනැගිලි ඉදි කිරීම සඳහා නුසුදුසු ඉඩම් මිල දී ගැනීමට ඉහළ පිරිවැයක් දැරීමට බැංකුවට සිදු වන බව නිරීක්ෂණය විය. | | |
| ii <u>බැංකුව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් උපදේශකවරයකු තෝරා ගැනීම "ගාල්ල නගර අධිශ්‍රේණි ශාඛාව 1 (ලංසු අංකය BOC/PROP/P/2019/387)</u> | | |
| (අ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 2.11.1.(c) වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන කාල සටහන් (PTS), ප්‍රසම්පාදන ක්‍රමය සහ ලංසු ලේඛන වර්ගය පිළිබඳව එකඟවීමට ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇයිම් කමිටුව සමඟ ඒකාබද්ධව පළමු රැස්වීමක් පවත්වා නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. | බැංකුවේ ප්‍රසම්පාදන අත්පොත සමඟ දැඩිව අනුගත වීම අවශ්‍ය වේ. |
| (ආ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 2.12.(a) වගන්තිය පරිදි, ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සියලු සාමාජිකයන් පළමු රැස්වීමේදී අනුමත ආකෘතියෙන් ප්‍රකාශයක් අත්සන් කළ යුතුය. පළමු රැස්වීමක් නොතිබූ හෙයින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ සංදේශයේ දිනය තාක්ෂණික ඇගයීම් කමිටුවේ පත්වීමේ දිනයක් ලෙස ගෙන තිබුණි. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් විසින් ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ උපදේශක පත්කර දින 15 කට පසු 2023 නොවැම්බර 28 දින ප්‍රකාශනය ලබා දී තිබුණි. තවද, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය සමඟ සම්බන්ධ වූ ප්‍රමාණ සමීක්ෂකවරයා ප්‍රකාශය අත්සන් කර නොමැත. තවද, ප්‍රසම්පාදන අත්පොතේ 5.3.11 (a) වගන්තිය ප්‍රකාරව, ලංසු සුරක්ෂණය ලබාගෙන නොතිබුණි. | 2019.09.09 දිනැති ප්‍රධාන කළමනාකරු (තාක්ෂණික සහාය) ගේ ලිපිය ප්‍රකාරව, ප්‍රමාණ සමීක්ෂක විසින් පිළියෙල කරන ලද මූලික ඇස්තමේන්තු සඳහා ඔහුගේ නිර්දේශය සමඟ ව්‍යාපෘති විස්තර ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි. | |

### 3.5.9 දෙමටගොඩ ශාඛාව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. <u>දෙමටගොඩ ශාඛාව සඳහා ඉඩම මිලදී ගැනීම</u><br>2015 නොවැම්බර් 6 දින බැංකුව, ශාඛාව ඉදිකිරීම සඳහා රු.මිලියන 108 කට ඩී.පී.ජේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් ඉඩමක් මිලදී ගෙන තිබූ අතර පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | බැංකුවේ ප්‍රසම්පාදන අත්පොත සමඟ දැඩිව අනුගත වීම අවශ්‍ය වේ. |
| (අ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 2.4.1 හා 2.7.8 යන වගන්ති ප්‍රකාරව, ප්‍රසම්පාදනය, ආයතනික ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කළ | දේපළ මිලදී ගැනීම්, කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක | |

| | |
|---|---|
| යුතු අතර, රු.මිලියන 108 වටිනාකමකට දෙමටගොඩ ශාඛාව ඉදිකිරීම සඳහා ඉඩම මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන අස්තිත්වය, ආයතනික ප්‍රසම්පාදන කමිටුව පත් කර නොතිබුණි. දෙමටගොඩ ශාඛාව සඳහා සුදුසු ඉඩමක්/ ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් සඳහා අර්පණයන් කැඳවන පුවත්පත් දැන්වීම, සහකාර සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත උතුර) සහ පසුව ප්‍රධාන කළමනාකරු (දේපළ හා ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විකුණුම් හා අංශ කළමනාකරණ - Sales & Channel management) නිර්දේශ කර 2014 ජූලි 28 දින පල කර තිබුණි. ප්‍රසම්පාදන අත්පොතේ ප්‍රකාශිත වගන්තිවලට පටහැණිව, දෙමටගොඩ ශාඛාවේ ඉඩම මිලදී ගැනීමේ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ආයතනික ප්‍රසම්පාදන කමිටුව සම්බන්ධ වී නොතිබුණි. | 109/2012 මත පදනම් වේ. දේපළ පරීක්ෂා කිරීමේ කමිටුව සහ දේපළ මිලදී ගැනීමේ කමිටුව චක්‍රලේඛයෙන් නම්කර ඇති අතර ඔවුන් දේපළ මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටි සුපරීක්ෂණය කරන අතර ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි. |
| (ආ) 2012 ජූලි 4 දිනැති අංක 109/2012 දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛයේ 2.1 වගන්තිය ප්‍රකාරව, "බැංකුවට දේපළක් මිලදී ගැනීමට අවශ්‍යතාවයක් පවතින විට අදාල කළමනාකරු/නිලධාරියා එම අවශ්‍යතාවය සහකාර සාමාන්‍යාධිකාරීගේ (පළාත්/ශාඛා) අවධානයට යොමු කළ යුතුය". කෙසේ වෙතත්, ඉඩම මිලදී ගැනීම සඳහා ශාඛා කළමනාකරුගේ හෝ බලයලත් නිලධාරියාගේ කිසිදු විධිමත් ඉල්ලීමක් නොතිබිණි. | සටහන් කර ගන්නා ලදි. |
| (ඇ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 5.6.1 (a) වගන්තිය ප්‍රකාරව, "*ප්‍රසම්පාදනය කිරීමට නියමිත භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතරයන් අදාල ප්‍රසම්පාදන අරමුණු ළඟා කර ගැනීමේ අවශ්‍යතාවයට වඩා පටු ලෙස නිර්වචනය නොකළ යුතුය*". කෙසේ වෙතත්, 2014 ජූලි 28 දින ජාතික පුවත්පත් 3 ක පළ කළ පුවත්පත් දැන්වීම ඉතා සංක්ෂිප්ත හා එහි ලංසු විවෘත කරන දිනය, කාලය, සහ ස්ථානය වැනි අවශ්‍යතාවයන් විශේෂයෙන් සඳහන් නොවන බව නිරීක්ෂණය විය. | අංක 109/2012 දරන චක්‍රලේඛය ප්‍රකාරව, දැන්වීම තුළ නියමයන් හා කොන්දේසි සහ පිරිවිතරයන් ඇතුළත් විය යුතුය. ඒ අනුව, ස්ථානය, ප්‍රමාණය (extent) අවම මාර්ග ඉදිරිපස, අර්පණය සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන, අර්පණය කළ යුතු අවසාන දිනය, 2014.07.28 දින පළ කළ පුවත්පත් දැන්වීමෙහි සඳහන් කර තිබුණි. |
| (ඈ) දෙමටගොඩ, අංක 400 හි පිහිටි පර්චස් 38 ක දේපළ විකිණීමට කැමැත්ත ඩී.පී.ජේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂක විසින් සහකාර සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත) වෙත 2014 ජූලි 28 දින ප්‍රකාශ කර තිබුණු අතර, ඉඩම මිලදී ගැනීමට | සටහන් කර ගන්නා ලදි. |

| | | | |
|---|---|---|---|
| | පුවත්පත් දැන්වීම, සමාගමෙන් කැමැත්ත ලැබුණු පසු පළකර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, ශාඛාව වෙනත් ස්ථානයකට ගෙන යාමේ අවශ්‍යතාවය ඩී.පී.ජේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කැමැත්තෙන් පසුව පැන නැගී ඇති අතර, පුවත්පත් දැන්වීම සඳහා එම ඉඩම වෙනුවෙන් ඔවුන්ගේ මිල ගණන් පමණක් ලැබී තිබීම මඟින් සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලියේම විනිවිදභාවය අහිමි කරනු ලැබේ. | | |
| | (ඉ) 2014 දෙසැම්බර් 2 දිනැති අංක 5.1 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව, මාර්ග ඉදිරිපස පළල අඩි 45 ක් පමණක් වීම හා ඉඩම ‘L’හැඩයෙන් යුක්ත වීම නිසා ඩී.පී.ජේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ඉඩම මිලදී ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර නොතිබිණි. පසුව, 2015 අප්‍රේල් 10 දින, අදාල මිනින්දෝරු සැළැස්ම සඳහා කොළඹ මහ නගර සභාවෙන් අනුමැතියක් ලබා ගැනීමට යටත්ව ඩී.පී.ජේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ගෙන් රු.මිලියන 108 ක ප්‍රතිෂ්ඨාවකට ඉහත ඉඩම මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ‘L’හැඩයෙන් යුක්තවීම හා භූගෝලීය පිහිටීම හේතුවෙන් මුලින් ප්‍රතික්ෂේප කරන ලද ඉඩම සුදුසු ස්ථානයක් ලෙස නැවත සලකා බැලීම සඳහා හේතු අනාවරණය නොවීය. | සටහන් කර ගන්නා ලදි. ඉන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය ඉඩම මිලදී ගැනීමට 2015.04.10 දින අනුමැතිය ලබා දී ඇත. | |
| | (ඊ) 2014 ජූලි 28 දිනැති පුවත්පත් නිවේදනය ප්‍රකාරව, යෝජිත දේපලේ හිමිකම් වාර්තාව සහ මිනින්දෝරු සැළැස්ම සමඟ අර්පණය ඉදිරිපත් කළ යුතු වුව ද, කොළඹ මහ නගර සභාව විසින් මිනින්දෝරු සැළැස්ම සඳහා අනුමැතියක් ලබා ගැනීමට යටත්ව, තෝරාගත් දේපළ මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, කොළඹ මහ නගර සභාව විසින් 2015 සැප්තැම්බර් 30 දින මිනින්දෝරු සැළැස්ම අනුමත කර තිබුණි. | සටහන් කර ගන්නා ලදි. මිනින්දෝරු සැළැස්ම 2015.09.30 දින අනුමත කර ඇත. | |
| ii | <u>දෙමටගොඩ ශාඛාව සඳහා නව ශාඛා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් උපදේශකවරයක් තෝරා ගැනීම</u><br>ආයතනික ප්‍රසම්පාදන කමිටුව, දෙමටගොඩ ශාඛාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය සහ බස්නාහිර පළාත සඳහා පළාත් කාර්යාලය වෙනුවෙන් අපේක්ෂිත පිරිවැය රු.මිලියන 250 සහ බදු ඇතුළත් ව්‍යාපෘතිය සඳහා සමූහ උපදේශන සේවා (consortium consultancy services) ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. ඒ පිළිබඳව පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන මාර්ගෝපදේශවලට දැඩිව අනුගතවීම අවශ්‍ය වේ. |

| | |
|---|---|
| (අ) දෙමටගොඩ ශාඛාව සඳහා සමූහ උපදේශන තෝරා ගැනීම වෙනුවෙන් වන ලංසු ලේඛණයේ යොමු කොන්දේසි (Terms of Reference) අනුව, සේවය සති 188 ක් සඳහා අපේක්ෂා කෙරේ. එබැවින්, ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් 2007 අගෝස්තු ප්‍රසිද්ධ කරන ලද උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන මාර්ගෝපදේශවල 4.3 වගන්තිය ප්‍රකාරව, වසරක කාලයක් ඉක්මවන උපදේශන සේවා වෙනුවෙන්, ජාතික විශේෂඥයන් තෝරා ගැනීමේදී, සුදුසුකම් ඉදිරිපත් කිරීම ජාතික පුවත්පත්වල පළ කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන අස්තිත්වය දැන්වීම ජාතික පුවත්පත්වල පළ කර නොතිබූ අතර බැංකුව, බැංකුවේ ලියාපදිංචි සමූහ උපදේශන සේවා සපයන්නන්ගෙන් යෝජනා කැඳවා තිබුණි. | සටහන්කර ගන්නා ලදි. |
| (ආ) ජාතික ජාතික ප්‍රසම්පාදන නියෝජත ආයතනය විසින් 2007 අගෝස්තු ප්‍රසිද්ධ කරන ලද උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන මාර්ගෝපදේශවල 4.3 වගන්තිය ප්‍රකාරව, කෙටි ලැයිස්තුව තුළ උපදේශන සමාගම් 7 කට වඩා ඇතුළත් නොවිය යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ආස්තිත්වය බැංකුවේ සමූහ උපදේශන සේවා සපයන්නන් 16 කින් යෝජනා කැඳවා තිබුණි. | සටහන් කර ගන්නා ලදි. උපදේශකයන් අතර තරඟකාරීත්ව ඇති කිරීමට සහ බැංකුවට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට සමූහ උපදේශන සේවා සපයන්නන් 16 කින් යෝජනා කැඳවන ලදි. |
| (ඇ) ජාතික ජාතික ප්‍රසම්පාදන නියෝජත ආයතනය විසින් 2007 අගෝස්තු ප්‍රසිද්ධ කරන ලද උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන මාර්ගෝපදේශවල 4.3 වගන්තිය ප්‍රකාරව, කෙටි ලැයිස්තුගත ආයතන ආරාධනා ලිපියේ (Letter of Invitation- LOI) ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, යෝජනා සඳහා ඉල්ලීම් (RFP) අනුව, බැංකුව එම වගන්තිය සමඟ අනුකූල වී නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. |
| (ඈ) පහත සඳහන් කරුණු හේතුවෙන් සමූහ උපදේශන සේවා තෝරා ගැනීමේ ක්‍රියාවලිය අනවශ්‍ය ලෙස ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය. | |
| • තාක්ෂණික ඇගයීම් කමිටුවට 2017 පෙබරවාරි 22 දින මුලින්ම පත්කරන ලද බාහිර සාමාජිකයා කිහිප වතාවක් වෙනස් වී තිබුණි. | සටහන් කර ගන්නා ලදි. පත් කරන ලද බාහිර සාමාජිකයන් නොමැතිකමෙන් පැන නඟින බාධාවන් වලට මුහුණදීමට ප්‍රසම්පාදන අස්තිත්වයට සිදු වූ අතර, එම කාල පරිච්ඡේදවල සිටි බාහිර සාමාජිකයන් පත්කිරීම මඟින් ප්‍රසම්පාදන අස්තිත්වය ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩතාවය තහවුරු |

| | |
|---|---|
| | කරන ලදි. |
| • සම්පූර්ණ ව්‍යාපෘති පිරිවය සඳහා වෘත්තීය වගකීම් රක්ෂණයක් ලබා ගැනීමට සාකාච්ඡා කිරීම සඳහා මාස 11 ක් ගත කිරීමෙන් පසු, ආරම්භයේ තෝරාගත් උපදේශක ටීම් ෆෝ ආර්කිටෙක් ඇන්ඩ් ඉංජිනියර්ස් (Team Four Architects & Engineers) ගෙන් සුරත් වික්‍රමසිංහ ඇසෝෂියේට් වෙත මාරුවීම. ඒ අනුව, 2016 ඔක්තෝබර් 12 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියේ පටන් කොන්ත්‍රාත්තුව සඳහා සමූහ උපදේශන ආයතනයක් තෝරාගැනීමේ ක්‍රියාවලිය සඳහා වසර 2 ට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. | සටහන් කර ගන්නා ලදි. සුරත් වික්‍රමසිංහ ඇසෝෂියේට් වෙත සමූහ උපදේශන සේවා ලබා දීමට එක් හේතුවක් වූයේ අවශ්‍ය වෘත්තීය වගකීම් රක්ෂණාවරණයක් සැපයීමට ටීම් ෆෝ ආර්කිටෙක් ඇන්ඩ් ඉංජිනියර්ස් එකඟ නොවීමයි. |
| • 2021 පෙබරවාරි 3 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් අධ්‍යක්ෂ මණ්ඩලය, මුලින් අනුමත කළ ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්වීම. එමඟින්, දෙමටගොඩ ශාඛාව පමණක් වර්ග අඩි 7,650 ක ඉඩකඩක් සහිතව රු.මිලියන 96 ක පිරිවැයකට ඉදිකිරීම සහ ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය හා පළාත් කාර්යාලය ආරම්භයේ අනුමත වූ දෙමටගොඩ ශාඛාවෙන් ඉවත් කර වර්ග අඩි 29,117 ක ඉඩකඩක් සහිතව කිරිබත්ගොඩ ශාඛාව සඳහා වන නව ගොඩනැගිල්ලේ විෂය පථයට ඇතුළත් කිරීම. නැවතත්, 2021 නොවැම්බර් 17 දින පැවති රැස්වීමක දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ග අඩි 7,650 ක දළ ඉඩකඩක් සහිතව දළ වශයෙන් වර්ග අඩි 2,650 ක ඉඩකඩකින් යුතු ප්‍රධාන කාර්යාලයට පැමිණෙන සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා එම ගොඩනැගිල්ලේම විධායක නිල නිවාස 5 ක් වෙනුවෙන් අමතර රු.මිලියන 32.5 සහ අදාල බදු භාවිතා කරමින් රු.මිලියන 77 ක පිරිවැයකට දෙමටගොඩ නව ශාඛා ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාල විෂය පථය සංශෝධනය අනුමත කරන ලදි. ශාඛා ගොඩනැගිලි සහ වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා නිසි සැළසුම්කරණ ක්‍රියාවලියේ අසාර්ථකභාවය හේතුවෙන් ව්‍යාපෘති අනවශ්‍ය ලෙස දිගු කාල පරිච්ඡේදයකට ඇදී ගොස් ඇති අතර පිරිවැය හා කාල නාස්තියකට හේතු වී තිබුණි. | |
| • උපදේශක ගිවිසුමේ සඳහන්කර ඇති පරිදි, උපදේශන ගාස්තු සෑම කඩඉමකදීම (milestone) ගෙවීමට බැංකුව හා උපදේශකයන් එකඟ වී තිබුණ ද ඵලදායී | සටහන් කර ගන්නා ලදි. |

| | | |
|---|---|---|
| ආකාරයෙන් ව්‍යාපෘතිය සැලකිය යුතු ලෙස නිම නොකර එක් එක් කඩඉම් උප අදියරවලට කඩමින් සැලකිය යුතු ප්‍රතිශතයක් ගෙවා තිබුණි. බැංකුව දැනටමත් උපදේශන ගාස්තු ගෙවීමක් ලෙස රු.මිලියන 4.45 ක් සුරත් වික්‍රමසිංහ ඇසෝෂියේට් වෙනුවෙන් දරා තිබුණු අතර, එය බැංකුවට නිශ්කාර්ය පිරිවැයක් වීමට ඉඩ ඇත. විෂය පථය වෙනස්වීමත් සමඟ උපදේශන ගාස්තු ලෙස රු.මිලියන 5.25 ක අමතර පිරිවැයක් දැරීමට බැංකුවට සිදුවේ. | | |

**3.5.10 කොට්ටාව අධිශ්‍රේණි ශාඛාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| <u>කොට්ටාව අධිශ්‍රේණි ශාඛාව සඳහා ඉඩමක් මිලදී ගැනීම</u><br>2019 අගොස්තු 23 දින කොට්ටාව අධිශ්‍රේණි ශාඛාව ඉදි කිරීම සඳහා රු.මිලියන 211. 32 ක් වැය කර ඉඩමක් මිලදී ගෙන තිබුණි. ඒ පිළිබඳව පහත නිරීක්ෂණ කෙරේ. | | |
| (අ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 2.4.1 වගන්තිය හා 2.7.8 වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්තිත්වය විසින්, රු.මිලියන 281.76 ක වටිනාකමක් සහිත ඉහත ප්‍රසම්පාදනය වෙනුවෙන් ආයතනික ප්‍රසම්පාදන කමිටුවක් පත් කර නොතිබුණි. 2017 ඔක්තෝබර් 26 දින හා 2017 දෙසැම්බර් 15 දින පිළිවෙලින් අවශ්‍ය පිරිවිතරයන් විස්තරාත්මකව ඇති හා නොමැතිව අර්පණ කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් 2 ක් පළකර තිබුණි. තවද, 2017 ඔක්තෝබර් 26 දින පුවත්පත් දැන්වීම වෙනුවෙන් අර්පණ ලැබීම හෝ ලංසු ඇගයීම පිළිබඳව කිසිදු ලේඛනයක් නොතිබුණි. 2018 අප්‍රේල් 2 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව, දෙවන පුවත්පත් දැන්වීම පරිදි නියමිත කාලය තුළදී ලැබුණු අර්පණය හැර වෙනත් අර්පණ 4 ක් සඳහා පමණක් පරීක්ෂණය කර ඇත. තවද, පරීක්ෂාව සඳහා සලකා බලන ලද අර්පණ 4 න් 2 ක් අවසාන දිනට පසු ලැබුණු බව නිරීක්ෂණය විය. දේපළ පරීක්ෂණ කමිටුව දේපළ 2 ක් සඳහා පමණක් තක්සේරුව කැඳවීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, බැංකුව තක්සේරු කිරීම සඳහා එක් දේපළක් පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. 2018 මැයි 18 දිනැති බාහිර තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවට අනුව සහ 2018 ජූනි 13 දිනැති සමාලෝචන මණ්ඩල තක්සේරුකරුගේ අදහස් වාර්තාවට අනුව, දේපලෙහි වෙළඳපල වටිනාකම රු.මිලියන 220 කි. කෙසේ වෙතත්, 2018 ජූනි 20 දින පැවති දේපළ මිලදී ගැනීමේ කමිටු රැස්වීමේදී ඉහත දේපළ සඳහා රජයේ තක්සේරුව කැඳවීමට තීරණය කර තිබුණි. 2018 නොවැම්බර් 28 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව, වෙළඳපල වටිනාකම රු.මිලියන 140 ක් ලෙස සඳහන් වූ අතර එය බාහිර | සටහන් කර ගන්නා ලදි. දේපළ මිලදී ගැනීම කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 109/2012 මත පදනම් වේ. දේපළ පරීක්ෂණ කමිටුව සහ දේපළ මිලදී ගැනීමේ කමිටුව චක්‍රලේඛයෙන් පත් කර ඇත. ඔවුන් දේපළ මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටිය පරීක්ෂාවට ලක් කරන අතර ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි.<br>2018.04.02 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව, පුවත්පත් දැන්වීම 2018.01.05 දින පළ කර ඇත.<br>ආර්.ඒ.ඩී.ජේ.රණසිංහ මහතා සහ එච්.කේ.වික්‍රමසිංහ මහත්මිය පිළිවෙලින් 2018.01.17 හා 2018.01.10 යන දිනවල අර්පණයන් ඉදිරිපත් කර ඇත. | බැංකුවේ ප්‍රසම්පාදන අත්පොත සමඟ දැඩිව අනුගතවීම අවශ්‍ය වේ. |

තක්සේරුකරුගේ තක්සේරුවට වඩා බොහෝ සෙයින් අඩු විය. නැවතත්, 2018 දෙසැම්බර් 01 දින බාහිර තක්සේරුකරුගෙන් තක්සේරුවක් කැඳවා තිබුණු අතර, ඔහු එකම ඉඩම සඳහා නැවත රු.මිලියන 211.32 ක තක්සේරුවක් ලබා දී තිබුණි. අවසානයේදී ඉහත සඳහන් ඉඩම රු.මිලියන 211.32 කට මිලට ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි.

### 3.5.11 බිංගිරිය ශාඛාව

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුව, බිංගිරිය ශාඛාව ඉදිකිරීම සඳහා 2017 ජූලි 14 දින රු.මිලියන 20 ක පිරිවැයකට ඉඩමක් මිලදීගෙන තිබුණු අතර උපදේශකයන් ලෙස ආක් ට්‍රියඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවඩ්) ලිමිටඩ් (Arch- Triad Consultants (Pvt) Ltd) තෝරාගෙන තිබුණි. වයඹ පළාතභාර සහකාර සාමාන්‍යාධිකාරී අමතමින්, සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන සේවා) විසින් යවන ලද ලිපියට අනුව, ඔවුන්ගේ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් මත පදනම්ව කොන්ත්‍රාත් ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවීමට දන්වා තිබුණි. එය ඉඩම මිලදී ගෙන හා උපදේශන ගාස්තුවෙන් සියයට 50 ක වටිනාකමක් එනම් රු.මිලියන 1.86 ක් ගෙවීමෙන් පසු තීරණය කර තිබුණු අතර, එම විශ්ලේෂණය ඉහත ක්‍රියාවලියට පෙර සිදු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | ඉදිකිරීම් ලේඛන අවධිය දැනටමත් සම්පූර්ණ කර ඇති අතර කොන්ත්‍රාක්කරුවන් තෝරා ගැනීම සඳහා ලංසු ලේඛන ආයතනික ප්‍රසම්පාදන කමිටුව අනුමත කර ඇත. උපදේශන ගිවිසුම අනුව, ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 50 ක් උපදේශන ගාස්තුව ලෙස ගෙවිය යුතුව ඇත. අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ පරිදි ප්‍රාග්ධන වියදම් කප්පාදු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය කල් දමන ලදි. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනය සිදු කිරීම හා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොත/ අදාල චක්‍රලේඛවලට දැඩිව අනුගතවීම අවශ්‍ය වේ. |
| (අ) 2012 ජූලි 4 දිනැති කාර්යාල චක්‍රලේඛ අංක 109/2012 හි 2.1 වගන්තිය ප්‍රකාරව, "බැංකුවට දේපලක් මිලදී ගැනීමට ගැනීමට අවශ්‍යතාවයක් පවතින විට අදාල කළමනාකරු/නිලධාරියා සහකාර සාමාන්‍යාධිකාරීවරයාට (පළාත්/ශාඛා) දැන්විය යුතුය". කෙසේ වෙතත්, බිංගිරිය ශාඛාව සඳහා ඉඩම මිලදී ගැනීම වෙනුවෙන් කළමනාකරු/බලයලත් නිලධාරියාගේ කිසිදු විමසීමක්/ඉල්ලීමක් ප්‍රසම්පාදන ගොනුවේ නිරීක්ෂණය නොවීය. | (ආ) අදාල ව්‍යාපාර ඒකකයෙන් නිර්දේශය ලැබීමෙන් පසු, බැංකුව දේපල මිලදී ගැනීම ආරම්භ කරන අතර ඉඩම මිලදී ගන්නා විට බැංකුව නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරයි. 2017.03.17 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව, අදාල සහකාර සාමාන්‍යාධිකාරීගෙන් ඉල්ලීම සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විකුණුම් හා අංශ කළමනාකරණ - Sales & Channel Management) ගෙන් පසුව නිර්දේශය ලැබී ඇත. අදාල සහකාර සාමාන්‍යාධිකාරී සහ බිංගිරිය ශාඛාවේ කළමනාකරු දේපළ පරීක්ෂාවට සහභාගී වී ඇත. | |
| (ආ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) 5.6.1 (a) වගන්තිය ප්‍රකාරව, "*ප්‍රසම්පාදනය කිරීමට නියමිත* | (ආ) ස්ථානය, ප්‍රමාණය, අවම මාර්ග ඉදිරිපස, අවශ්‍ය | |

| | |
|---|---|
| *භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතරයන් අදාල ප්‍රසම්පාදන අරමුණු ළඟා කර ගැනීමේ අවශ්‍යතාවයට වඩා පටු ලෙස නිර්වචනය නොකළ යුතුය*". කෙසේ වෙතත්, ඉහත වගන්තියට පටහැණිව, 2017 ජනවාරි 11 දින පළ කළ පුවත්පත් දැන්වීමෙහි ශාඛා අවශ්‍යතාවය ඉතා සංක්ෂිප්තව සඳහන් කර තිබූ බව නිරීක්ෂණය විය. | ලියකියවිලි, අර්පණය අවසාන වන දිනය පුවත්පත් දැන්වීමෙහි දමා ඇත. |
| (ඇ) ගොනුවේ ඇති ලේඛනවලට අනුව, 2017 ජනවාරි 19 වන දින බැංකුවට එක් මිල කැඳවීමක් ලැබී තිබුණු අතර ලංසු විවෘත කිරීමේ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට ලංසු විවෘත කිරීම් රැස්වීම් සහ රැස්වීම් වාර්තා පවත්වා ගැනීමක් නොමැතිවීම හේතුවෙන් ලංසු විවෘත කිරීමේ ක්‍රියාවලියේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | (ඇ) සටහන් කර ගන්නා ලදි. |
| (ඈ) තාවකාලිකව නතර කිරීමට ගත් තීරණයත් සමඟ ව්‍යාපෘතිය තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යාම තීරණය නොකරන්නේ නම් දරන ලද රු.මිලියන 28.78 ක පිරිවැය නිෂ්කාර්ය වේ. | (ඈ) සටහන් කර ගන්නා ලදි. |
| (ඉ) 2018 දෙසැම්බර් 4 දිනැති ආක් ට්‍රියඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවඩ්) ලිමිටඩ් හි ලිපිය ප්‍රකාරව, සමාගමේ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ඇති අතර, එය බැංකුවට දැනුම් දී නොතිබුණි. මෙම සංශෝධනය 2018 නොවැම්බර් 12 දින දෙපාර්ශවය විසින් අත්සන් කරන ලද උපදේශන ගිවිසුමට පසුව සිදුව තිබුණි. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුවට උපදේශන සමාගමේ සංශෝධිත කාර්ය මණ්ඩලය ඇගයීම සිදු කළ බවට කිසිදු ලේඛනගත සාක්ෂියක් නොතිබුණි. | (ඉ) CL.4.1 – (උපදේශන ගිවිසුම් කොන්ත්‍රාක්තුවේ පොදු කොන්දේසි) ප්‍රකාරව, ව්‍යාපෘතිය සඳහා එකඟ වූ ප්‍රධාන පුද්ගලයන් වෙනුවට වෙනත් පුද්ගලයකු පත්කිරීමට උපදේශකට හැකිය. මෙම ප්‍රධාන පුද්ගලයන්ට සමාන හෝ වඩා හොඳ සුදුසුකම් තිබිය යුතුය. ප්‍රධාන ඉංජිනේරුවරයාගේ මඟපෙන්වීම ඇතිව අදාල ව්‍යාපෘති ඉංජිනේරුවරයාට මෙය පහසුවෙන් ඇගයීමට ලක් කළ හැකිය. |

### 3.5.12 කිරිබත්ගොඩ අධිශ්‍රේණි ශාඛාව

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | (අ) බැංකුවේ ප්‍රසම්පාදන අත්පොත- 2014 හි 4.1.1.(c) වගන්තිය ප්‍රකාරව, ශාඛාවල සහ පළාත් කාර්යාලවල ප්‍රසම්පාදන අවශ්‍යතා සහතික කිරීම සඳහා පළාත් සහකාර සාමාන්‍යාධිකාරී විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත යැවිය යුතුය. සහතික කළ ලේඛනය ප්‍රසම්පාදනය භාරව සිටින සහකාර සාමාන්‍යාධිකාරී වෙත යැවිය යුතුය. තවද, බැංකුව සඳහා දේපළ මිලදී ගැනීම සම්බන්ධ කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 109/2012 හි 2.1 සහ 2.2 වගන්ති ප්‍රකාරව, මිලදී ගැනීමෙන් | සටහන් කර ගන්නා ලදි. බැංකුව විසින් දේපළ මිලදී ගැනීම කාර්යාල චක්‍රලේඛ අංක 109/2012 මත පදනම් වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විකුණුම් හා අංශ කළමනාකරණ - Sales & Channel Management) කිරිබත්ගොඩ ශාඛාව සඳහා ඉඩම්/ ගොඩනැගිල්ල මිලදී | බැංකුවේ ප්‍රසම්පාදන අත්පොත/ අදාල චක්‍රලේඛවලට දැඩිව අනුගතවීම අවශ්‍ය වේ. |

බැංකුවට දේපළක් අත්පත්කර ගැනීමට අවශ්‍යතාවයක් ඇති විට, අදාල කළමනාකරු/නිලධාරියා අදාල සහකාර සාමාන්‍යාධිකාරී (පළාත්/ශාඛා) ට දැනුම් දිය යුතු අතර දක්වා ඇති හේතු පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් බැංකුවට ඉඩම හෝ ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විකුණුම් හා අංශ කළමනාකරණ - Sales & Channel Management) ) වෙත නිර්දේශ කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත ක්‍රියාවලිය පිළිබඳ ලිපිලේඛන විගණනයට ඉදිරිපත් නොකළ අතර, කිරිබත්ගොඩ ශාඛාවේ ඉඩම මිලදී ගැනීම් ගොනුවේ අදාල ලිපි ගොනුගත කර නොමැත. එබැවින්, මූලික අනුමත කිරීමේ ක්‍රියාවලියට අනුකූල නොවූ බව තහවුරු විය. තවද, බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) හි 4.2.2 (a) වගන්තිය ප්‍රකාරව, ප්රසම්පාදන කාලසටහන යනු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවක පියවරයන් ආරම්භයේ සිට එහි අවසානය දක්වා ක්‍රමනුකූල පිළිවෙලකට විස්තර කරන සටහනකි.කෙසේ වෙතත්, ප්‍රසම්පාදන අත්පොතේ 1.2 වගන්තිය පරිදි, ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත් කර ගැනීම අධීක්ෂණය කිරීමට භාවිතා කළ හැකි ප්‍රසම්පාදන කාල සටහන්, හිමිකාරිත්වය ඇති ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කිරිබත්ගොඩින් ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් බැංකුව විසින් පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 109/2012 හි 2.3 වගන්තිය ප්‍රකාරව, සහකාර සාමාන්‍යාධිකාරී (පළාත්) හා සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන සේවා) විසින් එක්ව තීරණය කළ යුතු සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සහායක සේවා) විසින් අනුමත කළ යුතු අවශ්‍ය ඉඩමේ /ගොඩනැගිල්ල සහිත ඉඩමේ කොන්දේසි හා පිරිවිතරයන් 2017 දෙසැම්බර් 15 දින පුවත්පත් දැන්වීමෙහි සඳහන් කර නොතිබුණි.

ගැනීමට නිර්දේශ කර තිබුණි. බැංකුවට දේපළ මිලදී ගන්නා විට කාර්යාල චක්‍රලේඛ අංක 109/2012 හි ප්‍රසම්පාදන කාල සටහන් (PTS) නිර්වචනය කර නැත.

(ආ) බැංකුවේ ශාඛා සඳහා සැළසුම් මාර්ගෝපදේශයන්හි 1.1 වගන්තිය ප්‍රකාරව, අධිශ්‍රේණි ශාඛාවක් සඳහා අවම මාර්ග ඉදිරිපස අඩි 45-75 අතර තිබිය යුතු වුවද, පුවත්පත් දැන්වීමෙහි එය අඩි 35 ක මාර්ග ඉදිරිපසක් ලෙස සඳහන් කර තිබුණි. තනි මහල් ගොඩනැගිල්ලක් හා දෙමහල් ගොඩනැගිල්ලක් සඳහා අවම බිම් අවශ්‍යතාවය පිළිවෙලින් පර්චස් 63 ක් හා 51 ක් වුවද, ඊට පටහැණිව පුවත්පත් දැන්වීමෙහි එය පර්චස් 25-40 ලෙස සඳහන්විය. පාංශු පරීක්ෂණයක් කිරීම මඟින් උපද්‍රව රහිත කලාපයේ අවශ්‍යතාවය බැංකුව තහවුරු කරගෙන නොතිබුණි. බැංකුවේ

සටහන් කර ගන්නා ලදි. බැංකුව විසින් දේපළ මිලදී ගැනීම කාර්යාල චක්‍රලේඛ අංක 109/2012 මත පදනම් වේ. ස්ථානය, ප්‍රමාණය සහ අවම මාර්ග ඉදිරිපස පුවත්පත් දැන්වීමෙන් ලබා දී ඇත.

| | | |
|---|---|---|
| | ප්‍රසම්පාදන අත්පොතේ (2014) 2.4.1 සහ 2.7.8 වගන්ති ප්‍රකාරව, බැංකුව ආයතනික ප්‍රසම්පාදන කමිටුවක් (CPC) පත් කර නොතිබුණි. | |
| | (ඈ) බැංකුවේ තොරතුරුවලට අනුව, 2017 දෙසැම්බර් 19 දින ලියාපදිංචි තැපෑලෙන් අදාල ලියකියවිලි සහිතව එක් අර්පණයක් පමණක් ලැබී තිබුණු අතර ලංසු විවෘත කිරීමේ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට ලංසු විවෘත කිරීම් රැස්වීම් සහ රැස්වීම් වාර්තා පවත්වා ගැනීමක් නොමැතිවීම හේතුවෙන් ලංසු විවෘත කිරීමේ ක්‍රියාවලියේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. තෝරා ගැනීමේ කමිටුව පරීක්ෂණ වාර්තාව මනාව පරීක්ෂා කර ඉහත කී ඉඩම කිරිබත්ගොඩ ශාඛාව සඳහා සුදුසු බව තීරණය කර තිබුණි. එක් අර්පණයක් පමණක් ලැබී තිබූ හෙයින් කිසිම තරඟකාරිත්වයකින් තොරව අර්පණය තෝරා ගෙන තිබුණි. | සටහන් කර ගන්නා ලදි. |
| ii | <u>කිරිබත්ගොඩ ශාඛාව ස්ථාපිත කිරීමට නව ශාඛා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා උපදේශකවරයකු තෝරා ගැනීම</u> | |
| | (අ) උපදේශකයන් තොරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන ජාතික මාර්ගෝපදේශවල 2.4.2 හා 2.4.3 වගන්ති පරිදි, උපදේශන සේවා සඳහා උපදේශකයකු තෝරා ගැනීම, ක්‍රියාපටිපාටි අනුගමනය කරන ස්වාධීන ප්‍රසම්පාදනයකින් සහ සුදුසු උපදේශක ප්‍රසම්පාදන කමිටු හරහා කළ යුතුය. තාක්ෂණික ඇගයීම් කමුටුවේ සහ ප්‍රසම්පාදන කමිටුව යන දෙකේම නිර්දේශයන් සමඟ උපදේශකයකු තෝරා ගැනීම සඳහා යෝජනා සඳහා ඉල්ලීම් (RFP) ලේඛන ප්‍රකාරව ගුණත්වය සහ පිරිවැය පදනම් තේරීම් ක්‍රමය (QCBS) භාවිතා කළ බව බැංකුව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, කිරිබත්ගොඩ ශාඛාව ඉදිකිරීම වෙනුවෙන් උපදේශකයකු තෝරා ගැනීමට බැංකුව නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි. පිරිවැය පදනම් තේරීම් ක්‍රමය සුදුසුවීම සහ උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන ශ්‍රී ලංකා මාර්ගෝපදේශ 3.8.1 හා 3.8.2 වල තෝරා ගැනීමේ ක්‍රියාවලිය පැහැදිලිව සඳහන් කර තිබුණ ද, බැංකුව උපදෙස් අනුගමනය කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. |
| | (ආ) උපදේශන සේවාවේ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා වන විස්තරවලට අනුව, බැංකුව උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා මාර්ගෝපදේශවල 3.4 වගන්තිය අනුගමනය නොකර කොන්ත්‍රාත් මුදලින් ඇස්තමේන්තුගත ප්‍රතිශතයක් උපදේශන පිරිවැය ලෙස තීරණය කරන අතර එය ප්‍රමාදයන් හා මූල් | කිරිබත්ගොඩ ශාඛාව ඉදිකිරීමේ විෂය පථය 2020.02.20 දින නැවත සලකාබලා තිබුණු අතර බස්නාහිර පළාත උතුර පළාත් කාර්යාලය සහ ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය කිරිබත්ගොඩ |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තුවෙන් විෂය පථය වෙනස්වීම් හේතුවෙන් ව්‍යාපෘති පිරිවැය වැඩිවන විට අහිතකර ලෙස බලපානු ලබයි. ඒ අනුව, සෝලා පැනල් පද්ධතිය සහ විවිධ විෂයපථයේ වෙනස්කම් හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 450 කින් ඉහළ ගොස් තිබුණි. කෙසේ වෙතත්, 2019 පෙබරවාරි 28 දින ඉඩම මිලදී ගෙන තිබුණ ද, කොන්ත්‍රාත් වැඩ සඳහා කොන්ත්‍රාත්කරු තවමත් තෝරා ගෙන නොතිබුණි. | පරිශ්‍රයේ ඉදිකිරීමට තීරණය කර තිබුණි.<br>ඒ අනුව, බැංකුවේ කිරිබත්ගොඩ ශාඛාව වෙනුවෙන්, රු.මිලියන 312 ක් (බදු රහිතව) භාවිතා කරමින් දළ වශයෙන් වර්ග අඩි 29,117 ක බිම් ප්‍රමාණයකින් සමන්විත ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය සහ බස්නාහිර පළාත් කාර්යාලය ද ඇතුළත් ශාඛා ගොඩනැගිල්ල ඉදිකිරීමට 2021.02.03 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි.<br>එම කාල පරිච්ඡේදය තුළ පැවති වසංගත/ආර්ථික තත්වය, සංචරණ සීමා, නිරෝධායන ඇඳිරි නීතිය, ඉන්ධන හිඟය, රට වසා දැමීම් සහ අඛණ්ඩ විදුලිය විසන්දිවීම් හේතුවෙන් බැංකුවේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙමින් ව්‍යාපෘතිය කල් දැමීමට තීරණය කරන ලදි. | |

### 3.5.13 ගණේමුල්ල ශාඛාව සඳහා ඉඩම මිලදී ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුව, 2019 ජුනි 15 දින ගණේමුල්ල ශාඛාව ඉදිකිරීම සඳහා රු.මිලියන 69.54 ක මිලකට ඉඩමක් මිලදී ගෙන තිබුණි. බැංකුවේ ප්‍රසම්පාදන අත්පොත-2014 හි 4.2.2 (a) වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන අත්පොතේ 1.2 වගන්තිය පරිදි, ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කර ගැනීම අධීක්ෂණය කිරීමට ප්‍රසම්පාදන කාලසටහන් බැංකුව පිළියෙල කර නොතිබුණි. සහකාර සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත) විසින් සහකාර සාමාන්‍යාධිකාරී (පළාත් විකුණුම් හා අංශ කළමනාකරණ (Sales & Channel Management) අමතන 2018 නොවැම්බර් 16 දිනැති ලිපියට අනුව, ශාඛාව නැවත ස්ථානගත කිරීමේ බැංකුවේ අවශ්‍යතාවයක් ලෙස, වසර 4 කට පමණ පෙර ඉඩම මිලදී ගෙන තිබුණ ද, බැංකුව ඉදිකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි. | එම කාලය තුළ පැවති වසංගත/ආර්ථික තත්වය හේතුවෙන් බැංකුවේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙමින් ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක් කල් දැමීමට බැංකුව තීරණය කරන ලදි. | බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතට දැඩිව අනුගතවීම අවශ්‍ය වේ. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | ආයතනික මට්ටමේ පුරප්පාඩු තනතුරුවලින් තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානියා වන ප්‍රධාන තොරතුරු නිලධාරියා 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණු අතර එය බැංකුවේ කාර්යයසාධනය තීරණය කිරීමේ ප්‍රධාන තනතුරක් බැවින් බැංකුවට එම තනතුර පුරප්පාඩුව තැබිය නොහැකි බව නිරීක්ෂණය විය. | 2022.12.31 වන විට ප්‍රධාන තොරතුරු නිලධාරී අයත්වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර පමණක් පුරප්පාඩුව පැවති අතර ප්‍රධාන තොරතුරු නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම් හා සම්මුඛ පරීක්ෂණ මාලාවකින් පසුව කේ.බී.එන්.සීලනාත මහතා ප්‍රධාන තොරතුරු නිලධාරී ලෙස 2013.09.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජකාරී ආරම්භ කර ඇත. | බැංකුවේ කාර්යය සාධනය තීරණය කිරීමේ ප්‍රධාන තනතුරු පුරප්පාඩු වූ වහාම පිරවීම අවශ්‍ය වේ. එබැවින් බැංකුව සතුව එවැනි අවස්ථා සඳහා සංශෝධිත අනුප්‍රාප්තික සැළැස්මක් තිබිය යුතුය. |
| ii | බඳවා ගැනීම් පටිපාටියට (SOR) පටහැණිව 2021 ඔක්තෝබර් 26 දින මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය මත පදනම්ව, 2021 හා 2022 වර්ෂවල බැංකු ධාරාවේ සේවකයන් 4 දෙනෙකු ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ (NOC) බැංකු නොවන ධාරාවට මාරු කර තිබුණි. මාස 3 ක් සඳහා තාවකාලික පදනමින් NOC වෙත මාරු කළ සේවකයන් 2023 අගොස්තු 8 වන විගණන දිනය වන විටත්, තොරතුරු තාක්ෂණ අංශයේ සේවය කරමින් සිටින අතර ඔවුන්ගේ පැවරුම් කාලය, මාස 15 ක් සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) ගේ ඉල්ලීම මත පිළිවෙලින් මාස 6, මාස 6 හා මාස 3 බැගින් තුන් වතාවක් දීර්ග කර තිබුණි.<br>තවද, බැංකුවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය (ISP) අනුව, ඉහල අවදානමක් ඇති ජාල පරිපාලන පරිශීලක ඉහල අධිකාරියක් මඟින් සේවකයන්ට ලබා දිය යුතු වේ. කෙසේ වෙතත්, ඉහත සඳහන් තාවකාලිකව මාරු කරන ලද සේවකයින්ට ජාල පරිපාලන පරිශීලක ප්‍රවේශය ලබාදී ඇති බව නිරීක්ෂණය විය. | (අ) තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යය මණ්ඩල හිඟය සඳහා පද්ධති විශ්ලේෂක 1 බඳවා ගැනීමට බැංකුව තීරණය කරන ලදි. කෙසේ වෙතත්, 2020, 2021 හා 2022 වර්ෂවල රට තුළ පැවති කෝවිඩ් 19 බලපෑම හා රටේ තත්වය හේතුවෙන් බඳවා ගැනීම් ප්‍රමාද වූ අතර අවසානයේ අපට තෝරා ගැනීමට හැකි වූයේ පද්ධති විශ්ලේෂක 1 ශ්‍රේණියෙන් 7 දෙනෙකු පමණි. පසුව, කාර්යය මණ්ඩලයේ හිඟය පිරවීම පිණිස 2022 දී තවත් බඳවා ගැනීමක් සිදු කළ අතර බැංකු ධාරාවෙන් අභ්‍යන්තර අයදුම්පත් කැඳවන ලදි.<br>සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) විසින් ලිපි මඟින් ඉල්ලා සිටි පරිදි ඔවුන්ගේ තාවකාලික පැවරුම් කාලය මානව සම්පත් අංශය දීර්ග කරන ලදි.<br>පරිශීලක ප්‍රවේශය තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන අතර ඉහත කාර්යය මණ්ඩල සාමාජිකයන් තාවකාලික පදනමින් මාරු කළ | 1. SOR හා මාරුකිරීමේ ප්‍රතිපත්තිය සමඟ දැඩිව අනුගතවීම අවශ්‍ය වේ.<br>2. තාවකාලික පදනමට වඩා බැංකුවේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියාකිරීමේ වගකීම දැරීමට ස්ථිර කාර්යය මණ්ඩලය පත් කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | | ද, NOC හි කාර්යය කර ඇත. NOC හි කාර්යය මණ්ඩලයට හැකි තරම් ඉක්මනින් ඇඟවීම් (alerts) වලට ප්‍රතිචාර දැක්වීමේ වගකීම ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාල උපාංගවලට ප්‍රවේශවීමට හා යාවත්කාලීන කිරීමට අවශ්‍ය අධිකාරිය නොමැතිව SOC විසින් ජනනය කරන ලද ඇඟවීම්වලට ප්‍රතිචාර දැක්වීමට NOC කාර්යය මණ්ඩලයට නොහැකි විය. | |
| iii | 2022 දී බැංකුව එක් සේවකයකු වෙනුවෙන් රු.මිලියන 3.53 ක පිරිවැයක් දරා තිබුණු බවත්, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 0.53 ක හෙවත් සියයට 17.67 ක වැඩිවීමක් පෙන්වන බවත් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂ 4 හා සසඳන විට කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව ක්‍රමිකව අඩු වුවද, එක් සේවකයකු සඳහා වූ පිරිවැය වසරින් වසර ක්‍රමිකව වැඩි වී ඇත.<br>2022 වර්ෂය සඳහා එක් සේවකයකුට ජනනය කළ ලාභය රු.මිලියන 3.89 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 0.62 ක හෙවත් සියයට 13.75 ක අඩුවීමක් පිළිබිඹු කරයි.<br>බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස පුද්ගල වියදම් 2022 වර්ෂය සඳහා සියයට 32.36 ක් ලෙස වාර්තා කර ඇති අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 5.75 කින් ඉහළ ගොස් තිබුණි. | i. 2022 දෙසැම්බර් මාසයේ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) විසින් ප්‍රකාශයට පත් කළ චලනයන් අනුව, වාර්ෂික උද්ධමනය සියයට 57.2 ක් වේ. සේවක වැටුපෙහි ජීවන වියදම් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ චලනයන් අනුව ගලපන අතර ඒ අනුව, සේවක පිරිවැය ඉහළ ගොස් ඇත.<br>ii. 2018 අගෝස්තු මස බඳවාගත් අභ්‍යාසලාභී මාණ්ඩලික සහායකයන් 2021 අගෝස්තුවලින් පසු ස්ථිර කරන ලදි. ඒ අනුව, බැංකුවට 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී අමතර කාර්යය මණ්ඩල පිරිවැයක් ( ස්ථිර කිරීම සමඟ වැටුප ගැලපීම, ව්‍යවස්ථාපිත දායකයන්, නිවාඩු මුදල් කිරීම, වෙනත් පුද්ගලික වියදම් ආදි..) දැරීමට සිදු විය. | සේවකයන්ගේ කාර්යක්ෂමතාවය සහ සඵලදායිතාවය ඉහළ නැංවීමට බැංකු අරමුදල් භාවිතා කිරීම අවශ්‍ය වේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැළැස්ම**

**විගණන නිරීක්ෂණය**

2022-2024 සඳහා පිළියෙල කළ සංයුක්ත සැළැස්ම ප්‍රකාරව, බැංකුවේ තෝරාගත් ඉලක්ක කටයුතු ළඟාකර ගැනීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| අරමුණ | 2022.12.31 දිනට තත්වය | නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| <u>ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය</u> | | | | |
| අයවැයගත අරමුදල්වල පිරිවැයට (COF) අනුකූලව අරමුදල්වල පිරිවැය පවත්වාගෙන යාම 2022 – | අරමුදල්වල පිරිවැය සියයට 18.33කි. | අරමුදල්වල පිරිවැය ඉහළ ගොස් ඇත. | ණය ගැණුම් පිරිවැය අඩුවීම හා අඩු පොලී අනුපාත යටතේ තැන්පතු නැවත | අයවැයගත අරමුදල්වල පිරිවැය ළඟාකර |

<table>
<tr>
<td>සියයට 6.64 කි.</td>
<td></td>
<td></td>
<td>මිලකරණය තුළින් බැංකුවේ අරමුදල්වල පිරිවැය අයවැයගත සියයට 17.47 සිට 2023 සැප්තැම්බර් මාසයේදී සියයට 15.48 දක්වා අඩුවී ඇත.</td>
<td>ගැනීමට හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ.</td>
</tr>
<tr>
<td>පාරිභෝගික කේන්ද්‍රීයත්වය<br>බැංකුවේ ඉහළ ශුද්ධ වටිනාකම (High Net Worth- HNW) සහ A ශ්‍රේණියේ පාරිභෝගික පදනමේ සියයට 10 ක වර්ධනයක් ලබා ගැනීම (පදනම් වර්ෂය 2021.12.31)</td>
<td>
<table>
<tr><th></th><th>වර්ධනය %</th></tr>
<tr><td>A ශ්‍රේණියේ පාරිභෝගිකයන් සංඛ්‍යාව</td><td>(7)</td></tr>
<tr><td>ප්‍රමුඛ පාරිභෝගිකයන් සංඛ්‍යාව</td><td>(13)</td></tr>
<tr><td>A ශ්‍රේණියේ පාරිභෝගිකයන් ගේ මුළු තැන්පතු වටිනාකම (රු.මිලියන)</td><td>(14)</td></tr>
<tr><td>ප්‍රමුඛ පාරිභෝගිකයන් ගේ මුළු තැන්පතු වටිනාකම (රු.මිලියන)</td><td>(8)</td></tr>
</table>
</td>
<td>2022 වර්ෂය පුරා සෘණ වර්ධන අනුපාතයක් තිබුණි. .</td>
<td>2023.06.30 දිනට බැංකුව සමඟ වසර 10 කට වඩා සිටින ගනුදෙනුකරුවන් සංඛ්‍යාව සියයට 3.39 කින් වැඩිවිය.<br><br>2021 සහ 2022 වර්ෂවල රටේ පැවති COVID -19 වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ඉහළ ශුද්ධ අගයක් ඇති (HNW) ගනුදෙනුකරුවන්ගේ මුළු තැන්පතු වටිනාකමට ද බලපෑම් ඇති කරන ලදි. 2022 වර්ෂයේ ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස, පොලී අනුපාතවල ඉහළ යන ප්‍රවණතාවයක් පැවති අතර, එය ව්‍යාපාරවලට දරා ගැනීමට නොහැකිය. එබැවින්, අපේක්ෂිත වර්ධනය ළඟා කර ගෙන නැත.</td>
<td>අයවැයගත වර්ධනය ළඟාකර ගැනීමට හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.<br>.</td>
</tr>
<tr>
<td>අවම වශයෙන් ණයවලින් සියයට 75 ක් නිශ්චිත හැරවුම් කාලය (Turn over Time -TAT) තුළ පවත්වා ගනු ලැබේ.<br>පුද්ගලික ණය– වැඩකරන දින 02<br>කල්බදු– වැඩකරන දින 01<br>නිවාස ණය – වැඩකරන දින 14</td>
<td>සත්‍ය ළඟාකර ගැනීම් යාවත්කාලීන කර නොමැත.</td>
<td>සත්‍ය ළඟාකර ගැනීම් යාවත්කාලීන කර නොමැත.</td>
<td>පුද්ගලික ණය<br>ණයවලින් සියයට 70 කට ආසන්න ප්‍රමාණයක් වැඩකරන දින 2 ක් තුළ ලබා දී ඇත.<br>කල්බදු<br>කල්බදුවලින් සියයට 77 කට ආසන්න ප්‍රමාණයක් වැඩකරන</td>
<td>අයවැයගත කාර්යක්ෂම තා අනුපාතය ළඟාකර ගැනීමට හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.<br>.</td>
</tr>
</table>

වානිජ ණය – වැඩකරන දින 25

දිනක් තුළ ලබා දී ඇත. නිශ්චිත හැරවුම් කාලය වර්ධනය කර ගන්නා ලෙස ශාඛාවලට උපදෙස් දී ඇත.

**නිවාස ණය හා වානිජ ණය**

2022 වර්ෂය දක්වා නිශ්චිත හැරවුම් කාලය පිළිබඳ වාර්තා නොමැත. 2023 සිට ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන විසින් ලබා දෙන නිවාස ණය සහ වානිජ ණය සඳහා මධ්‍යම ණය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, නිශ්චිත හැරවුම් කාලය අතින් (Manually) ගණනය කරයි. එම වාර්තාවලට අනුව, (2023 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා) නිවාස ණයවලින් සියයට 28 ක් සහ වානිජ ණයවලින් සියයට 61.8 ක් නිශ්චිත හැරවුම් කාලය ඇතුළත පවත්වා ගෙන යනු ලැබේ. නිශ්චිත හැරවුම් කාලයේ කාර්යසාධනය අඩුම සියයට 75 දක්වා ඉහළ දැමීම සඳහා, මධ්‍යම ණය මෙහෙයුම් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන කළමනාකරුවන් හා කාර්යය මණ්ඩලය සමඟ විශේෂ සාකාච්ඡා අඛණ්ඩව කරමින් සිටියි.

**ප්‍රතිලාභ දෙන ණය සංස්කෘතිය හා ශක්තිමත් ණය කළඹ**

| | | | | |
|---|---|---|---|---|
| ණය කළඹ වර්ධනය කිරීම 2022.12.31 ට ණය වර්ධනය -සියයට 14 | ණය වර්ධනය සියයට 0.1 | ඉලක්කගත ණය වර්ධනය ළඟකර ගෙන නොමැත. | ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ගැටලු හේතුවෙන් වර්ෂය තුළදී අත්තිකාරම් අඩු කරන ලෙස ශාඛාවලට උපදෙස් දීම, 2022 වර්ෂය තුළ ණය වර්ධනය කෙරෙහි බලපාන ලදි.<br>අහිතකර ආර්ථික තත්වයන් හේතුවෙන්, බැංකුවට වර්ෂය තුළදී අයවැය ගත ණය වර්ධනය ළඟාකර ගැනීමට නොහැකි විය. | ඉලක්කගත ණය වර්ධනය ළඟාකර ගැනීමට හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| 2023 වන විට කුඩා හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ වෙළඳපල ප්‍රධානියා වීම (කුඩා හා මධ්‍ය පරිමාණ - SME- ණය කළඹ වාර්ෂිකව සියයට 20 කින් වර්ධනය කිරීම) | කුඩා හා මධ්‍ය පරිමාණ ණය වර්ධනය- (19.6) | ඍණ වර්ධනය | වෙළඳපලේ පැවති ඉහළ පොලී අනුපාත හේතුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ණය සඳහා ඉල්ලුම අඩු විය. තවද, රටෙහි පවතින ආර්ථික තත්වය ව්‍යාපාර සඳහා හිතකර නොවේ.<br>2022 වර්ෂයේ ආර්ථික අර්බුදයෙන් වැඩිම බලපෑ අංශය කුඩා හා මධ්‍ය පරිමාණ අංශය වේ.<br>ඉන්ධන හිඟය, විදුලිය හිඟය, ආනයන සීමා සහ ඉහළ උද්ධමනය කුඩා හා මධ්‍ය පරිමාණ අංශයට සෘජුවම බලපාන ලදි. | අයවැයගත වර්ධනය ළඟාකර ගැනීමට හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| ණය ලබාදීම සම්බන්ධ ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීම හා අධීක්ෂණය<br><br>- නව ණය කිසිවක් මාස 6 ක කාලයක් ඇතුළත අක්‍රීය කාණ්ඩයට මාරු කරන්නේ නැත. | අක්‍රීය අත්තිකාරම්වලට මාරුකළ නව පහසුකම් (2022 දී ලබා දුන්) - ආයතනික අංශය රු.බිලියන 1.17 | 2022 වර්ෂය තුළදී ඉලක්කය ළඟාකර ගෙන නොමැත. | ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ගැටලු හේතුවෙන් වර්ෂය තුළදී ණය වර්ධනය අඩු කරන ලෙස ශාඛා ජාලයට උපදෙස් දීම නිසා වර්ෂය තුළ | අයවැයගත අරමුණු ළඟාකර ගැනීමට හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉලක්කගත සමස්ත ණය වර්ධනය බැංකුව ළඟාකර ගෙන නැත.<br>NPCF ලෙස සලකනු ලබන පහසුකම් පිළිබඳව පළමු මාස 6 තුළ මාසික පදනමින් ඇගයීමට හා වාර්තා කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට ආයතනික කළමනාකරණ කමිටුවේ අනුමැතිය 2022.05.25 දින ලබා ගන්නා ලදි. | |
| පවතින ණය ඇගයීම් හා අධීක්ෂණ ක්‍රියාවලිය නව සංකල්ප හා යාන්ත්‍රණයන් සමඟින් සවිමත් කිරීම- රු.බිලියන 5 ට වැඩි ණය සඳහා ස්වාධීන තක්සේරුවක් කිරීම. | ස්වාධීන තක්සේරු යාන්ත්‍රණයක් හඳුන්වා දී නොතිබුණි. | නිසි යාන්ත්‍රණයක් නොමැති වීමෙන්, බැංකුවට ණය ඇගයීම සහ අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට නොහැකි විය. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි.<br>ණය අනුමත කිරීම, සුරැකුම් ලිපිලේඛනවල නිවැරදිතාවය, නීති නිලධාරී තහවුරුව, පොලී අනුපාතවල හා ආපසු ගෙවීම් කාලයේ නිවැරදිතාවය, පවතින පහසුකම් පවත්වාගෙන යාම, බැංකුවේ ගිණුම් හරහා වන මුදල් ප්‍රවාහයන්වල ප්‍රමාණාත්මක බව, විශේෂ කොන්දේසි/ අදහස් ආදිය සමාලෝචනය කිරීමට ණය සමාලෝචන යාන්ත්‍රණයක් පවතී. | රු.බිලියන 5 ට වැඩි ණය සඳහා නව යාන්ත්‍රණය ළඟා කර ගැනීමට අදාල හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.<br>. |
| 2021.12.31 දිනට පවතින අක්‍රීය අත්තිකාරම් ප්‍රතිශතය සියයට 1 කින් පහත හෙළීම<br>2021.12.31 දිනට පවතින අදියර 3 ණයවල නිරපේක්ෂ වටිනාකම සියයට 25 කින් අඩුකිරීම | අක්‍රීය අත්තිකාරම් අනුපාතය<br>2021.12.31- සියයට 5.10<br>2022.12.31 – සියයට 5.31<br>අදියර III –<br>2021.12.31–<br>රු.බිලියන.251<br>2022.12.31 -<br>රු.බිලියන.325 | අක්‍රීය අත්තිකාරම් ඉහල ගොස් තිබුණි.<br>අදියර III ණය ගොස් තිබුණි. | අයකරගැනීම් ආයතනික අංශය තත්වය මර්දනයට පියවර ගෙන ඇත. | අයවැයගත සංඛ්‍යා ළඟාකර ගැනීමට හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| එකතු කිරීම් කාර්යක්ෂමතා අනුපාතය සියයට 90 ක පවත්වා ගැනීම. | එකතු කිරීම් කාර්යක්ෂමතාවය සියයට 70.89 කි. | ඉලක්කගත අනුපාත ළඟාකර ගෙන නැත. | | |

## 4.2 අයවැයලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය තුළ අයවැය හා සත්‍ය තොරතුරු අතර විචලන විශ්ලේෂණය අනුව, ශුද්ධ ලාභයේ සියයට 13.64 ක සෘණාත්මක ප්‍රවණතාවයක් වාර්තා කළ අතර මුළු ආදායමේ සියයට 55.39 ක ධනාත්මක ප්‍රවණතාවයක් වාර්තා විය. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදි. | මූල්‍ය ලාභදායීතාවය සමීපව අධීක්ෂණය කිරීම හා සැලකිය යුතු වෙනස්කම් උපායමාර්ගිකව කළමනාකරණය අවශ්‍ය වේ. |